# පටුන


**01.** විදුලි සකපෝරුවෙන් ජීවය ලද දිරිය කතුන් - *අනුෂ ඇපා සෙනෙවිරත්න* 01-04

**02.** "බෝපාගම මුර්සි අන්නාසි" - *අෂාන් ප්‍රනාන්දු* 05-11

***03.*** අපද්‍රව්‍ය කළමනාකරණය කරමින් ව්‍යාපාර ආරම්භ කරන්න. - *මංගලිකා වනසුන්දර* 12-14

**04.** කොවිඩ් 19 පශ්චාත් සමයට මුහුණදීම සඳහා ආදායම් සහ වියදම් කළමනාකරණය. - *කේ.එම්.ජී සමරසේන* 15-18

**05.** කුටුම්භයේ ආහාර සුරක්ෂිතතාව සඳහා ගෙදර වත්ත වගාකරමු. - *සී. කේ. ඩබ්ලිව්.අල්විස්* 19-21

**06.** වසංගතයට සැලෙන ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායන්. - *ඒ. එම්. එස්. අතපත්තු* 22-26

**07.** සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරිකයන් ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය. - *ඩබ්ලිව්. එච්. සිරිසේන* 27-30

**08.** "ගම සමඟ පිළිසඳර - වැඩ සමඟ යළි ගමට" වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය ප්‍රායෝගික දැනුම. - *පී.ඒ. චිත්‍රා ජයසිංහ* 31-35

**09.** වස විෂෙන් තොර කටට රහට කෑම "ගලහ සමෘද්ධි බොජුන් හල" - *ප්‍රදීප් ලංකාපෙල* 36-39

**10.** ජාතික ආපදාවකදී ප්‍රජාමූල සංවිධානයක ඇති වැදගත්කම. - *එස්.එම්. යූ.බී. සමරකෝන්* 40-42

**11.** සමාජ වෙනසියාවේ කාරකය මිනිසා සවිබල ගැන්වීමයි.- *ආර්.එම්.කේ.බණ්ඩාර* 43-45

**12.** සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය හා විපර්යකාරක කාර්යයභාරය. - *ජී.ජී.එස්. බණ්ඩාර* 46-49

**13.** වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිකරණය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් මතුවී තිබෙන්නේ ඇයි? - *සුභානි පියසිංහ* 50-53

14. වර්තමාන පසුබිම තුළ වෘත්තීය සමාජ වැඩකරුගේ සමාජ ආර්ථික. කාර්යභාරය හඳුනා ගනිමු. - *ඩී.ඒ. ප්‍රේමානි දාස්වත්ත* 54-55

15. ග්‍රාමීය සංවර්ධනයේදී මූල්‍ය සාක්ෂරතාවයේ ඇති වැදගත්කම. (සමෘද්ධි නිෂ්පාදන ගම්මාන හා සෞභාග්‍ය පොකුරු ගම්මාන ඇසුරෙන්) - *ඩබ්. අනුෂා ප්‍රියන්ජනී* 56-59

16. සහභාගිත්ව සංවර්ධනයේ මෑත කාලීන උපාය මාර්ග හා සංකල්ප. - *ඩබ්. ඩී. එන්. වීරසූරිය* 60-63

17. ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ වැඩිහිටි ඉගෙනුම් ක්‍රියාවලිය ලෙස ක්‍රියාත්මක සහභාගිත්ව පුහුණුව හා එහි මූලධර්ම. - *එස්.ඩී.අල්ගම* 64-72

**18.** වැනිලා වගාව පිළිබඳව දැනුවත් වීමෙන් ආදායම සරුකර ගනිමු 73 -75
*-ඩබ්.ඒ.ඩී මංගලා චිත්‍රානි*

19. ක්ෂුද්‍ර මූල්‍ය උපාය මාර්ගය : ආරම්භය හා වර්ධනය පිළිබඳව සංක්ෂිප්ත හැඳින්වීමක් 76 - 81
*-ඊ.එම්.ඩබ්.ඩබ්.එන්.එස්.බී. ඒකනායක*

20. සංවර්ධනයේදී නැතුවම බැරි ජල සම්පත- *නිරෝෂා විජේවර්ධන* 82 - 84

21. ජීව ඉන්ධන භාවිතයේ නව පෙරමුණු-*ආනන්ද ප්‍රේමසිරි* 85 - 87

# විදුලි සකපෝරුවෙන් ජීවය ලද දරිය කතුන්

අනූෂ ඇපා සෙනෙවිරත්න

කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශයට අයත් මදුරාවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති යාල ගම්මානය පාරම්පරික මැටි කර්මාන්තය සම්බන්ධයෙන් ඈත අතීතයකට උරුමකම් කියනු ලබන ගම්මානයක් ලෙස ප්‍රචලිතය. පාරම්පරික මැටි භාණ්ඩ බොහොමයක් ඔවුන් විසින් ගම තුළ නිෂ්පාදනය කරමින් සිය ජීවනෝපාය සරු කර ගත්හ. සිය නිෂ්පාදන මිළදී ගැනීමට වෙළඳුන් ගමට පැමිණි අතර තම නිෂ්පාදන අලෙවිය පිළිබඳ ගැටළුවක් මේනිසා ඔවුනට ඇති නොවුනි. නමුත් එම වෙළඳුන්ගේ ඉල්ලුමට සරිලන පරිදි ප්‍රමාණවත් වන මැටි භාණ්ඩ නිෂ්පාදනය කරගැනීමේ ගැටළුවකට ඔවුන් මුහුණු දී සිටි අතර ඒ වන විට විවිධ විකල්ප තාක්ෂණික ක්‍රමද ඔවුන් විසින් ඒ සඳහා අත්හදා බලන්නට විය. ඒවාද එතරම් සාර්ථක නොවූ අතර තම ශ්‍රමය හා කාලය විශාල ලෙස වැය වුවත් නිෂ්පාදන භාණ්ඩ ප්‍රමාණය අඩු වීම ඔවුන්ගේ කනස්සල්ලට හේතු විය. මේ නිසා බොහෝ දෙනෙක් මෙම කර්මාන්තය අතහැර දැමීමට සූදානම් වෙමින් සිටි අතර ඇතැම් අය වෙනත් කළ හැකි දෙයක් නොවූ නිසා ව්‍යාපාරයක් ලෙස නොව සාමාන්‍ය එදිනෙදා කටයුත්තක් ලෙසත් අමතර ආදායම් මාර්ගයක් ලෙසත් මෙම කාර්යයේ නිරත වන්නට විය.

මෙසේ කාලය ගත වෙද්දී සමෘද්ධි වැඩසටහන තුළින් මෙම ගම්මානය 2017 වසරේදී නිෂ්පාදන ගම්මානයක් ලෙස හඳුනාගෙන සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහනට එක් කර ගන්නට විය . එය ඔවුන්ගේ ජන ජීවිතයට අරුණැල්ලක් උදා වූවා වැනිය. නිෂ්පාදන කාර්යයේ නිරත වූවන්ගේ අවශ්‍යතා වලට සරිලන පරිදි සකස් වූ වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාවට නැංවූ අතර එමඟින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් මඟින් නිෂ්පාදන කාර්යයෙහි නිරත වූවන්ට සෘජුවමද,ග්‍රා මීය ප්‍රජාවට විවිධ ආකාරයේ ප්‍රතිලාභ රැසකුත් අත්කර දීමට මෙම වැඩසටහනට හැකි විය. නිෂ්පාදනය වර්ධනය කිරීම තුළින් ආදායම් මට්ටම ඉහළ නැංවීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය විය. තවද නිශ්චිතව සවිබලගැන්විය හැකි සමෘද්ධි පවුල් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අතර ගම්මානයේ සියලු පවුල් අදාල නිෂ්පාදන කටයුතු සඳහා දායක කර ගැනීමද අරමුණු අතර විය.



විදුලි සකපොර්රුවෙන් ඉදිවන මැටි පහන් ......
මග්ගොනගේ රොසලින් මිය.

ඒ අතරින් මැටි ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ගම්මානයේ පවුල් 11 ක් සඳහා ලබා දී තිබූ විදුලි සකපෝරුව ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලියට නව ජීවයක් ගෙන දීමට සමත් වී තිබුණි. එහි ප්‍රතිලාභ භුක්ති විඳින කාන්තාවන් කිහිප දෙනෙකු එමඟින් ඔවුන්ගේ ජනජීවිතයට සිදුකළ බලපෑම කෙබඳුද යන්න මෙසේ විස්තර කරන්නට විය. ඇය නමින් මග්ගොනගේ රොසලින් මහත්මියයි. වයස අවුරුදු 70 කි. කේ ටියුඩර් නැමැති අසනීප තත්ත්වයේ පසුවන අවුරුදු 71 වන තම ස්වාමිපුරුෂයා සමඟ තම බෑණාගේ නිවසේ දිවිගෙවන ඇය සිත්තරෙකුට හසු වූ පන්හිඳ එහාමෙහා කොට අලංකාර රූ රටා මවන්නාක් මෙන් විදුලි සකපෝරුවෙන් අලංකාර මැටි බඳුන් නිමවන්නීය. අපේ මුල් ගම් පළාත පැල්පොළ. මමයි මහත්තයයි දෙන්නා මෙහෙට ඇවිල්ලා දැන් ඉන්නේ බෑණා ළඟ. මේ කර්මාන්තය

මට අළුත් දෙයක් නොවෙයි. මම අවුරුදු 12-13 කාලයේ ඉඳලා මේක දන්නවා. අම්මගෙන් තමයි ඉගෙන ගත්තේ. මුලින්ම කළේ අම්ම හදලා දෙන වළඳ වේලන්න ගිහිල්ල තියන එක. කොහේවත් පුහුණුවකට ගිහින් නෑ . බැන්දට පස්සේ අපි දෙන්නා මේ කර්මාන්තය කරගෙන ගියා. ඒ කාලේ අපි හැම දෙයක්ම කර ගත්තේ මෙම කර්මාන්තයට පිං සිද්දවෙන්න. ඔරුවෙන් මැටි ගෙනැවිත් මැටි පාගලා පදම් කරගෙන හට්ටි, මුට්ටි, ඇතිලි කළගෙඩි හැම එකක්ම හැදුවා. හරියට දුක් වින්දා. මහන්සි වුණා. ඒ ඔක්කොම හදන්න මට පුළුවන්. මේව කළේ ඉස්සර අපි අතින් කරකවන සකපෝරුවෙන් තමා. එක්කෙනෙක් කරකවනවා. එහෙම නැත්නම් තමන්ම අතින් කරකවලා තමයි ඉදිකර ගන්නේ. (සකපෝරුවෙන් මැටි භාණ්ඩ නිර්මාණය කර ගැනීම) ඉතින් හරි මහන්සියි. හුඟක් වෙලාවක් ගත වෙනවා. ඔය ඔතන තියෙන්නේ ඒ සකපෝරුව තමයි. ඉස්සර තිබුණේ ගල් කුරුල්ලා. දැකලා තියනවාද දන්නෑ. ගලෙන් හදලා වංගෙඩියයි ගල් කුරුල්ලා රෝදයට හයි කරලා වාඩිවෙලා අදින්න ඕන. තකහනියක් එක්කෙනෙක් ඉන්නම ඕන ඒකට.

සමෘද්ධියෙන් 2017 අවුරුද්දේ කරන්ට් එකෙන් වැඩ කරන මේ සකපෝරුව ( විදුලි සකපෝරුව) ලැබෙන කල්ම ඕකෙන් තමයි මම මේව ඉදි කළේ. අනේ පිං සිද්ධ වෙන්න ඕනෑ. සමෘද්ධි වැඩසටහනින් ලැබිච්ච මේ විදුලි සක පෝරුව නිසා පුදුම සහනයක් මට ලැබුනේ. ඉතින් මේක ලැබෙන කල් අවුරුදු 30-40 ක් ඔය දුක වින්දා . දැන් මේවා ඉදි කර ගන්න අර වගේ මහන්සි වෙන්න ඕන නෑ. කාලය ඉතිරියි. ඇඟට දැනෙන්නේ නෑ. වැඩ ඉක්මන්. ඒ වගේම ඉස්සර වගේ තුන් ගුණයක් බඩු හදාගන්න පුළුවන්. නැත්නම් මගේ වයසේ හැටියට පරණ සකපෝරුව එක්ක ඔට්ටු වෙන්න බෑ. ශක්තියකුත් නෑ. මේක නොලැබුණා නම් මේ වැඩේ මං අතෑරලා. එහෙනම් මම මෙලහකටත් ඇඳට වෙලා. දැං තාමත් වැඩක යෙදෙන්න පුළුවන්. මේකට පිං සිද්ධ වෙන්න. මේ ලැබිච්ච දේ වටිනාකම මට කියලා නිම කරන්න බෑ. ඒ විතරක් නෙමෙයි. අපි දෙන්නම ජීවත් වෙන්නේ මේ බෑණා ළඟනේ. මට මෙහෙම බඩු හදලා දීල එයාට ආදායමක් අරගෙන දෙන්න මට පුළුවන් වෙලා තියනවා. ඒක නිසා එයා ළඟ වුණත් එයාට ණයක් නොවී ජීවත් වෙන්න පුළුවන්. දැං මම දවසකට මැටි පහන් 1000-1500 ක් වගේ ප්‍රමාණයක් ඉදි කරනවා. මැටි පහනක් දෙන්නේ 2.50 ගානේ. දැන් මෙහෙම හදාගෙන එකතු කර ගත්ත ඒවා තමයි ඔය තියෙන්නේ. එකතු වුණාට පස්සේ පෝරණුවේ පුච්චනවා. ඉස්සර තිබිච්ච සකපෝරුවෙන් දවසට මැටි පහන් 300-400 විතර තමයි ඉදි කර ගන්න ලැබෙන්නේ. දැං ඒ ගාණ හරියට තුන් ගුණයක් ගර ගන්න මේකෙන් පුළුවන් වෙලා තියනවා. අනිත් බඩු හැදුවත් එහෙම තමයි. ආ......ඒ විතරක් නෙවෙයි.දැං මේ මැටි පහන හදන එක ගත්තොත් පරණ සකපෝරුවෙන් ඉදි කරන කොට මැටි පහනේ පතුල හදා ගන්න වෙන්නේ මැටි පහන ඉදිකරලා අරං තියලා පස්සේ ආයිත් අරගෙන අතින් වෙනමම හදන්න ඕන. එතකොට වැඩ දෙකක්. කාලයයි මහන්සියයි දෙකම වැඩියෙන් යනවා. දැං මේ විදුලි සක පෝරුවෙන් කරන කොට ඒක ඉදිකරලා ඉවර වෙන කොටම නූලකින් හරි ඉරට්ටකින් හරි හොඳට පතුල කපලා මැටි පහන වෙන් කරලා ගන්න පුළුවන්. ඒකත් මෙකෙ තියන ලොකු වාසියක්. තවත් ගෙවත්තේ ඉඩ තියනවා නම් මේ සකපෝරුවේ තියන ප්‍රයෝජනය කොච්චරද කියන්න බැහැ. ඇයි අපිට හොඳට තොගයක් හදලා තියාගන්න පුළුවන්නේ. මේ සකපෝරුවේ වටිනාකම නම් මට මිළ කරන්න බැහැ.



*භාවිතාකළ පැරණි සකපෝරු*

මැටි නිෂ්පාදනය තුළින් ජීවිතයේ ජයග්‍රහණ බොහොමයක් ලබා ගත් අයි. හේමාලි මහත්මිය යාල බටහිර ගම්මානයේ යටගල ගම් ගොඩැල්ලේ ජීවත් වේ. ඇයගේ පවුලේ සමාජිකයින් 05 දෙනෙකි. පරම්පරාවේ උරුමයක් ලෙස තම දෑතට හුරු වූ මැටි කර්මාන්තය ජීවිතයේ සියලු කටයුතු සඵල කර ගැනීමට ඉවහල් වූ අකාරය මෙසේ විස්තර කරන්නට විය.

මම විවාහ වෙන කොට අපිට ඉන්න හිටින්න තැනක් වත් තිබුණේ නෑ. මට පරම්පරාවෙන් ලැබුණු මැටි කර්මාන්තය ගැන දන්න දේ විතරයි ඉතුරු වුණේ. මේ තැනට එන්න ඉස්සෙල්ලා කුලී ගෙවල් 04-05 ක හිටියා. මහත්තයයි මමයි ඒ හිටපු තැන්වල ඉඳලා සුළුවෙන් හරි ඒවා හැදුවා. ඒවා හදාගෙන පෝරණුවක් තියන තැන් වලට අරගෙන ගහිල්ලා පුච්චා ගත්තා. ඔය තියෙන්නේ අපි ඉස්සර වැඩ කළ සකපෝරුව. ඒක තනියෙන් කරකවන්නත් අමාරුයි. එක අතකින් කරකවනවා. අනිත් අතින් ඉදිකර ගන්නවා. කී පාරක් එහෙම කරලාද එකක් හදා ගන්නේ. නැත්නම් කවුරු හරි කරකවලා දෙන්න ඕන. ඒකට දෙන්නෙක් මහන්සි වෙන්න ඕන. කාලය ගත වෙන එකත් එහෙමයි. පස්සේ මහත්තයා කොහේද ගිහිල්ලා හොයාගෙන ඇවිත් ඔය තියන සකපෝරුව හදලා දුන්නා. ඒකට පැඩල් එකක් හයි කරලා තියෙන්නේ. කකුලෙන් පාගන කොට කැරකෙනවා. එතකොට තමයි ඉදිකරන්නේ. හැබැයි ලං වෙලා නියමිත හැඩේට ඉදිකර ගන්න බෑ. ඇයි පැඩල් කරන කොට ඇත් වෙනවානේ. අනෙක පැද්දෙනවානේ. ඒකත් හරි වෙහෙසකර වැඩක්. භාණ්ඩයේ නිමාවත් හරි හැටි එන්නේ නෑ . ඔහොම තමයි අපි ඉස්සර වැඩේ කරගෙන ගියේ.



*විදුලි සකපෝරුවෙන් මැටි භාණ්ඩ නිපදවමින් ...... අයි. හේමමාලි මිය.*



*මැටි භාණ්ඩ වර්ණ ගන්වමින් .....*

ඔය අතරතුර තමයි සමෘද්ධි වැඩසටහන යටතේ මේ විදුලි සකපෝරුව මට ලැබුණේ. ඒකෙන් අපේ වැඩ කටයුතු තුන් ගුණයකින් ඉහළ ගියා. කාලය ඉතුරු වුනා. තනියම ඉදිකර ගන්න ලැබුණා. ඒ විතරක් නෙමෙයි. භාණ්ඩයේ නිමාවත් හොඳ වුණා. ඉස්සර අතින් කරකවලා සකපෝරුවෙන් හදපු කිරි මුට්ටියක් තමයි ඔය තියෙන්නේ මෙන්න බලන්න. මේ විදුලි සකපෝරුවෙන් හදපු කිරි මුට්ටිය. නිමාවේ සැහෙන වෙනසක් තියනවා නේද. හදන දේ ගැන හොඳට ඇහැ යොමු කරලා අලංකාර විදියට ඉදිකර ගන්න දැං පුළුවන් වෙලා තියනවා. පරණ සකපෝරුවෙන් දවසට හදන භාණ්ඩ ප්‍රමාණය වගේ තුන් ගුණයකට වැඩිය හදා ගන්න මේ විදුලි සකපෝරුවෙන් පුළුවන් වෙනවා. ඒක නිසා ඇත්තටම මේ විදුලි සකපෝරුව ලැබුනට පස්සේ සාමාන්‍යයෙන් අපේ ආදායම තුන් ගුණයකින් විතර ඉහළ ගියා. ඒකෙ ප්‍රතිඵල තමයි මේ තියෙන්නේ. ගේ දොර හදා ගත්තා වාහනයක් ගත්තා. ගත්ත ණය ඉක්මණින් ගෙවා දාන්නත් වැඩිපුර නිෂ්පාදනය කරපු නිසා පුළුවන් වුණා. ඇත්තටම මට තව විදුලි සකපෝරු දෙකක් දෙනවා නම් තවත් දෙන්නෙනෙකුට ලේසියෙන්ම රස්සාවල් දෙකක් දෙන්න පුළුවන්. මට කියන්න තියෙන්නේ අපි කරගෙන ගිය සාම්ප්‍රදායික ක්‍රමය වෙනස් කරලා මේ වගේ වේගවත් ගමනක් යන්න මේ විදුලි සකපෝරුව මට විශාල රුකුලක් වුණා.

**<u>සටහන</u>**

සමෘද්ධි වැඩසටහන යටතේ 2017 වර්ෂයේදි ක්‍රියාත්මක කල සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩසටහන කළුතර දිස්ත්‍රික්කයේ මදුරාවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේද ක්‍රියාවට නංවන ලදි. මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මානයක් ලෙස යාල බටහිර ගම්මානය තුළ එම නිෂ්පාදන කර්මාන්තයේ නිරත වූ පවුල් 11 ක් සඳහා විදුලි සකපෝරු ලබාදිම එහිදි සිදුකරන ලද කාර්යයන් අතර විය. එම විදුලි සකපෝරු භාවිතාව තුළින් නිෂ්පාදන කර්මාන්තයේ ඇතිවූ වර්ධනය හේතුවෙන් ඔවුන්ගේ ජන ජීවිතයට විශාල බලපෑමක් සිදු වූ බව ඔවුන්ගේ අදහස විය. ඒ අනුව දැනටමත් මැටි කර්මාන්තයේ නිරත එහි ප්‍රතිලාභ භුක්ති විදින කාන්තාවන් දෙදෙනෙකුගේ අදහස් ඇසුරින් මෙම ලිපිය සකස් කරන ලදි.

# "බෝපාගම මුර්සි අන්නාසි"

අෂාන් ප්‍රනාන්දු

නිදහස ලැබූ දා පටන් මේ දක්වාම බලයට පත්වූ සෑම රජයක් විසින් ම දිළිඳුකම පිටුදැකීම අරමුණු කරගනිමින් විවිධ ව්‍යාපෘති ක්‍රියාවට නංවා තිබේ. මෙම ව්‍යාපෘතීන් අතර දරිද්‍රතාවයෙන් පෙළෙන ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබලගැන්වීම උදෙසා රාජ්‍ය අනුග්‍රහය සහිතව ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් ගණනාවකි. 2017 වර්ෂයේ එවකට පැවති රජයේ දිළිඳුකම පිටුදැකිම උදෙසා වූ රාජ්‍ය ප්‍රතිපත්තියට සමගාමීව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයේ ප්‍රාථමික කර්මාන්ත අංශය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම නවිකරණ ව්‍යාපෘතිය හා ඒකාබද්ධව 2017 සිට "සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන" වැඩසටහන ක්‍රියාත්මක කර ඇත්තේ ද එම ක්‍රියාවලියෙහි තවත් පියවරක් වශයෙනි. එම ව්‍යාපෘතිය හා ඒ තුළින් ගොඩනැගුණු අඩු ආදායම්ලාභියකුගේ ජීවන අත්දැකීම් මත සවිබලගැන්වීම තුළ දිළිදුබව පිටුදැකිය හැකි ආකාරය සාකච්ඡා කිරීම මෙම විග්‍රහයේ අපේක්ෂාව වේ. 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන මෙම විග්‍රහයට පූර්ණ වශයෙන් පදනම් වේ.

2019 වර්ෂයේ සමෘද්ධි නිෂ්පාදන ආදාර්ශ ගම්මාන වැඩසටහන ඇරඹෙන්නේ 2017-2018 වර්ෂවලදී එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින් ලබාගත් අත්දැකිම් පාදක කර ගනිමිනි. 2019 වර්ෂයේදී සමෘද්ධි ප්‍රතිලාභින් හා අඩුආදායම්ලාභින් ඇතුළු සමස්ත ගම්මානයම සවිබල ගැන්විම ඉලක්ක කර ගනිමින් ඇරඹි මෙම වැඩසටහනෙහි ඉලක්ක සහ අරමුණු පහත පරිදි පෙළගැස්විය හැකිය.

- අපනයන අභිමුඛ හෝ ආනයන ආදේශන කෘෂි, සත්ව පාලන, ධිවර, කර්මාන්ත වර්ධනය කිරිම
- භාණ්ඩ හා සේවා නිෂ්පාදන කටයුතු සැකසිමේ සිට අගය එකතු කිරිම හා විකිණිම යන අගයදාම නිෂ්පාදනයක් කිරිම
- නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාල වූ යටිතල පහසුකම් සංවර්ධනය කිරිම
- වගා නොකල ඉඩම්, අපනයන අභිමුඛ හා ආනයන ආදේශන කෘෂි බෝග වගාවක් සඳහා යොදා ගැනිම.
- නිශ්චිත සවිබල ගැන්විය හැකි සමෘද්ධි පවුල් හඳුනා ගැනිම හා ගම්මානයේ සියළු සමෘද්ධිලාභි පවුල් අදාල නිෂ්පාදන කටයුතු සඳහා දායක කර ගැනිම
- දැකුම්කළු තුරුලතා බහුල පරිසර හිතකාමි ගමක් නිර්මාණය කිරිම,

මෙම අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන ආරම්භ කිරීමේදී අපනයන විභවයක් සහිත හෝ ආනයන ආදේශකයක් ලෙස සැළකිය හැකි දැනට බහු වාර්ෂික බෝග වගා කර ඇති හෝ වගා කිරිමට යෝග්‍ය ගම්මානයක් විම, එක් දිස්ත්‍රික්කයකින් එක් ගම්මානයක් විම, නිෂ්පාදනය හා සේවාව බහුතරය සමජාතිය විම, නිෂ්පාදනයේ යෙදෙන පිරිසෙන් 50% සමෘද්ධිලාභි හෝ අඩුආදායම්ලාභි පවුල් විම, නිෂ්පාදනයේ යෙදෙන පිරිස තම ජිවන මාර්ගය වැඩිදියුණු කර ගැනිමට උනන්දුවක් දැක්විම, එක් ප්‍රතිලාභියෙකුට 60% ක් එනම් රු 45,000 ක ආධාරක් ලබාදිම හා ඉතිරි 40% ක් එනම් රු 30,000 ක ශ්‍රමය, අමුද්‍රව්‍ය හෝ වෙනත් ආකාරයකින්

ප්‍රතිලාභි දායකත්වයක් විම හා එක් ගම්මානයකට දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන දෙකක දායකත්වය දැක්විම යන කරුණු සැළකිල්ට ගෙන ඇත.

ගම්පහ දිස්ත්‍රිකයේ අත්තනගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඌරාපොල සමෘද්ධි කලාපයේ බෝපාගම ග්‍රාම නිලධාරි වසම තුළ ද අන්නාසි නිෂ්පාදනය පදනම් කරගෙන 2019 වර්ෂය අවසානයේදී මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත්තේ අඩු ආදායම්ලාභී පවුල්වල, සමජාතීය නිෂ්පාදන වැඩිදියුණු කරමින් ඔවුන්ගේ අදායම් තත්ත්වය වර්ධනය කර, ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමේ අරමුණ පෙරදැරිවය. ආරම්භක අදියරේදී එනම් 2020 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දී බෝපාගම වසමේ සමෘද්ධි ප්‍රතිලාභි පවුල් 164 ක් අතරින් අන්නාසි බෝගය නිෂ්පාදන කිරීමේ හැකියාව සහිත සමෘද්ධි ප්‍රතිලාභින් 35 දෙනෙකු ඇතුළු අඩු ආදායම්ලාභින් 44 දෙනෙකු තෝරා ගෙන ඔවුනට අන්නාසි පැළ 3,000 බැගින් ලබාදී ඇත. මෙහිදි මුර්සි ප්‍රභේදයට අයත් අඩියක් උසැති හා පළමු මුරයේ අක්ෂි මොරෙයි පැල ලබාදිමට කටයුතු යොදා ඇති අතර එම එක් පැලයක වටිනාකම රු.15 ක් වි ඇත. ඒ අනුව එක් ප්‍රතිලාභියෙක් සඳහා රු.45,000 ක් වටිනා අන්නාසි පැළ නොමිලේ ලබා දී ඇත. ඒ අනුව සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන මගින් බෝපාගම වසම තුළ ප්‍රතිලාභින් 44 දෙනෙකු සඳහා ලබා දී ඇති මුළු අන්නාසි පැළ සංඛ්‍යාව 132,000 ක් වන අතර ඒ සඳහා වැය කර ඇති මුළු මුදල රු.1,980,000 කි.



බෝපාගම සමෘද්ධිලාභී මෙන්ම අඩු ආදායම්ලාභී පවුල් අන්නාසි වගාවට උනන්දු කිරීම මගින් සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන අපේක්ෂා කර ඇති ප්‍රතිඵල කිහිපයකි. එක් ප්‍රතිලාභියෙකුගෙන් වසරක් අවසානයේදී අන්නාසි කිලෝ 3,000 ක අස්වැන්නක් හා අන්නාසි පැල 3000 ක නිෂ්පාදනයක් ලබාගැනිමත්, අන්නාසි කිලෝවක් රු.90 බැගින් විකුණා රු.270,000 ක ආදායමක් ලබාගැනීමත්, අන්නාසි පැළයක් රු.15 බැගින් රු.4,5000 ක නිෂ්පාදන වටිනාකමක් ලබාගැනීමත් එම අපේක්ෂිත ප්‍රතිඵල අතර ප්‍රමුඛත්වයක් ගෙන ඇත. එම නිෂ්පාදන ඉලක්ක සපුරාගැනීම සඳහා රු.100,887 ක ප්‍රතිලාභී ශ්‍රම දායකත්වයක් ද, රු.60,270 ක නිෂ්පාදන යෙදවුම් දායකත්වයක් ද ප්‍රතිලාභියෙකු විසින් දැරිය යුතු වන අතර ඒ තුළින් එක් ප්‍රතිලාභියෙකු ව්‍යාපෘතියේ පළමු වසර අවසානයේ දී රු.254,730 ක ලාභයක් ලබාගැනීම අපේක්ෂා කර ඇති අතර එම ලාභයෙන් ප්‍රතිලාභී ශ්‍රම යෙදවුමේ අගය ඉවත් කළ පසු රු.153,843 ක ශුද්ධ ලාභයක් ලබාගැනීම අපේක්ෂාකර ඇත. අඩු අදායම්ලාභියෙකුගේ මාසික ආදායමට රු.21,227 ක මුදලක් එකතු කිරීම වැඩසටහනෙහි මූලික අභිප්‍රාය වී ඇත.

මෙම වැඩසටහන මගින් ලබාදුන් අන්නාසි පැළ වගා කර එහි සාර්ථක ප්‍රතිලාභ ලද අයෙකු ලෙස මෙම ගම්මානය තුළ සිදු කළ අධ්‍යයනයේ දී හඳුනා ගැනුණු සමෘද්ධිලාභියෙකු වන රුවන් කුමාර මහතා පිළිබඳව විග්‍රහය සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන එහි අරමුණු දිනාගත් ආකාරය පිළිබඳ කදිම නිදසුනක් වනු ඇත.

හතලිස් දෙහැවිරිදි වියෙහි පසුවන රුවන් කුමාර මහතා අධ්‍යාපනය ලබා ඇත්තේ අටවන ශ්‍රේණිය දක්වා පමණි. බිරිඳ හතලිස් එක් වන වියේ පසුවන ගෘහනියක් වන අතර අ.පො.ස.(සා.පෙ.ළ) දක්වා අධ්‍යාපනය ලබා ඇත. දසවන වියේ පසුවන පුතා හයවැනි ශ්‍රේණියෙ ඉගෙනුම ලබන අතර පස්වන වියේ පසුවන දුව පෙරපාසලේ ඉගෙනුම ලබයි. අවුරුදු හැත්තෑවක් වන අසනිප තත්ත්වයේ පසුවන මව ද එම නිවසේ ඔවුන් සමඟ ජීවත්වේ. සමාජිකයින් පස් දෙනෙකුගෙන් යුතු පවුල පූර්ණ වශයෙන් නඩත්තු කරන්නේ ඔහු විසිනි. අඩු ආදායම්ලාභියෙකු ලෙස මාසිකව රු 3500 ක සමෘද්ධි ප්‍රතිලාභයකට හිමිකම් කියන අතර අන්නාසි හා මඤ්ඤොක්කා මූලික කරගත් ගොවිතැන මගින් පවුලේ දිවි සරිකර ගනී.



නිවස හා ගෙවත්ත පැතිර ඇත්තේ අක්කර භාගයක ගල්බොරුළු සහිත ඉඩමකය. අවුරුදු හතලිහක කාලයක් පුරාවට ඔහු ජීවත් වන්නේ පවුලේ බාලයාවීම නිසාවෙන් මව් පිය උරුමයෙන් ලද නිවසෙහිය. නිවසෙහි බිත්ති සිමෙන්ති ගල් හා වරිච්චිවලින් නිමවා ඇති අතර වහලට රට උළු සෙවිලිකර, පොලොවට සිමෙන්ති දමා ඇත. විදුලි බලය සහිත නිවසක් වන අතර ළිං ජලය මොටර්කර ලබා ගනී. සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ද ඇත. කාමර තුනකින් සමන්විත මෙම නිවස වර්ග අඩි 800 ක පමණ පැතිර ඇත. තමන් වෙසෙන මෙම නිවසේ වරිච්චි බිත්ති තවදුරටත් අලුත්වැඩියා කිරීම නිශ්ඵල බව තේරුම් ගැනීම නිසාවෙන් නිවසට යාබදව නව නිවසක් තැනීම සඳහා දරන්නා වූ උත්සහයක් ද එහි යනෙන ඕනෑම අයෙකුට දැකගත හැකිය. ඔහු ගණුදෙනු කරන එකම මූල්‍ය ආයතනය වන ඌරාපොල සමෘද්ධි බැංකුවෙන් සියළු මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීමට ඔහුගේ පුරුද්දය. සමෘද්ධි සමිතිය හැරෙන්නට ඔහු සාමාජිකත්වය දරණ එකම සමිතිය වන්නේ බෝපාගම මරණාධාර සමිතියයි.



වසර දහයක පමණ කාලයක සිට අන්නාසි හා මඤ්ඤොක්කා වගාවට කුමාර මහතා යොමු වන්නේ පාසල් හැරයාමෙන් පසු අන්නාසි වත්තක කුළී වැඩට ගොස් ලබාගත් අත්දැකීම් මත පදනම් වෙමිනි. ගොවිතැන තම

ප්‍රධාන ජීවිකාව කර ගත්ත ද ඊට ප්‍රමාණවත් භූමියක් තමා සතුව නොමැති නිසාවෙන් අන්නාසි වගාවට යොදවා ඇත්තේ ගමේ ඉඩම් හිමියෙකුගෙන් භූමිය සකසා පැල සිටුවා වසර 3 ක් රබර් වගාවක් නඩත්තුකරදීමේ පදනම මත ලබාගත් අක්කර තුනක ඉඩමකය. මෙම භූමියට අමතරව තම සහෝදරයා සමඟ හවුලේ බදු පදනම මත ලබාගත් අක්කර තුනක ඉඩමක මඤ්ඤොක්කා වගාවේ ද නිරත වන උත්සහවන්ත තරුණ ගොවියෙකු ලෙස කුමාර මහතා හඳුන්වා දිය හැකිය.

මෙලෙස වගා කටයුතු සිදු කරමින් හිදිනා අතරතුර 2019 වර්ෂය අවසානයේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් බෝපාගම වසම තුළ ක්‍රියාත්මක කරන ලද අන්නාසි නිෂ්පාදන ගම්මාන වැඩසටහනට හෙතෙම සම්බන්ධ වී ඇත. මෙම වැඩසටහන හා අන්නාසි වගාව පිළිබඳව ඌරාපොල සමෘද්ධි බැංකුවේ පවත්වන ලද මූලික දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා මොහුගේ බිරිඳ සහභාගි වී ඇත. මෙහිදි අඩු ආදායම්ලාභි පවුලක්විම, කාලයක් පුරා අන්නාසි වගාවේ නිරතවිම හා ඒ පිළිබඳ වැඩි අත්දැකිම් ප්‍රමාණයක් තිබිම, දියුණුවිමට ඇති කැමැත්ත, වගා කටයුතු සඳහා යෙදවිමට ප්‍රමාණවත් කාලයක් තිබිම හා වගා කටයුතුවලට අවශ්‍ය පළපුරුදු ශ්‍රමය ඥාතින්ගෙන් ලබා ගැනීමේ ඇති පහසුව යන කරුණු සැලකිල්ලට ගනිමින් නැවත අයනොකරන රජයේ අධාරයක් ලෙස රු 45,000 වටිනා අන්නාසි පැල 3000 ක් 2020 වර්ෂයේ ජනවාරි මාසයේදි ලබා දී ඇත.

රජයේ අධාරයක් ලෙස ලැබුණු අන්නාසි පැල වගාකිරිම සඳහා තමන් සතු භූමි ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා ඉඩමක් ලබාගෙන ඇත්තේ ප්‍රදේශයේ පැරණි රබර් වගා හිමියෙකුගෙන් එම භූමියෙහි නව රබර් වගාව සිදුකර වසර තුනක් නඩත්තු කරදිමේ පදනම මතය. ජේ.සි.බි. යන්ත්‍රයක් යොදාගෙන භූමිය සකස් කර පාංශු සංරක්ෂණ ක්‍රම යොදා ඉඩමේ හිමිකරුගේ රබර් පැල හා අධාරයක් ලෙස ලැබුණු අන්නාසි පැල රෝපණය කර



ඇත. නියමිත පරිදි පොහොර යොදමින්, කෘමි හා දිලිර හානි පාලනය කරමින්, වියලි කාලයේදී ජලසම්පාදනය කරමින්, වල් පැලැටි මර්ධනය කරමින්, මනා ලෙස අන්නාසි වගාව නඩත්තුකර ඇත. වගා කටයුතු සඳහා ඔහු තුළ වූ වෘත්තිය හැකියාව, අන්නාසි වගාවට සුදුසු භූමියක් ලැබිම, දියුණුවිමට තිබූ උනන්දුව, අන්නාසි වගාව සඳහා ඇති උනන්දුව හා කැපවිම, අන්නාසි වගාව සම්බන්ධව සොහොයුරා සතුව තිබූ දැනුම, යහපත් දේශගුණ තත්ත්වය යනාදිය ද අන්නාසි වගාවේ සාර්ථකත්වය උදෙසා ඉවහල්වූ බව ඔහුගේ විශ්වාසය විය.



මේ සියළු සාධකවල ප්‍රතිඵලයක් ලෙස අන්නාසි කිලෝ 3,500 ක අස්වැන්නක් ඔහු විසින් ලබාගෙන ඇති අතර එය අපේක්ෂිත ඉලක්කය ඉක්මවා යාමකි.

අන්නාසි වගාව මනා ලෙස නඩත්තු කිරිමේ ප්‍රතිඵලයක් ලෙස එක් පැලයකින් අතිරික්ත පැල දෙකක් ඉවත්කර ගැනිමේ හැකියාව මත අන්නාසි පැල 6,000 ක් ලබාගෙන ඉන් පැල 3,000 ක් විකුණා ආදායම් ලබාගැනිමටත්, අනෙක් පැල 3,000 ක ප්‍රමාණය වගා ව්‍යාප්ත කටයුතු කිරිමටත් හැකියාව ලැබීම ඔහු ලබා තිබූ ජයග්‍රහණයකි.

## ආදායම්-වියදම් විශ්ලේෂණය

| යෙදවුම් | ව්‍යාපෘතියේ අපේක්ෂාව | | රුවන් කුමාර | |
|---|---|---|---|---|
| | තමන්ගේ | බාහිරට | තමන්ගේ | බාහිරට |
| උපකරණ | | 500/- | 1000/- | |
| වැට සැකසීමේ අමුද්‍රව්‍ය | | 50000/- | - | |
| වැට සැකසිම කම්කරු | 9091/- | | - | |
| පාංශු සංරක්ෂණය කම්කරු | 60000/- | | | |
| බිම් සැකසිම | 19796/- | | | 18000/- |
| පැල සිටුවිම කම්කරු | 3000/- | | 6000/- | |
| කෘමි/ දිලිර නාශක | | 1775/- | | 4000/- |
| කෘමිනාශක යෙදිම කම්කරු | | | | 3000/- |
| වල්නාශක | | 225/- | | 10000/- |
| වල්නාශක යෙදිම කම්කරු | | | | 3000/- |
| පොහොර | | 2970/- | | 36000/- |
| පොහොර යෙදිම කම්කරු | | | 9000/- | |
| නඩත්තු කටයුතු කම්කරු | 7500/- | | 63000/- | |
| වෙනත්/ බෙහෙත් | | 4800/- | | 2000/- |
| වෙනත් කම්කරු | 1500/- | | | |
| **එකතුව** | 100887/- | 60270/- | 79000/- | 76000/- |
| | | | | |
| අන්නාසි අදායම | (3000*90/-) 270000/- | | (3500*60/-) 210000/- | |
| පැල විකුණුම් ආදායම | 45000/- | | 45000/- | |
| පැල ව්‍යාප්ති වටිනාකම | - | | 45000/- | |
| **මුළු නිෂ්පාදන වටිනාකම** | 315000/- | | 300000/- | |
| බාහිරට ගලා ගිය මුදල | (60270/-) | | (76000/-) | |
| **ශු. ලැබිම්** | 254730/- | | 221000/- | |
| තමන්ගේ දායකත්වය | (100887/-) | | (79000/-) | |
| **ශු. ලාභය** | 153843/- | | 142000/- | |

රුවන් කුමාර මහතා ආරක්ෂිත වැට සඳහා අමුද්‍රව්‍ය වියදමක් නොදැරුවත්, බිම සැකසීමේදී තම ශ්‍රමය වෙනුවට ජේ.සි.බි. යන්ත්‍රයක් යොදා ගැනිම, කුලී පදනම මත වල්නාශක හා කෘමිනාශක යෙදිම, පොහොර සඳහා අපේක්ෂිත වියදමට වඩා වැඩි වියදමක් දැරිම නිසා ඒ සඳහා වන මුළු වියදම ලෙස රු.76,000 ක මුදලක් දැරීමට සිදුව ඇත. පැලසිටුවිම, පොහොරයෙදිම හා නඩත්තු කටයුතු වෙනුවෙන් රු.79,000 ක ශ්‍රම වටිනාකමකින් ඔහු දායකවී ඇති අතර ඒ අනුව ඔහුගේ මුළු පිරිවැය රු.155,000 ක් වේ. ඔහුගේ මුළු පිරිවැයෙන් 51% තමන් ළඟ රඳවා ගැනීමට ඔහු සමත්ව ඇති අතර අපේක්ෂිත පිරිවැයට වඩා අඩු අගයක ඔහුගේ මුළු පිරිවැය පවත්වා ගැනීමට ද සමත්වී ඇත. මෙහිදි ජේ.සි.බි. යන්ත්‍රය බිම සැකසිම සඳහා යොදා ගැනිම නිසා ගල් සහිත භූමිය තුළ අන්නාසි වගාව සඳහා බිම

සැකසීම, පාංශු සංරක්ෂණය හා ඔහුට හිමි භූමියක් නොමැතිවීම නිසා භූමිය සඳහා බදු කුලිය වෙනුවට ගෙවනු ලබන රබර් පැල සිටුවීම සඳහා වලවල් කැපීම, මිනිස් ශ්‍රමයට වඩා අඩු වියදමකින් හා වඩා ඵලදායිව සිදුකර ගැනීමට ඔහුට හැකිවී ඇත. අපේක්ෂිත පිරිවැය තුළ භූමිය සඳහා බදු කුලී වෙන් කිරීමක් නොමැති අතර රුවන් මහතාගේ පිරිවැය තුළ ඒ සඳහා ගෙවනු ලබන රබර් වගා නඩත්තුව ද අන්තර්ගත බැවින් ඔහුගේ මුළු පිරිවැය තවදුරටත් අඩු අගයක් ගනු ඇත. මෙම කරුණු සලකා බැලීමේදී වගා කටයුතු සඳහා ඔහුගේ කැපවීම මනාව හඳුනාගත හැකිය.

අන්නාසි නිෂ්පාදන වැඩසටහන තුළ වසරකදී එක් ප්‍රතිලාභියෙකුගේ අන්නාසි විකුණුම් ආදායම කිලෝවකට රු.90 බැගින් කිලෝ 3000 ක් සඳහා රු.270,000 ක් වන අතර එක් පැළයක් රු 15 බැගින් අලෙවි කිරීමෙන් පැළ 3000 ක් සඳහා රු.45,000 ක් වේ. ඒ අනුව මුළු ආදායම ලෙස රු.315,000 ක් අපේක්ෂිතය. රුවන් කුමාර මහතා තම අන්නාසි වගාව මනා ලෙස නඩත්තු කිරීමේ හේතුව නිසාම අපේක්ෂිත අන්නාසි ගෙඩි ප්‍රමාණය ඉක්මවා කිලෝ 3500 ක අන්නාසි නිෂ්පාදනය කර ඇත. වර්තමානයේ පවත්නා කොවිඩ් 19 තත්ත්වය තුළ වෙළඳපොළ මිල පහල වැටීම නිසා අන්නාසි කිලෝවක් රු.60 බැගින් අලවිකර ඔහු විසින් රු.210.000 ක් ලබාගෙන ඇත. අන්නාසි පැල විකිණීම හා වගා ව්‍යාප්තිය සඳහා අන්නාසි පැළ 6,000 ක් නිෂ්පාදනය තුළින් රු.90,000 ක් ඔහු විසින් නිෂ්පාදන වටිනාකමට එක් කර ඇති අතර ඒ අනුව ඔහුගේ මුළු නිෂ්පාදන වටිනාකම රු.300,000 වේ. සමාන්‍යය වෙළඳපොල තත්ත්වයක් තුළ අන්නාසි කිලෝවක් සඳහා රු.90 ක අපේක්ෂිත මිල ලැබුනේ නම් අන්නාසි ගෙඩිවලින් රු.315,000 ක් හා අන්නාසි පැල නිෂ්පාදනයෙන් රු.90,000/- ක් එක්කළවිට ඔහුගේ මුළු නිෂ්පාදන වටිනාකම රු.405,000 ක් වනු ඇත. ඒ අනුව අපේක්ෂිත ආදායම වෙත රුවන් කුමාර මහතා ළඟාවී ඇති අතර සාමන්‍යය වෙළඳ පොල තත්ත්වය තුළ ඔහුගේ මුළු නිෂ්පාදන වටිනාකම තවදුරටත් ඉහල යනු ඇත.

සමෘද්ධි අන්නාසි නිෂ්පාදන වැඩසටහන තුළ වසරකදී එක් ප්‍රතිලාභියෙකුගේ මුළු නිෂ්පාදන වටිනාකම රු.315,000 වන අතර අන්නාසි නිෂ්පාදනයේ දී ප්‍රතිලාභියා විසින් බාහිරින් ලාබගන්නා යෙදවුම් සඳහා රු.60,270 ක් ගෙවූ විට රු.254,730 ක මුදලක් ශුද්ධ ලැබීම් ලෙස අපේක්ෂිතය. කොවිඩ් 19 නිසා වෙළඳ පොළ අන්නාසි මිල පහල ගිය තත්ත්වයක් තුළ රු.300,000 ක මුළු නිෂ්පාදන වටිනාකමක් රුවන් කුමාර මහතා ලබාගෙන ඇති අතර ඔහු විසින් බාහිරින් ලබාගත් යෙදවුම් සඳහා රු.76,000 ගෙවූ විට රු.221,000 ක මුදලක් ශුද්ධ ලැබීම් ලෙස ලබාගෙන ඇත. එය මාසික සාමාන්‍යය ලැබීම රු.18,416 ක් ලෙස දැක්විය හැකිය. මෙම ශුද්ධ ලැබීම් තුළින් ඔහුගේ ශ්‍රම දායකත්ව වටිනාකම වන රු.79,000 ක් ඉවත් කළ පසු ඔහු විසින් රු.142,000 ක ශුද්ධ ලාභයක් උපයා ඇත. වෙළඳපොල සාමන්‍යය තත්ත්වය තුළ ඔහුට තම අන්නාසි නිෂ්පාදනය කිලෝවක් රු.90 බැගින් විකිණීමට හැකි වුයේ නම් ඔහුගේ මුළු නිෂ්පාදන වටිනාකම රු.415,000 ක් වන අතර බාහිරින් ලබාගත් යෙදවුම් වන රු.76,000 ඉවත්කළ පසු රු.339,000 දක්වා ශුද්ධ ලැබීම් ඉහළ යනු ඇත. එය අපේක්ෂිත තත්ත්වය ඉක්මවායාමක් වන අතර ඔහුගේ මාසික සමාන්‍යය ශුද්ධ ලැබීම් ලෙස රු.28,250 ක් වනු ඇත. එය අඩු අදායම්ලාභියෙකු ලෙස සැළකිය යුතු මාසික ආදායමක් ලෙස හඳුනාගත හැකිය.



වෘත්තිය හැකියාව හෝ නිපුණතාව, වගා කටයුතු සඳහා ඇති උනන්දුව, වගාවට සුදුසු භූමිය ලැබිම, අන්නාසි වගාව සම්බන්ධ පූර්ව අත්දැකිම් හා දැනුම, දියුණුවීමට තමා තුළ ඇති කැමැත්ත, වගා කටයුතු පිළිබද ඇති කැපවිම, වගා කටයුතු සඳහා පවුලේ දායකත්වය ලැබිම, වගාවේ නඩත්තු කටයුතුවලට ප්‍රමාණවත් කාලයක් තිබිම හා යෙදවුම් සඳහා මුල්‍ය හැකියාව තිබීම රුවන් කුමාර වැනි අඩු ආදායම්ලාභියෙකු අන්නාසි වගාව තුළින් සාර්ථකත්වය ළගා කර ගැනීමට හේතු වී ඇති බව මෙම විග්‍රය තුළ මනාව පසක් වන්නේ ය. . අන්නාසි වගාවට අවශ්‍ය නියමිත රෝපණ ද්‍රව්‍ය ලැබීම, හිතකර දේශගුණ හා පාංශු තත්ත්වයක් පැවතීම, නියමිත පරිදි භූමිය සැකසිම, කෘමි හා දිලීර පාලනය, වල් පැළෑටි ඉවත් කිරීම, නියමිත පොහොර භාවිතය, ජල සම්පාදනය හා සත්ව හානි වළක්වා ගැනීම යන සාධක ද ඔහුගේ සාර්ථකත්වයට හේතු වී ඇත.

මෙම අත්දැකිම සළකා බැලිමේදී අවසාන වශයෙන් පෙන්වා දිය හැක්කේ රුවන් කුමාර මහතාගේ සාර්ථකත්වයට ඉහල්වූ ඉහත විග්‍රයට බඳුන් වූ සාධක අතුරින් වැඩි ප්‍රමාණයක් සපුරා ගත හැකි ඕනෑම අඩු ආදායම්ලාභියෙකුට තමන් නිරත වන ඕනෑම ආර්ථික කාර්යයක් තුළින් සැළකිය යුතු සාමන්‍ය මාසික අදායමක් ලබාගැනිම මගින් ජිවිතය ජය ගැනිමට නොමද අත්වැලක් සපයා ගත හැකි බවය.

# අපද්‍රව්‍ය කළමනාකරණය කරමින් ව්‍යාපාර ආරම්භ කරන්න.

මංගලිකා වනසුන්දර

අපද්‍රව්‍ය නිවැරදි ලෙස හඳුනා නොගැනීම හා නිසි ලෙස කළමනාකරණය නොකිරීමේ ප්‍රතිවිපාකය අපි පසුගිය කාලය තුළදී අත්දුටුවෙමු. නිවසින් හා වෙනත් බොහෝ ආයතන විසින් බැහැර කළ අපද්‍රව්‍ය නැතහොත් කසල නිසා වටිනා මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් රටට අහිමි කිරීමට තරම් අපද්‍රව්‍ය බලවත් වෙතැයි කිසිවෙක් නොසිතන්නට ඇත.

ජනගහනය හා ජන ඝණත්වය සීඝ්‍ර ලෙස වැඩි වීමේ ප්‍රතිඵලය නම් මෙම බැහැර කරන ද්‍රව්‍ය අධි වේගයෙන් කඳුගැසීම හා ඒ මගින් පරිසරයට සිදුවන හානියන් හි ප්‍රමාණය ද වේගයෙන් ඉහළ යාමයි. දියුණුව කරා ගමන් කරන රටකට මෙවැනි අර්බුධකාරි තත්වයන්ට මුහුණ දීම උසුලා ගැනීමට නොහැකි තත්වයක් වන්නේ එවැනි තත්වයන් පාලනය කර ගැනීමට හෝ වලක්වා ගැනීමට මුල සිටම ක්‍රියාත්මක කරවීමට යාන්ත්‍රණයක් සැලසුම් කර නොතිබුණ බැවින් බව පැහැදිලි වන කරුණකි. නිසි ලෙස අපද්‍රව්‍ය කළමනාකරණය නොකිරීම නිසා පරිසරයට, වායුගෝලයට සිදුවන හානියේ තරම කුමන ආකාරයකින් වත් ගණනය කළ නොහැකි වන තරමටම මෙය උග්‍ර අර්බුධයක්ව පවතී.

එනමුත් මෙම ලිපියෙන් අපද්‍රව්‍ය නිසාවෙන් පරිසරයට සිදුවන හානිය හෝ අපද්‍රව්‍ය කලමනාකරණය කිරීමේ තාක්ෂණික පැතිකඩ පිළිබඳව විග්‍රහයක් සිදු කිරීමට කිසිසේත්ම අපේක්ෂා නොකරන අතර, මේ තුලින් උත්සාහ ගන්නේ, විශේෂයෙන් අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙනුවෙන් හා එම ප්‍රජාව යම් දිශානතියක් කරා යොමු කරවීමට මැදිහත් වීමක් සිදු කිරීමට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය හැටියට අපට මැදිහත් විය හැකි හා මැදිහත් විය යුතු පැතිකඩක් පිළිබඳව කිසියම් අදහසක් ජනනය කිරීම මේ තුලින් අපේක්ෂා කෙරේ.

අඩු ආදායම්ලාභි ප්‍රජාව එසේම සමෘද්ධි වැඩසටහනේ ප්‍රතිලාභී ප්‍රජාවට ආර්ථික හැකියාවන් වර්ධනය කරගැනීම සඳහා විවිධ අවස්ථාවන් තිබුණ ද ඒවා පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමේ හා විවිධ ව්‍යාපාර වර්ගයන් හඳුන්වා දීම සඳහා ප්‍රජාව යොමුගත කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් හෝ යාන්ත්‍රණයක් නිසි ලෙස තවමත් ක්‍රියාත්මක නොවන තත්වයක් දක්නට ඇත. බොහෝ විට අඩු අධ්‍යාපන මට්ටමක් සහිත හා ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති පිරිස් පමණක් නොව දැනට සාමාන්‍ය මට්ටමින් ව්‍යාපාර අරම්භ කර පවත්වාගෙන යන එහෙත් තවමත් ඔවුන් සතුව යම් කාලයක් ඉතිරිව ඇතැයි සිතන, එමෙන්ම ආර්ථික ශක්තිය වැඩි කරගැනීම සඳහා දැඩි වුවමනාවක් ඇති පිරිස් සඳහා මෙය ව්‍යාපාර මාධ්‍යයක් කරගැනීමට හෝ අමතර ආදායමක් උපයා ගැනීමට පෙළඹවීමක් සිදුකිරීමද මේ තුලින් අපේක්ෂා කෙරේ.

අපද්‍රව්‍ය භාවිතා කරමින් මේ වන විටත් මහා පරිමාන හා මධ්‍යම පරිමාන මට්ටමින් ආරම්භ කර ඇති ව්‍යාපාර ලංකාවේ විවිධ පළාත්වල ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් ද පවතී. මේ නිසාම මෙම ක්ෂේත්‍රයට පැමිණීමට අපේක්ෂා කරන අයට එම ව්‍යාපාර මගින්ද කිසියම් අත්දැකීමක් ද ලබා ගැනීමට හැකියාව ඇත. විශේෂයෙන් මෙම ක්ෂේත්‍රය පිළිබඳව බොහෝ දෙනෙක්ට ප්‍රමාණවත් දැනුමක් හෝ අත්දැකීම් ඇත්තේ අඩු වශයෙනි. එසේ වීමට විවිධ හේතු බලපා ඇත. මෙම ක්ෂේත්‍රයට මැදිහත් වුවහොත් උපයා ගත හැකි මූල්‍යමය ඉහළ ආදයම පිළිබඳව සහ

ආරම්භ කිරීම සඳහා ඇති පහසුව පිළිබඳව වැඩි දෙනෙක්ට නිසි වැටහීමක් නොමැති බව පැහැදිලිය. මෙවැනි පරිසරයක් තුල රටක ව්‍යාපාර ආරම්භ කිරීමට යොමු කරවීම තුළින් ජාතික මට්ටමින්, ප්‍රාදේශිය මට්ටමින් මෙන්ම පුද්ගල මට්ටමින් ද අත්පත් කරගත හැකි වාසි ප්‍රමාණය අති විශාලය.

මෙවැනි ව්‍යාපාර ක්ෂේත්‍රයක් පිලිබඳව කරුණු ගෙනහැර දැක්වීම මෙවැනි ලිපියක් තුලින් පමණක් ප්‍රමානවත්ව සිදු කළ නොහැකි අතර, දැනට මෙම ලිපියෙන් අපද්‍රව්‍ය පිළිබඳව මූලික හඳුනා ගැනීමක් පමණක් සිදුකර ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.

**අපද්‍රව්‍ය හඳුනා ගනිමු .**

ලොව වසන සෑම සත්වයෙක්ම අපද්‍රව්‍ය නිපදවයි. මෙය නිරන්තරයෙන්ම මෙන්ම නොනවත්වාම සිදුවන ක්‍රියාවලියකි. සත්ව කොට්ටාශය අතරින් මිනිසුන් අපද්‍රව්‍ය නිෂ්පාදනය සිදු කරන ආකාරය පිළිබඳව විශ්ලේෂණය කිරීම වැදගත් කරුණකි. මෙහිදී සමහර පුද්ගලයින් වැඩියෙන් අපද්‍රව්‍ය නිපදවන අතර තවත් සමහරු අඩුවෙන් නිපදවයි. කෙසේ නමුත් සෑම අයෙක්ම මොනයම් ආකාරයකට හෝ අපද්‍රව්‍ය නිපදවීමක් සිදුකරයි. ඉවතලන ආහාර අපද්‍රව්‍ය , අපිරිසිදු ජලය හා අනෙකුත් කුණු කසල ඒවා අතර වේ.

මෙහිදී අපද්‍රව්‍ය ලෙස හඳුන්වන්නේ මොනවාද යන්න හඳුනා ගැනීම වැදගත් වේ.

ප්‍රථම හිමිකරු හෝ භාවිතා කරන්නාට තව දුරටත් වටිනාකමක් නොමැති, ප්‍රථම හිමිකරු හෝ භාවිතා කරන්නන් විසින් ඉවත දමන ලද හෝ බැහැර කරණු ලැබූ කිසියම් දෙයක් අපද්‍රව්‍යක් ලෙස හැදින්විය හැකිය. මෙහිදී අපට අවශ්‍ය නොවන, ඉවත දැමීමට හැකි ඕනෑම දෙයක් අපද්‍රව්‍යකි. මෙහිදී අපද්‍රව්‍ය යනු නියත වශයෙන්ම කිසියම් ක්‍රියාවලියක අතුරු ඵලයකි. සරල ආකාරයට මෙය විග්‍රහ කලහොත් අප ආහාරයට ගන්නා ඕනෑම දෙයකින් බඩගින්න නිවුණු පසු ඉතිරි වන කොටස අපද්‍රව්‍ය වලට කදිම උදාහරණයකි. ගෙදරට රැගෙන එන කිරි පැකට් එකෙන් ඉවත දමන ඇසුරුම ද තවත් උදාහරණයකි. මේ අනුව පැහැදිලි වන්නේ භාවිතා කිරීමෙන් පසුව තව දුරටත් අවශ්‍ය නොවන දේ අපද්‍රව්‍ය වේ. නමුත් මෙහිදී මතකයට ගත යුතු වැදගත්ම කරුණ නම් එසේ ඉවත දමන අපද්‍රව්‍ය වෙනත් අයෙකුට ඉතාමත්ම ප්‍රයෝජනවත් දෙයක් විය හැකි වීමයි. ගෘහස්ථ අපද්‍රව්‍ය කොටස් කීපයකි.

- වාණිජ අපද්‍රව්‍ය
- කාර්මික අපද්‍රව්‍ය
- සෞඛ්‍ය හා සනීපාරක්ෂක අපද්‍රව්‍ය
- කෘෂිකාර්මික අපද්‍රව්‍ය
- විද්‍යුත් අපද්‍රව්‍ය
- ඉදිකිරීම් අපද්‍රව්‍ය

වේ.

අපද්‍රව්‍ය ඝන අපද්‍රව්‍ය හා ද්‍රව අප ද්‍රව්‍ය ලෙසද වර්ග කරගත හැකි අතර, වර්ගීකරණය වඩා වැදගත් වන්නේ අපද්‍රව්‍ය කලමණාකරණය මගින් සුදුසු ව්‍යාපාරයක් හඳුනා ගැනීමටයි. මෙලෙස ඇති වන අපද්‍රව්‍ය වලට දැන් කරන්නේ

කුමක්ද යන්න වඩා සියුම් ලෙස විග්‍රහ කරගැනීම ඉතාම වැදගත්ය. ජනගහනය වැඩි වීම හා ඉඩම් කැබලි කුඩා වීම මගින් පරිසරයට හා ප්‍රජාවට මේ වන විට සිදුවන බලපෑම පිළිබඳව මෙම ලිපියෙන් විග්‍රහ නොවුවත් ඔබ සියලුම දෙනාම පාහේ මෙම තත්වය අත්විඳිමින් සිටින පිරිසක් විය හැකි බැවින් හා මේ පිළිබඳව විශේෂ අවධානය යොමුකිරීම කාලීන අවශ්‍යතාවක් මෙන්ම ආර්ථික වෘද්ධිය සඳහා ඕනෑම අයෙකුට මග ගැන්වීම සඳහා තෝරාගත හැකි ක්ෂේත්‍රයක් ලෙස ද හඳුනා ගැනීමට හැකිය.

**අපද්‍රව්‍ය කළමනාකරණය කරමින් ව්‍යාපාර හඳුනාගනිමු.**

පුද්ගලයෙක් හෝ ආයතනයක් හඳුනාගෙන බැහැර කරන අපද්‍රව්‍ය , අපද්‍රව්‍යක් ලෙස හඳුනා ගත්ත ද, තවත් පුද්ගලයෙකුගේ හෝ ආයතනයකට තවදුරටත් කිසියම් වටිනාකමක් ලබා දිය හැකිය. ඕනෑම අයෙකුට ඒවා එකතු කරගෙන ප්‍රයෝජනයට ගැනීම හෝ විකිණීම හෝ නව නිෂ්පාදනයක් සිදු කිරීම කළ හැකිය. තවත් ආකාරයට මෙය විග්‍රහ තළහොත් මෙම අපද්‍රව්‍ය සම්පතකි, අමුද්‍රව්‍යකි. අපද්‍රව්‍යවලට ආර්ථික වටිනාකමක් පවතින බව පැහැදිලිය

අපද්‍රව්‍ය කළමානකරණය හා ව්‍යාපාර ආරම්භ කිරීම හා ව්‍යාපාර කළමනාකරණය කිරීම පිළිබඳව මෙම ලිපියට ලැබෙන ප්‍රතිචාර පිලිබඳව විමසා බලා ඉදිරියේදී තවත් ලිපියක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි.

# කොවිඩ් 19 පශ්චාත් සමයට මුහුණදීම සඳහා ආදායම් සහ වියදම් කළමනාකරණය.

*කේ ,එම් ,ජී සමරසේන*

වර්තමාන ශ්‍රී ලංකාවේ බහුතර ප්‍රජාවක් මුහුණ පාන ගැටලු අතර එක් ප්‍රධාන ගැටලුවක් වන්නේ ලැබෙන ආදායම ජීවත්වීමට ප්‍රමාණවත් නොවීමයි. මෙහිදී දිළිඳු හා මධ්‍යම පාංතික ජනතාව මෙම ගැටලුවට ප්‍රබල ලෙස පාත්‍රවී සිටි. අපගේ ජීවන රටාව හා මෙම ගැටලුව බැඳී පවතී. එහෙයින් අපගේ ජීවන රටාව වෙනස් කර ගැනීම මගින් ගැටලුව සඳහා විසඳුම් ලබා ගත හැකිවේ. එනම් ලැබෙන ආදායමට අනුව වියදම් රටාව හැඩගස්වා ගැනිම සහ අමතර අදායම් මාර්ග කෙරෙහි යොමුවීමත් ය. ඒ සඳහා ආදායම් සහ වියදම් සටහන් තබා ගත යුතුයි. අනතුරුව අපගේ ආදායම් සහ වියදම් විශ්ලේෂණය කොට අභිම්වීම් හා ගිලිහීයාම් පාලනය කළ යුතුය. මෙය ආදායම් සහ වියදම් කළමනාකරණය ලෙස හැඳින්වේ. මේ පිළිබඳ ඉතා වටිනා පාඩමක් බුද්ධ දේශනාව තුළ සිගාලෝවාද සූත්‍රය මගින් බුදුන්වහන්සේ උගන්වා ඇත.

**"ඒකේනභොගේ භුඤ්ජෙයා**
**ද්වීහි කම්මංපයෝජයේ**
**චතුත්ථංච නිධාපෙයිය**
**ආපදා සුභවිස්සති"**

ඉහත ගාථා පාඨය අනුව "බුදුන් වහන්සේ දේශනා කරනු ලබන්නේ උපයන ධනය කොටස් හතරකට බෙදිය යුතු බවත්, යම්කිසි ආදායමක් තමන්ට ලැබෙන විට එම ලැබෙන ආදායම හතරෙන් එකක් වශයෙන් වෙන් කර එම කොටස භුක්ති විඳිය යුතුයි. ඉන්පසු හතරෙන් පංගු දෙකක් ආයෝජන සඳහා යෙදවිය යුතුයි. ඉතිරි හතරෙන් එක් පංගුවක් ඉතිරි කර ගත යුතුයි. ආදායම් සහ වියදම් කළමනාකරණයේ දී පහත රටාවන් විශ්ලේෂණය කොට අභිම්වීම් හා ගිලිහීයාම් පාලනය කළ යුතුය.

- ආදායම් රටාව
- පරිභෝජන රටාව/වියදම් රටාව
- නිෂ්පාදන රටාව
- අලෙවි රටාව
- ඉතුරුම් රටාව
- ආයෝජන රටාව
- ණය රටාව

ආදායම් රටාව යනුවෙන් අදහස් කරන්නේ තම පවුලේ ආදායම් මාර්ග මොනවාද ඒවා ලැබෙන්නේ කුමන කාලවකවානුවක ද ඒතුළ සිදුවන වාසි අවාසි මොනවාද යන්න විග්‍රහ කර බැලීමය.

පරිභෝජන රටාව ලෙස හඳුන්වන්නේ තම පවුලේ පරිභරණය සඳහා ලබාගන්නා භාණ්ඩ හා සේවා මොනවාද, ප්‍රමුඛත්වය ලබාදිය යුතු භාණ්ඩ හා සේවා මොනවාද, ඒවා මිලදී ගන්නේ කුමන ස්ථානයකින්ද , ණයටද අත්පිටද,

කුමන මිලකට ලබාගනීද ඒ තුළ සිදුවන බැඳීම් මොනවාද , කුමන ප්‍රමාණයකින් මිලදී ගනීද ඒවා භාවිතා කරන්නේ කෙසේද යන්නත් ඒ තුළ සිදුවන වාසි අවාසි මොනවාද යන්න විග්‍රහ කර බැලීමය.

නිෂ්පාදන රටාව යනුවෙන් අදහස් කරන්නේ තමා නිෂ්පාදනය කරන්නේ කුමන භාණ්ඩ හෝ සේවාවක් ද ඒ සඳහා ඇති මිල සහ ඉල්ලුම කුමක්ද, කුමන කාලයකදී කුමන ප්‍රමාණයකින් නිෂ්පාදනය කරයිද, නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය ලබා ගන්නේ කෙසේද කුමන පදනමකින් කුමන ප්‍රමාණයකින් කුමන මිලකට මිලදී ගනීද, ශ්‍රමය සපයා ගන්නේ කෙසේද යන්නත් ඒතුළ සිදුවන වාසි අවාසි මොනවාද යන්න විග්‍රහ කර බැලීමය.

අලෙවි රටාව යනුවෙන් අදහස් කරන්නේ නිෂ්පාදනය කරන භාණ්ඩය හෝ සේවාව කුමන මිලකට කුමන කාල වකවානුවක කුමන ප්‍රමාණයකින් කුමන පදනමකින් කුමන වෙළඳපලක් සඳහා අලෙවි කරයිද යන්නත් ඒ තුළ සිදුවන වාසි අවාසි මොනවාද යන්නත් විග්‍රහ කර බැලීමය.

ඉතුරුම් රටාව යනුවෙන් අදහස් කරන්නේ තම ආදායමින් කොටසක් කුමන අවස්ථාවක දී කුමන ප්‍රමාණයක් කුමන ස්ථානයක ඉතිරි කරයිද යන්නත් ඒ තුළ සිදුවන වාසි අවාසි මොනවාද යන්න විග්‍රහ කර බැලීමය.

ආයෝජන රටාව යනුවෙන් අදහස් කරන්නේ තම ආදායමින් කොටසක් කුමන අවස්ථාවක දී කුමන ප්‍රමාණයක් කුමන කුමන ස්ථානයක ආයෝජනය කරයි ද ඒ සඳහා ලැබෙන ප්‍රතිලාභය කුමක්ද යන්නත් ඒතුළ සිදුවන වාසි අවාසි මොනවාද යන්න විග්‍රහ කර බැලීමය.

ණය රටාව යනුවෙන් අදහස් කරන්නේ අප ණය ලබා ගන්නේ කුමන කාරණයකටද, කුමන මාර්ගයකින්ද, ඒ සඳහා ඇති බැඳීම් සහ කොන්දේසි මොනවාද, කුමන අවස්ථාවකදී කුමන ප්‍රමාණයකින් ලබා ගනීද, යන්නත් ඒ තුළ සිදුවන වාසි අවාසි මොනවාද යන්න විග්‍රහ කර බැලීමය.

අපට ඉහත රටාවන් විශ්ලේෂණය කොට බැලීමේ දී පෙනීයන්නේ අවාසි සහගත තත්ත්වයන් නම් එයින් ඇඟවෙන්නේ අපගේ මුදල් පැස තුළින් මුදල් පිටතට කාන්දු වන බවයි. එම විවර මුලින්ම වසා දැමිය යුතුයි. එලෙස විවර වසා නොදමා අපට ආධාර හෝ ණය කොපමණ පොම්ප කළත් එයින් ඵලක් නොවේ. ඉහත රටාවන් අධ්‍යයනයේ දී පහත රූප සටහන ද උපයෝගි කරගත හැකිය. (රූප සටහන Plan ආයතනයේ පුහුණු වැඩසටහනක් ඇසුරිනි)

# මුදල් ටැංකිය

## පෝසත් හා දැහැමි ආදායම්

**1.නිශ්චිත (** වැටුප්, කන්න ආදායම, වෙළඳ යනාදි ආදායම්)

**2.අහඹු** (ආධාර, ලොතරැයි දිනුම් , වෙනත් ආධාර)

**3.ආයෝජන ආදායම** (ලාභ කොටස්, ලාභාංශ)

**4.ඉතුරුම්** (ඉතිරුම් පොළී, ස්ථාවර තැන්පත් පොළී)

**5.වත්කම් විකිණීම** (දරුවන්ට ඉගෙනීම සදහා ඉඩමක් විකිනීම)

**6.අනවශ්‍ය දෑ විකිණීම** (බෝතල්, පත්තර, කාඩ්බෝඩ් වැනි දෑ)

### ජීවිතයට පෝසත්කම ගේන වියදම්

**1.අනගි වියදම්** ( ඉතුරුම්- ආදායමෙන් කොටසක් ඉතිරි කිරීම)

**2.බෝසත් වියදම්** (ජීවිතය රැකීමට අවශ්‍ය ආහාර පාන, ඇදුම් ආයිත්තම්, සෞඛ්‍ය, පාසැල් උපකරණ යනාදිය සදහා දරන වියදම්)

**3. දිව්‍ය වියදම්** (ආයෝජන-වත්කම් ගොඩනැගෙන වියදම්, අධ්‍යාපන-දේපල පරිසණාබ මිළදී ගැනීම වැනි වියදම්)

**4.ණය වියදම්** (තමාට දැරිය හැකි තරමේ ඉඩමක්, නිවසක් මිළදී ගැනීමට ණය ගැනීම වැනි වියදම්)

### පෝසත් හා දැහැමි ආයෝජන

**1.පුද්ගල වත්කම්**
අධ්‍යාපනය(විධිමත්,අවිධිමත්,නොවිධිමත් දැනුම,කුසලතා,නිපුණතා හැසිරීම්,භාවිතයන්,ආත්මවිශ්වාසය,නිරෝගිම ත්බව,පිරිසිදුකම,ස්වස්ථතාව,සතුට යනාදිය)

**2.ආදායම් උත්පාදන වත්කම්** ( ස්වයං රැකියා,ආයෝජන, රජයේ රැකියා,පෞද්ගලික අංශයේ රැකියා වැනි)

**3.මූල්‍ය වත්කම්** -ප්‍රමාණවත් ඉතුරුම් (ණය ගැනීමට ඇති හැකියාව,අවදානම් අරමුදල් සහිත වීම,ආරකෂණය සහිත වීම,විශ්‍රාම දිවිය අතර මූල්‍ය සූදානම)

**4.ස්ථාවර / භෞතික වත්කම්**
(ඉඩම,නිවස,යානවාහන වැනි)

**5.තොරතුරු-සම්බන්ධතා සදහා වූ වත්කම්**(දුරකතනය,රූපවාහිනිය,ගුවන් විදුලිය වැනි )

**6. සමාජ වත්කම්** (පවුලේ බැදීම් වැඩි කර ගැනීම ,ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වැනි )

**7.පාරිසරික වත්කම්** (ස්ව පරිසර හා පොදු පරිසර -මුදල් පසුම්බිය වැනි , අත් බෑගය කාර්යාලය ,නිවස ඇතුළ නිදනකාමරය වැනි)

### ජීවිතයට දුප්පත්කම ගේන වියදම

**1.විනාශකාර/යක්ෂ වියදම්**

(සිගරට්,අරක්කු,ගණිකා ඇසුර)

**2.නාස්තිකාර/ ප්‍රේත වියදම්**

(මා වෙනුවෙන්)(කඩචෝරුවලට ඇබ්බැහි වීම,ආහාරපාන පමණට වඩා වැඩියෙන් පරිභෝජනය කිරීම,ඇඳුම්,ආලේපන වර්ග සඳහා අධික ලෙස වියදම් කිරීම

**3. නාස්තිකාර/භූත වියදම්**

අනුන් වෙනුවෙන්) (යහලුවන් වෙනුවෙන් කෑමට බීමට වියදම් කිරීම හා අසල්වැසියන්ට අනාරක්ෂිත ලෙස ණය දීම, සමාජ සේවයට අනවශ්‍ය ලෙස වියදම් කිරීම)

**4. කුම්භාණ්ඩ වියදම්**

ඇති නැති කළ හැකි අනුව වියදම්(සූදු,ලොතරැයි,මිලදී ගැනීම, ඇබ්බැහිවීම,අනාරක්ෂිත ආයෝජනය,බාල සහ අවිශ්වාස සහගත වත්කම් මිලදී ගැනීම)

**5.ණය වියදම්**

(විවාහය ඇතුලු උත්සව සඳහා ගත් ණය , විශාල නිවාස සෑදීමට ගන්නා ණය,අත්‍යවශ්‍ය නොවන ගෘහ උපකරණ මිලදී ගැනීම)

ඉහත රූප සටහනට අනුව පෝසත් හා දැහැමි ආදායම් වර්ධනය කරගතයුතු අතර ඒ සඳහා ජීවිතයට පෝසත්කම ගේන වියදම් වැඩිකරගත යුතුය. එමගින් දැහැමි හා පෝසත් ආයෝජන වර්ධනය වේ. එය පෝසත් හා දැහැමි ආදායම් වර්ධනයට හේතු වේ. මෙහිදී පෝසත් හා දැහැමි ආදායම් අඩුවීමට බලපාන ජීවිතයට දුප්පත්කම ගේන වියදම් වළක්වා ගතයුතුය. මේ අනුව අප කටයුතු කිරීම තුළ කොවිඩ් 19 පශ්චාත් සමයට මුහුණදීමේ අභියෝගය යම් සාධනීය මට්ටමකින් ජයගත හැකිය.

# කුටුම්භයේ ආහාර සුරක්ෂිතතාව සඳහා ගෙදර වත්ත වගාකරමු.

සී. කේ. ඩබ්ලිව් අල්විස්

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අනුව, ආහාර සුරක්ෂිතතාව යනු ක්‍රියාශීලී හා නිරෝගී ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය, ආහාර අවශ්‍යතා හා ආහාර රුචිකත්වය සපුරාලිය හැකි පරිදි ප්‍රමාණවත්, සුරක්ෂිත හා පෝෂ්‍යදායී ආහාර සඳහා සියලුම පුද්ගලයින්ට සෑම කල්හිම භෞතික, සමාජීය හා ආර්ථික වශයෙන් ප්‍රවේශවීමේ හැකියාවක් පැවතීමයි. මෙම නිර්වචනය මගින් ආහාර සුරක්ෂිතතාවයට අදාළ ප්‍රධාන පැතිකඩ 4 ක් පෙන්වා දෙයි. (ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව, 2020)

ආහාරවල සුලබතාවය,

ආහාර සඳහා වූ ප්‍රවේශය,

ආහාර උපයෝජනය

ආහාර ස්ථායිතාවය,

එම පැතිකඩ හතරයි.

ඒ අනුව ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සංකල්පය ආහාර නිෂ්පාදනය සහ ප්‍රමාණවත් ආහාර සැපයුමක් සහතික කිරීම යන මූලික තත්ත්වය අභිබවා ගිය පුළුල් සංකල්පයකි. ආහාර සුරක්ෂිතතාවයේ ප්‍රධාන පැතිකඩවලට අදාළ සාධක වන ආහාර නිෂ්පාදනය, බෙදා හැරීම හා ගබඩා කිරීම, ප්‍රමාණවත් පෝෂණය, ආර්ථික හා සමාජීය වශයෙන් ආහාර සඳහා ඇති ප්‍රවේශය, ආහාර රුචිකත්වය හා පුද්ගලයින්ගේ ආහාර පරිභෝජනය වැඩි දියුණු කරන පිරිසිදු ජලය, සනීපාරක්ෂාව සහ අනෙකුත් සෞඛ්‍ය සේවා පහසුකම් යනාදී ආහාර නොවන අංග මෙන්ම වසංගත, යුද්ධය හෝ ඍතු විපර්යාස, චක්‍රීය හෝ අනපේක්ෂිත සිදුවීම් වැනි කම්පන අවස්ථාවලදී පවා අඛණ්ඩව ප්‍රමාණවත් පරිදි ආහාර සුලබතාවක් පවත්වා ගැනීම වැනි කරුණු ද ආහාර සුරක්ෂිතතාවට අයත් වේ.

ලෝක ආහාර සංවිධානයට අනුව නිරන්තරව බඩගින්නට ගොදුරුවන ළමුන් මන්දපෝෂණයට ලක්වේ. ආහාර අනාරක්ෂිතභාවයේ කෙටි කාලීන ප්‍රතිඵලය කුසගින්න වන නමුත්, දීර්ඝකාලීනව පවතින ආහාර අනාරක්ෂිතතාවය තුළින් අඩු බර, වයසට සරිලන උස නොතිබීම, කෘෂ බව හා ක්ෂුද්‍ර පෝෂණ ඌණතා වැනි මන්දපෝෂණය ආශ්‍රිත ගැටලු ඇති කරයි. ආහාර අනාරක්ෂිතතාවයේ උග්‍ර අවස්ථාවේ දී මරණය පවා ඇතිවිය හැකිය. මන්ද පෝෂණය ළමුන්ට මෙන්ම කාන්තාවන්ටද (විශේෂයෙන් ගර්භනී හා කිරිදෙන මව්වරුන්ට) අතිශයින් අහිතකර තත්ත්වයකි. මන්දපෝෂණය නිසා කාන්තාවන් නිතර ලෙඩ රෝගවලට ගොදුරු වන අතර, ලෙඩ රෝගවලට ඔරොත්තු දීම සඳහා අවශ්‍ය ප්‍රතිශක්තීකරණය අතින්ද ඔවුන් දුර්වල කරයි. මන්දපෝෂණයෙන් පෙළෙන මව්වරු අඩු බරෙන් යුත් දුර්වල ළදරුවන් බිහි කරයි. මේ තත්ත්වය ඔවුනට පමණක් නොව මුළු මහත් සමාජයටම ගැටලුකාරීය.

ආහාර අනාරක්ෂිතභාවය හේතුවෙන් ඇතිවන අහිතකර ආහාර පුරුදු ( උදාහරණයක් ලෙස කාබෝහයිඩ්රේට් බහුල ආහාර අධික ලෙස පරිභෝජනය) නිසා ස්ථුලතාවය මෙන්ම දියවැඩියාව, අධික රුධිර පීඩනය වැනි බෝ නොවන රෝග ඇතිවිය හැකිය. සාමාන්‍යයෙන් දිගුකල් පවතින ආහාර අනාරක්ෂිතභාවය තුළින් ළමුන් වැඩි වශයෙන් බලපෑමට ලක්වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අධ්‍යාපනය තුළින් ඔවුන් ඇති කර ගන්නා ප්‍රතිඵල අඩුවීමටත්, එය වැඩිහිටි වියේ දී ඔවුන්ගේ ආර්ථික අවස්ථා සීමාවීමටත් බලපෑ හැකිය. එම නිසා ආහාර හිඟය නිසා ඇතිවන

මන්දපෝෂණ තත්ත්වය අප කාගේත් අවධානයට ලක්විය යුතු කාරණයකි. තිරසර සංවර්ධන ඉලක්කවලට සමගාමීව ශ්‍රී ලංකාවේ සාගින්න හා දරිද්‍රතාව අවම කිරීම සඳහා ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම ඉතා වැදගත් වන අතර, එය මහජනතාවගේ පොදු යහපැවැත්ම සහ ශ්‍රම බලකායේ ඵලදායීතාව වැඩි දියුණු කිරීමට සහ දිගුකාලීනව පවතින සෞඛ්‍ය හා පෝෂණ ගැටලු අවම කිරීමට ඉවහල් වනු ඇත.

ශ්‍රී ලංකාවේ දුප්පත් ජනතාව, සංඛ්‍යාත්මකවත් මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ගත්තත් ඉතා අඩු පිරිසකි. ඔවුන් සාගින්නේ සිටීමට තරම් දුප්පත් නැත. එහෙත් කොරෝනා වසංගත තත්ත්වය හමුවේ 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දිළිඳු ජනගහනය ඉහළ ගොස් ඇත. පසුගිය දශක කිහිපය තුළ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇතත් කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය සමග ජාතික මට්ටමෙන් මෙන්ම ගෘහස්ථ මට්ටමෙන් ද ආහාර අනාරක්ෂිතතාව ඉහළ ගොස් ඇත. කොවිඩ් 19 වසංගතය සමඟ ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදු වූ ආර්ථික පසුබෑම හේතුවෙන් පුද්ගලයින්ගේ ජීවනෝපාය මාර්ග අහිමිවීමෙන්, විශේෂ යෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන ප්‍රජාවට පෝෂ්‍යදායී ආහාර වේලක් සඳහා ඇති ප්‍රවේශය සීමා විය. කොවිඩ් උවදුර තවමත් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින බැවින් ඉදිරිකාල පරිච්ඡේදය තුළ ආහාර අනාරක්ෂිතතාව තවදුරටත් වර්ධනයවීමේ අවදානමක් පවතී. රට හමුවේ ඇති බැරෑරුම්කාරී තත්ත්වය අවබෝධ කරගෙන ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම රජයේ වගකීමක් පමණක් බවට ලඝු නොකර තම කුටුම්භයේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම පිළිබඳ තමාට ඇති වගකීම ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් අවබෝධ කරගත යුතුය.

ශ්‍රී ලාංකීය ජනතාව හා කෘෂිකර්මය අතර ඇත්තේ ගසට පොත්තක් මෙන් වෙන් කළ නොහැකි ආකාරයේ බැඳීමකි. අතීතයේදී බොහෝ ආහාර ද්‍රව්‍ය තම පරිසරයෙන්ම සපයා ගැනීමට අපේ පැරැන්නෝ කටයුතු කළහ. එනමුත් වර්තමානයේ එම ආහාර සංස්කෘතිය වෙනසකට ලක්ව ඇත. පාළුවට ගොස් ඇති නිවෙස් වටපිටාවක් ගැන අපට නිතර අසන්නට දකින්නට ඇත. එවැනි පාලුවට පත්ව ඇති ගෙවතු අතිශය ප්‍රයෝජනවත් ගොවිබිම් බවට පත්කර ගැනීමේ හැකියාව ඇති බව ලාංකික අපගේ විශ්වාසය වන්නේය. එබැවින් ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ එක් පැතිකඩක් වන ආහාර සුලබතාව ඇති කිරීම සඳහා ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට ගෙවත්ත වගා කිරීම කළ යුතුව ඇත. එය කුටුම්භයේ ආහාර සුරක්ෂිතතාව සහතික කරන අතර, ජාතික මට්ටමින් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමට දායකත්වය ලබාදීමකි.

එසේ නම් තමා පදිංචි නිවස අවට භූමියෙන් නැතිනම් ගෙවත්තෙන් පවුලේ එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා, සීමිත/පවතින සම්පත් උපයෝගී කර ගනිමින් පලාවර්ග, එළවළු, පලතුරු, අල වර්ග ඇතුළත් භෝග වගා කිරීම හෙවත්, ගෙවතු වගා කිරීම මගින් ගෙදර වත්ත සංවර්ධනය කිරීම කෙරෙහි කාගේත් අවධානය යොමු විය යුතුය. ශ්‍රී ලාංකික ප්‍රජාවගෙන් වැඩි දෙනෙකුට කුඩා ගෙවත්තක් හෝ උරුම වී ඇත. තම ගෘහය අවට පරිසරය තුළ ප්‍රයෝජනවත් භෝග වගා කිරීම ශ්‍රී ලාංකීය ජන සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණයකි. ගෙවත්තේ වගාව පිළිබඳ අතීතයේ පැවති හුරුව නැවත ඇති කර ගැනීමට කාලය පැමිණ ඇත. කොරෝනා වසංගතය නිසා ඇතිවී තිබෙන ආර්ථික පසුබෑම හේතුවෙන් විශාල පිරිසක් රැකියා අහිමිව අසරණභාවයට පත්ව ඇත. ආහාර සුරක්ෂිතතාවයේ එක් ප්‍රධාන පැතිකඩක් වන, ආහාර සඳහා වන ප්‍රවේශවීමේ හැකියාව හෙවත් පෝෂ්‍යදායී, සුදුසු ආහාර ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් සම්පත් තිබීම, අභියෝගයට ලක්වී ඇති වටපිටාවක සාගින්නට පිළියමක් ලෙස ගෙවත්ත වගාකර ආර්ථික වශයෙන් ඵලදායී සුවදායක පරිසරයක් නිර්මාණය කර ගැනීමට කටයුතු කළ යුතුය.

ගෙවත්තේ වගාව තුළින් කුටුම්භයකට ලැබිය හැකි වාසි ප්‍රයෝජන රැසකි. වස විසෙන් තොර, නැවුම් සමබල ආහාර මගින් කුටුම්භයේ සාමාජිකයින්ගේ පෝෂණ ගැටලු නිරාකරණය වන අතර සෞඛ්‍ය සම්පන්න බව ඇති කරයි. විවිධත්වයෙන් යුත් පෝෂ්‍යදායී ආහාර පරිභෝජනයත්, වගා කටයුතුවල නියැළීම ශාරීරික ව්‍යායාමයක් වන නිසාත් කුටුම්භ සාමාජිකයින් බෝ නොවන රෝගවලට ගොදුරුවීම අවම කරයි. ගෘහයේ සාමාජිකයින්ගේ විවේකය ඵලදායී ලෙස යොදා ගැනීමටත් භූමියෙන් උපරිම ප්‍රයෝජන ගැනීමටත් ගෙදර වගාව ඉවහල් වේ. නිවසෙන් බැහැර කරන අපද්‍රව්‍ය පොහොර ලෙස යොදාගත හැකි බැවින් ගෙවත්තේ පස සාරවත් වෙයි. එමගින් ගෙවත්ත පිරිසිදු කරන අතර නිවස අවට අලංකාර පරිසරයක් නිර්මාණය කරයි. නිවැසියන්ගේ වෙළඳපොළ සඳහා ගතවන කාලය අවම කරනවා පමණක් නොව ඔවුනට ආර්ථික වාසි ළඟාකර දෙයි. ගෙවත්තේ භෝග වෙළෙපොලෙන් මිලදී ගැනීම අවශ්‍ය නොවන නිසාත් අතිරික්ත භෝග අලෙවි කළහැකි නිසාත් එලෙස ආර්ථික වාසි ගෙනදෙයි. වගාවට යොමු වන්නන්ගේ කෘෂි කාර්මික දැනුම පුළුල්වීම තවත් වාසියකි. පරිසර සම්පත් කළමනාකරණය කිරීමේ ප්‍රායෝගික හැකියාව වැඩි දියුණු වන අතර එම දැනුම පරපුරෙන් පරපුරට දායාද කිරීමෙන් ගෙවතු ආශ්‍රිත කෘෂි කර්මාන්තය අඛණ්ඩව පවත්වා ගැනීමට ඉවහල් වේ.

“ ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක් ”යන සංකල්පය පවතින රජයේ රට හදන සෞභාග්‍යයේ දැක්මෙහි ප්‍රමුඛ සංකල්පයකි. කාබනික එළවළු හා පලතුරු ඇතුළු භෝග පරිභෝජනය ගෘහ මට්ටමින් නිෂ්පාදනය කිරීම සඳහා ගෙවත්ත වගා කිරීම, එකී සංකල්පය යථාර්ථයක් කර ගැනීමට ඉවහල්වනු ඇත. ආහාර සුරක්ෂිතතාව බිඳ වැටීම කුසගින්න හා මන්ද පෝෂණයට එහා ගිය ගැටුම් ඇතිවීමට පවා හේතු විය හැකි කරුණක් බැවින් ලාංකික පුරවැසියන් වශයෙන් වගකීමෙන් කටයුතු කළ යුත්තේමය. මිනිසාගේ මූලික අවශ්‍යතා අතරින් වැදගත්ම අවශ්‍යතාව ආහාරපාන වන බැවින් “ආහාර සුරක්ෂිතතාව සැමදෙනාගේ යුතුකමක්” කර ගනිමු.

# වසංගතයට සැලෙන ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායන්.

ඒ. එම්. එස්. අතපත්තු

මේ පිළිබඳ මාගේ විග්‍රහය ඉදිරිපත් කිරීමට පෙර "ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය (Micro entrepreneur -ME)"යන්නෙන් ශ්‍රී ලාංකික සංවර්ධන පර්යාලෝකය තුළ විග්‍රහවන ආකාරය හා ඒ ආශ්‍රයෙන් මාගේ අර්ථකථනය පිළිබඳ ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි

**ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය යනු කුමක්ද ?.**

ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායන් පිළිබඳ අර්ථ නිරූපණය ආයතනයෙන් ආයතනයට, කාලයෙන් කාලයට, නිෂ්පාදනයෙන් නිෂ්පාදනයට සහ රටින් රටට වෙනස් වනමුත් ඒ සඳහා ප්‍රධාන වශයෙන් සේවක සංඛ්‍යාව, වාර්ෂික පිරිවැටුම, ශේෂ පත්‍ර එකතුව, ආයෝජන මුදල, වැනි ප්‍රමාණාත්මක නිර්ණායක හා අයිතිය, ස්වාධීනත්වය හා මෙහෙයවීම වැනි ගුණාත්මක නිර්ණායකද භාවිතකර ඇත. සේවක සංඛ්‍යාව 10 දෙනෙකුට අඩු, මාසික පිරිවැටුම රුපියල් මිලියන 15 ට අඩු සහ ආයෝජන මුදල රුපියල් මිලියන 15 ට අඩු ව්‍යාපාර ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය ලෙස අර්ථනිරූපණය කර ඇත (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - 2015).

මෙහිදී අවධානයට ලක් කරන ව්‍යවසායන් තුළ, පුද්ගල හෝ පවුලේ ශ්‍රමය මත පදනම්ව තමන්ගේ ම අයිතිය හා ස්වාධීන පාලනයක් පවත්වාගෙන යන ස්වයං රැකියා ව්‍යාපාරවල (Self Employment Business) දක්නට ලැබෙන ලක්ෂණ ද ගෘහස්ථව (Home Base) පවුලේ මව හා පියාගේ දායකත්වය (Mom and Papa Business) හා පාලනය යටතේ ක්‍රියාත්මකවන හෙයින් මේවා තුළ ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය (Micro entrepreneur) ලක්ෂණ ද විද්‍යාමාන වන හෙයින් කතුවරයා විසින් මේවා ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායන් ලෙස අර්ථ නිරූපණය කරනු ලබයි.

ඒ අනුව, ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය පවුලේ ආදායම් වර්ධනයට, ඌන සේවා හෝ සේවා වියුක්ති ගැටලුවට, ගෘහස්ථය සතුව හෝ ආසන්නයෙන් පහසුවෙන් සපයාගත හැකි සම්පත් උපයෝජනයට, පවුලේ පරිභෝජන අවශ්‍යතා ඉටුකර ගැනීමට, පවුලේ තෘප්තිය වර්ධනයට, නිවසේ ආකර්ෂණීය බව හා සුවදායක බව වර්ධනයට, පවුලේ සමගිය සහ සමාජ පිළිගැනීමට හේතු වනබව මාගේ ක්ෂේත්‍ර අධ්‍යන තුළින් තහවුරු විය.

"ජනසවිය" දිළිඳුකම තුරන්කිරීමේ අරමුණෙන් 1989 වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රථම දුගී-හිතවාදී (Pro-poor) වැඩසටහනයි. මෙම වැඩසටහන තුළින් දිළිඳු පවුල් සඳහා අවුරුදු දෙකක 2 උපරිම කාලයකට යටත්ව රුපියල් 2500 ක සහනාධාරයක් ලබාදුන් අතර, එයින් 1042 ක මුදලක් ලංකා බැංකුවේ තැන්පත් කරන ලදී. අවුරුදු දෙකකට පසුව එම මුදල ඇපයක් ලෙස තබාගෙන ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායන් ආරම්භ කිරීම සඳහා රුපියල් 25000 ක උපරිමයකට යටත්ව ණය මුදල් ලබා ගැනීමේ අවස්ථා සලසා දෙන ලදී. ඊට අමතරව 80 දශකයේ දිස්ත්‍රික් මට්ටමින් ක්රියාත්මක වූ "ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන(IRDP)" තුළින් ද ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය නඟා සිටුවීම සඳහා විශාල මෙහෙවරක් සිදු කරන ලදී. 1995 වර්ෂයේදී ආරම්භ කරන ලද සමෘද්ධි ව්‍යාපාරය තුළ ප්‍රධාන ප්‍රවේශයක් ලෙස "බැංකු මූල්‍ය ප්‍රවේශය" හා "ජීවනෝපාය සංවර්ධන අංශය" වැනි ප්‍රමුඛ ව්‍යුහයන් මගින් ව්‍යවසාය සංවර්ධනය සඳහා දැඩි ප්‍රයත්නයක් දරන ලදි. ඒ අනුව, 1978 වර්ෂයෙන් පසු බලයට පැමිණි සෑම රජයක් විසින්ම ග්‍රාමීය අඩු ආදායම්ලාභීන් කේන්ද්‍ර කරගත් ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා ඉතා යහපත් අරමුණු, පරමාර්ථ වලින් සමන්විත ආකර්ෂණීය වැඩසටහන් ආරම්භ කර ඇත.

ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායයන්ගේ විභවතාවක් නොමැති වුවත්, දිළිඳුකම අවම කිරීම, සේවා නියුක්තිය, ආදායම් විෂමතාවය අවම කිරීම, දේශීය පාරිභෝජන අවශ්‍යතා සපුරාලීම, විභවතාවක් ඇති ග්‍රාමීය සම්පත් උපයෝජනය වැනි ප්‍රාදේශීය සංවර්ධනයට ඉලක්ක වූ අරමුණු සඳහා මේ තුළින් විසඳුම් ගෙන ඒමට හැකියාව ලැබී ඇත. ඊට අමතරව ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම තුළින් ආහාර, නිවාස, සෞඛ්‍යය, අධ්‍යාපනය, සනීපාරක්ෂාව සහ සන්නිවේදනය වැනි මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහාද මේවායෙහි ආර්ථික බලපෑම හේතුවී ඇත. එසේම නිවසේ සාමාජිකයින් එක් අරමුණක් වෙනුවෙන් වැඩකිරීම තුළින් පවුලේ සමගිය, සහජීවනය, සැලසුම්කරණය හැකියාව, අභිමානය, දනුවත් බව, වගකීම සහිත බව, හා සජීවිකරණය වැනි සමාජ බලපෑම් ද ඇතිවිය. මේ අනුව පවුල මූලික කරගත් ක්ෂුද්‍ර සංවර්ධනයක් මෙන්ම, සාර්ව මට්ටමේ සමාජ ආර්ථික බලපෑම් සමූහයක් ද මේ තුළින් ජනිතව ඇත.


ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර, කුඩා, මධ්‍යම හා විශාල පරිමාණ ව්‍යවසාය වශයෙන් කොටස් හතරක් හඳුනාගෙන ඇත. ඉහත කාණ්ඩ හතරට ගැනෙන මුළු ව්‍යවසායන් ගණන 1,019,681 ක් වන අතර, ඒවායින් 935,735 ක් ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායන් වේ. සමස්ථ ව්‍යවසායන් තුළ 3,003,119 දෙනෙකු සේවා නියුක්තවී සිටින අතර, එයින් 935,736 දෙනෙකු මෙම ව්‍යවසායන් ආශ්‍රිතව සේවා නියුක්තවී සිටිති. නමුත් ලියාපදිංචි ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායන් සංඛ්‍යාව 910,912 ක් වන අතර, තනි අයිතිය ඇති මෙම ව්‍යවසායන්ගෙන් 45% කට වැඩි ප්‍රමාණයක් ලියා පදිංචිකර නොමැති එහෙයින් ඒවා සඳහා බදු ගෙවීමක් හෝ ගාස්තු ගෙවීමක් සිදු නොකරති. මෙම ව්‍යවසායන්ගෙන් 25% ක් කාන්තා ව්‍යවසායකයින් විසින් මෙහෙයවීම මෙහි සුවිශේෂ තත්ත්වයකි. (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - 2015).

ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය ලියාපදිංචි කිරීම තුළින් ඒ සඳහා නීතියානුකූල වටිනාකමක් හිමි වන අතර, ණය ගැනීමේදී හා නිෂ්පාදන අලෙවි කිරීමේදී නිෂ්පාදකයාට විශේෂ වාසි හිමිවන බව අවබෝධ කර ගෙන නැත. එසේ ම බොහෝ ව්‍යවසායන් පවුලේ ශ්‍රම දායකත්වය මත ක්‍රියාත්මක වන හෙයින්, පවුල තුළ ඇතිවන අඬදබර, වෙන්වීම්, සහ වෙනත් රැකියා සඳහා පිටත්වීම ආදීය නිෂ්පාදනයට සෘජුවම බලපෑම් කරනු ලබයි. රෝගාතුරවීම, මරණයට පත්වීම, විවාහ කටයුතු, දානමය කටයුතු හා වැඩිවියට පත්වීමේ සැමරුම් උත්සව ආදිය නිසා ව්‍යාපාර බිඳවැටෙන අවස්ථා බහුල වන අතර, මෙවැනි අවස්ථාවල ව්‍යවසාය කඩාවැටීම මගහැරවීම සඳහා රජයේ හෝ වෙනත් ආයතනවල මැදිහත්වීම අවම මට්ටමක පවතී. ව්‍යවසායන් ආරම්භ කිරීම සඳහා රජය විසින් මැදිහත්වීම් සිදු කරනු ලැබුවත්, COVID-19 ව්‍යසනය හමුවේ බිඳවැටෙන ව්‍යවසායන් සුරකීමේ ආරක්ෂණ ජාල (Security Network) වැඩසටහනක් මේ වනතෙක් ක්‍රියාත්මකව නැත.

ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායන් අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථික වර්ධනය සමග සෘජු ලෙස සම්බන්ධ වුවත්, ඒවා නගාසිටුවීමේ රාජ්‍ය යාන්ත්‍රණය දුර්වල මට්ටමක පවතියි. 2020 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ රටේ සමස්ත ජන ජීවිතයට COVID-19 වසංගත තත්වය අති දැවන්ත බලපෑම් එල්ලකර ඇත. මෙම වසංගත තත්ත්වය හේතුවෙන් ඇමෙරිකාව වැනි ශක්තිමත් රාජ්‍යවල පවා ව්‍යාපාර නැවත පණගැන්වීමට නොහැකි තත්ත්වයට පත්වී ඇති බවත්, ඒවායේ ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයක් (Cash Flow) නොතිබීම හේතුවෙන් නැවත එම ව්‍යාපාර ගොඩනැගීම සඳහා රාජ්‍ය කාර්යභාරය ඉහළ බවත් සඳහන් වේ (samartino Danial, 2021). ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායවල තත්ත්වය මීට වඩා අති භයානක බව අපි දන්නා කරුණකි. ව්‍යවසාය සතුව ශක්තිමත් මූල්‍ය ප්‍රවාහයක් හෝ වෙනත් ප්‍රාග්ධන සැපයුම් මාර්ගයක් නොතිබීම, වසංගතය පිළබඳ ප්‍රජාවගේ බිය, රජය විසින් පනවා ඇති නිරෝධායන නීතිරීති හා සංචාර සීමා, අලෙවි ගැටලු, සම්පත් හා අමුද්‍රව්‍ය සැපයීමේ අසීරුතා සහ ව්‍යවසායකයින්ගේ අවිනිශ්චිත දැක්ම ආදි ගැටලු අපටම අනන්‍ය වූ ඒවා වේ.

ක්ෂුද්‍ර පරිමාණ නිෂ්පාදන සඳහා පූර්ණ තරගකාරී වෙළෙඳපළක් ලංකාව තුළ නිර්මාණය වී නැති හෙයින්, හා ඒවා සඳහා ආරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන හෙයින්, තරගකාරී මිල තීරණය කිරීමට හෝ වෙළෙඳපළ තුළ බලයක් ගොඩනගා ගැනීමට මොවුන්ට ශක්තියක් නැත. එහෙයින් මෙම කඩාවැටීම නිෂ්පාදන සැපයුමට මෙන්ම ඉල්ලුමටද හානි පමුණුවා ඇත. මෙම ව්‍යවසායන් තුළින් බිහිවන නිෂ්පාදනවල පාරිභෝගිකයින් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන, හා තරගකාරගකාරී මිල ගණන් යටතේ භාණ්ඩ සඳහා ඉල්ලුම් කිරීමට ක්‍රයශක්තියක් නොමැති, දෛනික ආදායම් මාර්ගවල නිරත, පහළ ආදායම් කාණ්ඩයට අයත් වන පිරිසක් වන හෙයින් ඉල්ලුමද අඩුවී ඇත. මෙම තත්ත්වය ඉල්ලුම් හෝ සැපයුම් ප්‍රමාණයේ අඩුවීමක් නොව ඉල්ලුම හා සැපයුමේ අඩුවීමක් වන හෙයින්, පාරිභෝගිකයා ඉල්ලන මිල නිෂ්පාදකයාට සැපයීමට හෝ නිෂ්පාදකයා තීරණය කරන මිල පාරිභෝගිකයාට ගෙවීමට නොහැකිවීම මෙම කර්මාන්තය බිඳ වැටීමට හේතුවී ඇත.

COVID-19 ව්‍යසනය ක්ෂුද්‍ර පරිමාණ
ව්‍යවසාය කෙරෙහි බලපෑම




COVID-19 වසංගතයට පෙර සැපයුම් වක්‍රය S2 ද ඉල්ලුම් වක්‍රය D2 ද වන අතර එහිදී සමතුළිත ප්‍රමාණය Q2 හා සමතුළිත මිල P2 ද වේ වසංගත බලපෑමෙන් පසු .සැපයුම් වක්‍රය S1 ද ඉල්ලුම් වක්‍රය D1 ද වන අතර සමතුළිත ප්‍රමාණය Q1 දක්වා අඩුවී ඇති අතර සමතුළිත මිල P1 දක්වා වැඩිවී ඇතඒ අනුව මෙම . සනාථ වෙළෙඳපොළ සංකෝචනයවී ඇති බව .වේ

COVID-19 වසන්ගත තත්ත්වය තුළ වෙනත් ආදායම් මාර්ග ඇහිරීම හා ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය ආදායම් ඉපයීම ඇනහිටීමත් සමඟ තමන් සතු වත්කම් පාරිභෝජනය සඳහා යෙදවීම හේතුවෙන් කර්මාන්තය තුළ ඇති ප්‍රාග්ධනය හීනවී ඇත. එවිට ආයෝජනය අඩුවී නිෂ්පාදන ධාරිතාව අඩුවීම හේතුවෙන් කර්මාන්තයෙන් තාවකාලික හෝ ස්ථිරව ඉවත්වීමට ඉඩ ඇත. වෙළෙඳපොළ සංකෝචනයවීම හේතුවෙන් මෙම භාණ්ඩ සඳහා පැවැති වෙළෙඳපොළ පංගුව විශාල කර්මාන්ත කරුවන් හිමිකරගනු ඇත. ඒ අනුව අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථිකය බිඳවැටීම දිළිඳුකම ඉහළ යාමට හේතුවනු ඇත.

මෙම වසංගත තත්ත්වය මත රජය මගින් ක්‍රියාත්මක වසා තැබීම, සංචාරණ සීමා හා නිරෝධායන නීතිරීති හේතුවෙන් ව්‍යවසායවල නිෂ්පාදන හා අලෙවි ධාරිතාව පහළ ගොස් ඇත. පාරිභෝගික ආදායම සහ ක්‍රයශක්තිය අඩුවීම ඉල්ලුම පහළයාමට හේතු වූ බැවින් ව්‍යවසායන් අඩපණවී ඇත. ආදායම අහිමිවීම මත ව්‍යාපාරයේ ආයෝජනය කළ යුතුව තිබූ ප්‍රාග්ධනය පරිභෝජනය සඳහා වැය කර ඇති අතර, ලබාගත් ණය සඳහා වාරික හා පොලී මුදල් ගෙවීම කල්පසුවී ඇත. එසේම උකස් භාණ්ඩ වෙනුවෙන් ආපසු මුදල් ගෙවීම ප්‍රමාදවී ඇති හෙයින් එම භාණ්ඩ සින්නවීමේ ගැටලු පැනනැගී ඇත. ජලය විදුලිය දුරකථන හා වෙනත් ගිවිසුම්ගත සේවා වෙනුවෙන් ගෙවීම් කළ යුතුව ඇත. අලුත් වෙළෙඳපොළ සම්බන්ධතා හා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටලු පවතින හෙයින් ව්‍යාපාර කඩා වැටෙමින් පවතී. මෙම සමාජ ආර්ථික බලපෑම සමස්ත ජන ජීවිතය බිඳ වැටීමට හා ග්‍රාමීය දරිද්‍රතාවය වර්ධනය වීමට හේතු වී ඇත

මෙම තත්වය සමනය කිරීම සඳහා ප්‍රබල මැදිහත්වීමක් අවශය වන අතර, ඒ සඳහා පහත ක්‍රමෝපාය සුදුසු යැයි යෝජනා කරමි.

**01. බලපෑමට හසු වූ ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය හඳුනාගැනීම.**

ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායන් ගේ භූගෝලීය විසිරීම සැලකිල්ලට ගෙන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ක්ෂේත්‍රයට අනුයුක්ත කර ඇති, මෙම විෂයට වඩාත් සමගාමී රාජකාරි කටයුතුවල නිරත නිලධාරීන් මඟින් අවාසිදායක තත්ත්වයට පත්වූ සාමාජිකයින් හා අවාසිය තක්සේරු කිරීම හා වර්ගීකරණය කිරීම.

**02. මූල්‍යකරණ සහාය.**

ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායවල දුර්වල මූල්‍ය ප්‍රවාහයක් පැවතීම හා සංචිත මුදලක් නොතිබීම හේතුවෙන් ආයෝජනයට විවිධ බාධා පැන නැගී ඇති හෙයින්, මෙය සමනය කිරීම සඳහා අඩු පොලී අනුපාත යටතේ පිරිවැටුම මත පදනම්ව “අනාරක්ෂිත වාණිජ ණය (Unsecured commercial lending)” ලබාදීම යෝග්‍ය වේ. මෙහිදී ණය තොරතුරු කාර්යාංශයේ (Credit Information Bureau - CRIB ) හෝ වෙනත් ක්ෂුද්‍ර මූල්‍යකරණ රාජ්‍ය ව්‍යුහයේ හිඟ ණය පිළිබඳ විශ්ලේෂණය ලිහිල්කර වාණිජ බැංකු හා සමෘද්ධි වැනි බැංකු තුළින් ණය නිකුත් කළ යුතුවේ. එහිදී හිඟ ණය සඳහා පොලිය හා වාරික මුදල් වෙනුවෙන් සහන කාලයක් ලබාදිය යුතුය

03. **බදු සහන.**

කුඩා පරිමාණ ව්‍යවසායකයින් හට දැනට පවතින ආදායම් බදු හා වැට් බදු ප්‍රතිපත්තිය තුළින් අහිතකර බලපෑම් සිදුවන්නේ නම්, බලපෑමට හසුවන ව්‍යවසායකයින් සඳහා බදු නිදහස් කිරීම හා සහන කාල ලබාදීමට පියවර ගත යුතුය. මෙහිදී විදුලිය ජලය දුරකතන වැනි ව්‍යවසාය යටිතල පහසුකම් සඳහා ද සහන ලබාදිය යුතුය.

**04. වැටුප් සහනාධාර.**

ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායගේ සේවා නියුක්තිකයන් වෙනුවෙන් වැටුප් ගෙවීම සඳහා රජය මඟින් සහනාධාර ක්‍රම හඳුන්වා දිය යුතු අතර, සේවකයින් සඳහා සේවක අර්ථසාධක අරමුදල (Employment provident Fund – EPF) හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (Employment Trust Fund – ETF) වෙත දායක මුදල් ගෙවීමට සහන කාලයක් දිය යුතුය.

05. **කුලී හා ගිවිසුම්ගත ගෙවීම් සඳහා සහායවීම.**

කාර්යාල, ගබඩා, කර්මාන්තශාලා හා අලෙවි කටයුතු වෙනුවෙන් කුලී පදනම හෝ බදු පදනම මත ලබා ගෙන ඇති වත්කම් සඳහා මාසිකව සිදු කළයුතු ගෙවීම් හා උකස් සඳහා ආපසු ගෙවීම්, වැනි ගිවිසුම් ගත ගනුදෙනු සඳහා මුදල් ගෙවීම සඳහා සහන කාලයක් ලබාදීම.

**06. මානව සම්පත් සංවර්ධනය හා උපදේශකත්වය සැපයීම.**

ව්‍යාපාරික කළමනාකරණ ක්‍රම සහ නව තාක්ෂණික ක්‍රම ගැලපීම පිළිබඳ ව්‍යවසායකයින්ගේ ධාරිතාව පුළුල් කිරීම, උපදේශන සේවා සැපයීම හා පවතින ගැටලු නිවාරණය සඳහා අඛණ්ඩ සජීවීකරණ ක්‍රියාවලියක් ආරම්භ කිරීම.

**සාරාංශය.**

ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ගැටලු විසඳීමේ ක්‍රමෝපායක් ලෙස ග්‍රාමීය හා අඩු ආදායම්ලාභී මුල් කරගෙන ක්‍රියාත්මක කරනු ලබන ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය සංවර්ධනය භාවිත කරන හෙයින්, ඒ පිළිබඳව විග්‍රහ කිරීම සඳහා යම් යම් නිර්ණායක මත පදනම්ව අර්ථකථනයක් ඉදිරිපත් කිරීමටත් උත්සාහ කරන ලදි. covid-19 වසංගත තත්වය

හේතුවෙන් මෙම විෂයෙහි සිදුවන බිඳවැටීම ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වයට සිදුවන බලපෑම දරිද්‍රතාවට හේතුවන බැවින් මෙකී ව්‍යවසායන් ප්‍රකෘතිමත් කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග මෙම ලිපිය තුළින් විග්‍රහ කිරීමට උත්සාහ ගන්නා ලදී.

# සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරිකයන් ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය.

ඩබ්ලිව්. එච්. සිරිසේන

මෙරටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා විශාල දායකත්වයක් කර්මාන්ත අංශය මගින් සපයනු ලැබේ. කර්මාන්ත අංශය, අංශ කිහිපයකින් සමන්විත වන අතර, මහා පරිමාණ, මධ්‍ය පරිමාණ, කුඩා පරිමාණ යන අංශය




මෙන්ම සුළු පරිමාණ වශයෙන් සිදු කරනු ලබන ස්වයං රැකියාවලින් ද සමන්විත පුළුල්ව පැතිරුණු ශක්තිමත් ආර්ථික අංශයකි. මෙම තොරතුරු විවරණය මගින් උත්සාහ ගනු ලබන්නේ ජාතික ආර්ථිකයට සැළකිය යුතු මෙහෙවරක් ඉටුකරන, එමෙන්ම සුළු පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයට අයත් වන සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාර පිළිබඳව දැනුවත් බව ඉහල නැංවීමය. සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාර ප්‍රධාන වශයෙන් ගෘහය මූලික කොට සිදුවන කර්මාන්ත විශේෂයක් බවට පත්ව ඇත. බොහෝ විට මෙවැනි ව්‍යාපාර තුළින් පවුලේ සාමාජිකයින් අපේක්ෂා කරන්නේ පවුලේ ජීවනෝපාය මාර්ගයක් ගොඩනගා ගෙන එය ශක්තිමත් කර ගැනීමය. මේ ආකාරයේ පවුල කේන්ද්‍ර කර ගත් ආර්ථික ක්‍රියාකාරකම් ග්‍රාමීය ප්‍රදේශවල මෙන්ම නාගරික ප්‍රදේශවල ද බහුලව ක්‍රියාත්මක වේ. මේ නිසාම මෙරටේ ඇතැම් ප්‍රදේශ මෙම නිමවුම් කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් අත්කරගෙන ඇත. මහරගම පමුණුව ප්‍රදේශය ද නිමි ඇඳුම් නිෂ්පාදන කර්මාන්තය සඳහා එලෙස ප්‍රසිද්ධියක් අත්කරගෙන ඇති ප්‍රදේශයකි. මෙහි නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරය මෙරටේ භූගෝලීය ප්‍රදේශය ඉක්මවා යමින් දකුණු ආසියානු රටවලට පවා සේවා සපයන කර්මාන්ත ක්ෂේත්‍රයක් ලෙස මේ වන විට වර්ධනය වී ඇත. මෙහිදී මෙම නිමවුම් ව්‍යාපාර මගින් ලබන ආදායම් මට්ටම, ජාතික ආර්ථිකයට සේවා නියුක්ති අංශයෙන් ලබාදෙන දායකත්වය, මෙම අංශයේ වෙළඳපොල ක්‍රියාකාරිත්වය හා ව්‍යාපාරවල පවත්නා යටිතල පහසුකම් පිළිබඳව අවධානය යොමුකරවීම මෙම අංශයේ අභිවෘද්ධියට රුකුලක් වනු ඇත.

මෙරටේ කර්මාන්ත අංශයේ විකාශනයත් සමග මෙම සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාර අංශය ද පසුගිය දශක කිහිපයක් තුළ විකාශනය වෙමින් වර්ධනය වූ අංශයක් බවට මේ වන විට පත්ව ඇත. මෙම විකාශනයේ ප්‍රතිඵලයක් ලෙස මහරගම පමුණුව ප්‍රදේශය නිමි ඇඳුම් නිෂ්පාදනයට හා අලෙවියට ප්‍රසිද්ධියක් උසුලන මෙරටේ කේන්ද්‍රීය ප්‍රදේශයකි. මෙම ප්‍රදේශය තුළ ක්‍රියාත්මක සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වය පිළිබඳව කරනු ලැබූ සිද්ධි අධ්‍යයනයකට අනුව 2021 වසරේ මුල් මාස හතරක කාලය තුළ නිෂ්පාදනය කර ඇති නිමි ඇඳුම් ප්‍රමාණයන් හා ඒවායේ අලෙවි ආදායම් මෙලෙස හඳුනාගන්නා ලදී.

| 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා නිමවුම් ප්‍රමාණය | නිමවුම්වල නිරත ව්‍යාපාර ප්‍රතිශතය (%) |
|---|---|
| 2000 - 4000 | 45 |
| 4001 - 6000 | 33 |
| 6001 - 8000 | 22 |
| එකතුව | 100 |

මූලය: සිද්ධි අධ්‍යයන දත්ත 2021, *RDTRI*

පවතින කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ ද එයට අනුගත වෙමින් නිෂ්පාදන ක්ෂේත්‍රයට දායකත්වය ලබාදීමට මෙම අංශය කටයුතු කර ඇත. 2017 වසරේ දී නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාර සඳහා පහසුකම් සැළසීමේ ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් ලෙස මෙම නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරවල ධාරිතාව වැඩිදියුණු වීමත් සමග පසුගිය කාලයට සාපේක්ෂව වැඩි නිමවුම් ප්‍රමාණයක් මේ වන විට අත්කර ගැනීමට සමත්ව ඇත. පවුලේ ප්‍රධාන ආදායම් ඉපයීම් මාර්ගයක් ලෙස ක්රියාත්මක මෙම අංශයෙන් පසුගිය මාස හතරක කාලය තුළ උපයන ලද ආදායම් ද මෙලෙස හඳුනාගන්නා ලදී.





මූලය: සිද්ධි අධ්‍යයන දත්ත 2021, RDTRI

සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදකයින් විවිධ ආදායම් මට්ටම් තුළ තම ව්‍යාපාරික කටයුතු කරනු ලබන අතර, එය නිෂ්පාදනය කරනු ලබන නිමි ඇඳුම් ඒකක ප්‍රමාණය මත තීරණය වන ආකාරය දක්නට ඇත. ඔවුනට වැඩි නිමවුම් ප්‍රමාණයක් වෙළඳපොලට ඉදිරිපත් කල හැකි නම් වැඩි අලෙවි ආදායමක් උපයා ගැනීමේ හැකියාව ඇත. නිමි ඇඳුම් නිෂ්පාදකයින්ගෙන් 67% ක ප්‍රතිශතයක් ඉහත කාල සීමාව තුළ අලෙවි ආදායම රුපියල් ලක්ෂ හතරකට වඩා වැඩියෙන් උපයාගෙන ඇත. මෙම අලෙවි ආදායම්වලින් නිමි ඇඳුම් නිෂ්පාදනය සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය වියදම්, සේවක වැටුප් හා වෙනත් වියදම් ද පියවා ගන්නා අතර, නිමවුම වැඩිකර ගැනීමේ හැකියාව මත වැඩි අලෙවි ආදායමක් උපයා ගත හැකිය. නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරය මොවුන්ගේ පවුල්වල ප්‍රධාන ජීවනෝපාය මාර්ගයයි.

එසේම මෙම සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාර සේවා නියුක්ති උපාය මාර්ගයක් ලෙස ද වැදගත් වේ. අධ්‍යයනයට ලක් වූ නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාර තුළ පවුලේ ශ්‍රමය මෙන්ම බාහිර ශ්‍රමිකයින්ගේ සේවා නියුක්තිය ද දක්නට ලැබුණු අතර, එහි මුළු සේවා නියුක්තියෙන් 31%ක් පවුලේ ශ්‍රමයෙන් ද 69%ක් බාහිර සේවා නියුක්තිකයන්ගෙන් ද සමන්විත විය.

අධ්‍යයනයට භාජනය වූ සියලුම නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරවල බාහිර ශ්‍රමිකයින් සඳහා සේවා අවස්ථා සලසා දී තිබූ අතර, ඔවුන් බොහෝ විට නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාර ආසන්නව පදිංචි අය විය. ඇතැම් නිමි ඇඳුම්

ව්‍යාපාරිකයින් වැඩි පිරිසකට රැකියා අවස්ථා සලසා දී ඇති බව දක්නට ඇත. මෙම සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරවල බාහිර සේවා නියුක්තිය මෙලෙස සකස්කරගෙන තිබුණි.




මූලය: සිද්ධි අධ්‍යයන දත්ත 2021, RDTRI

සුළු පරිමාණ නිමි ඇඳුම් ව්‍යාපාර තුළ දක්නට ලැබුණු 69%ක සේවා නියුක්තිය තුළ 10 දෙනෙකු බැගින් වන සේවා නියුක්ති අවස්ථා සපයාගෙන තිබූ නිමි ඇඳුම් ව්‍යාපාර 2ක් තිබූ අතර, 4 දෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් සේවා නියුක්ත කර තිබූ මුළු නිමි ඇඳුම් ව්‍යාපාර ප්‍රමාණය 44%කි. මෙම බාහිර සේවා නියුක්තිකයින් බොහෝ දෙනා නිමි ඇඳුම් ව්‍යාපාර ආසන්නව ජීවත් වන පවුල්වල අය වූ අතර, ඒ නිසාම ඔවුනට එම රැකියාවල නිරතවීම පහසුවිය. මේ අනුව රැකියා අවස්ථා උත්පාදනය කිරීමේ උපාය මාර්ගයක් ලෙස ද නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාර ජාතික ආර්ථිකයට විශාල කාර්යබාරයක් ඉටු කරයි.




මෙවන් මෙහෙවරක නිරත මෙම සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදන අංශය තවදුරටත් දියුණු කළ හැකි අංශයක් බව දක්නට ලැබුණු අතර, එම දියුණුව කරා යන ගමනේ දී ඔවුනට බාධාකාරී ලෙස පවතින ගැටලු හා අභියෝග රැසක් පවතී.

- පවත්නා කොරෝනා වසංගත තත්වය හමුවේ නිමි ඇඳුම් නිෂ්පාදනයට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය (රෙදි) සපයා ගැනීමට අපහසුවීම මෙම නිමි ඇඳුම් නිෂ්පාදකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි. සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදකයින් වැඩි පිරිසක් ඇඟලුම් කම්හල්වලින් ඉවත් කරන රෙදි කැබලි තම අමුද්‍රව්‍ය ලෙස යොදාගනු ලබන අතර, ඒවා අතරමැදි තැරැව්කරුවන් විසින් ඇඟලුම් කම්හල්වලින් තොග වශයෙන් ලබාගැනීම නිසා සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදකයින්ට අතරමැදි තැරැව්කරුවන්ගේ ග්‍රහනයට ද හසුවීමට සිදුව ඇත. අතරමැදි ග්‍රහනයට හසුවීම නිසා අමුද්‍රව්‍ය ලෙස යොදාගනු ලබන රෙදි කැබලිවලට වැඩි මුදලක් වැය කිරීමට සිදුවී ඇත.

- මුදල් හිඟකම මොවුන් මුහුණ දී සිටින තවත් ප්‍රධාන ගැටලුවකි. අමුද්‍රව්‍ය (රෙදි) වැඩි ප්‍රමාණයක් එකවර මිලදී ගැනීමට හෝ නිෂ්පාදිත නිමි ඇඳුම් අලෙවි කර මුදල් ලැබෙන තෙක් ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් මුදල් මොවුනට නොමැති බව නැගෙන මැසිවිල්ලකි. නිෂ්පාදන ඉලක්ක සපුරාගැනීමට ද මෙය බාධාවක් වී ඇත.

- සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදකයින් සඳහා වෙළඳපොල තුළ පවතින අලෙවි පහසුකම් ප්‍රමාණවත් නොවීමද මොවුනගේ එක් ගැටලුවකි. පදික වේදිකාවේ අව්වට හා වැස්සට අසුවෙමින් ඉතා දුෂ්කර කාර්යයක නිරත වන ආකාරය දක්නට ඇත. දිවා රෑ නොනිදන නගරයක් ලෙස ප්‍රසිද්ධ මහරගම පමුණුව ප්‍රදේශය නිමි ඇඳුම් නිෂ්පාදනයට හා අලෙවියට සම්බන්ධ යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම ඉතා වැදගත් බව මෙයින් ගම්‍ය වේ.

- නිමි ඇඳුම් නිෂ්පාදනය කරන ව්‍යාපාරිකයින්ගේ නිවාසවල ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම ද තවත් ගැටලුවකි. ඔවුන්ගේ දෛනික කටයුතු හා නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරික කටයුතු නිවස තුළ එකම පරිසරයක සිදු කිරීම හේතුවෙන් වෙනත් ගැටලු නිර්මාණය වීමට ද බලපා ඇත. මහන මැෂින් තබාගැනීමට හෝ අමුද්‍රව්‍ය තොග රැස්කර තබාගැනීමට හෝ නිමි ඇඳුම් තබාගැනීමට වෙන්වූ ස්ථානයක් නිවාසවල නොමැත. නිවස තුළ තැනින් තැන ඒවා දක්නට ඇත. මෙම තත්වය හේතුවෙන් නිමි ඇඳුම් නිෂ්පාදන කාර්යයේ නියැලී සිටින අය අතර හා කුඩා ළමුන් අතර ද රෙදිවල පවතින දූහුවිල්ල නිසා ස්වසන ආබාධ දක්නට ඇත. නිවස තුළ නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම හේතුවෙන් ළමුන්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධා වී ඇත. නිවස තුළ වැඩි පිරිසක් සිටීමත්, මැෂින්වල ශබ්දය පැවතීමත් මෙයට හේතු වී ඇත.

මෙම ගැටලු මගහරවාලමින් සුළු පරිමාණ නිමි ඇඳුම් නිෂ්පාදන අංශය තවදුරටත් දියුණු කිරීම මගින් මෙම පවුල්වල සමාජ ආර්ථික තත්වය දියුණුවනවා සේම මෙරටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට ද ඉවහල් වේ.

# “ගම සමඟ පිළිසඳර - වැඩ සමඟ යළි ගමට” වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය ප්‍රායෝගික දැනුම.

පී.ඒ. චිත්‍රා ජයසිංහ

ඔබේ අදහස් ඇසුරෙන් ඔබේම මව් බිම ගොඩ නගමු ''යන තේමාව යටතේ 2020 ජනාධිපතිවරණයේදී ජනමූල ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළේය. “සෞභාග්‍යයේ දැක්ම“ නමින් ජනගත කළ අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකසනු ලැබුවේ ගම සමඟ පිළිසඳර තුළින් හඳුනා ගත් මහජන අදහස් පූර්ණ වශයෙන් සැළකිල්ලට ගනිමිනි. අප රට තුළ එවැනි ප්‍රතිපත්ති සම්පාදන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වූයේ ඉතිහාසයේ පළමු වතාවටය.

2021 අයවැය මගින් ඉදිරිපත් කර ඇති සංවර්ධන යෝජනා පෙර සඳහන් කළ ක්‍රියාවලියේම තවත් දිගුවකි. මෙවර අයවැය ලේඛණයෙන් ඉතිහාසයේ පෙර නොවූ විරූ ප්‍රමුඛතාවයක් ග්‍රාමීය සංවර්ධනය වෙත ලබා දී තිබේ. එකී සංවර්ධන මෙහෙයුම් රට පුරා ගමින් ගමට ක්‍රියාවට නංවන අවස්ථා ආරම්භ කර ඇත. ඒ අනුව ඊට අදාල ඉදිරි කටයුතු වෙනුවෙන් “ගම සමඟ පිළිසඳර - වැඩ සමඟ යළි ගමට” නමින් වැඩසටහන් සංකල්පය නිර්මාණය කර ඇත.

මෙම වැඩසටහන ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ මැදිහත් වීමෙන් දිවයිනේ සෑම ග්‍රාමසේවා වසමකම ක්‍රියාත්මක කරනු ලබයි. ග්‍රාමීය කමිටු සාමාජිකයින්ගේ හා ප්‍රජා සහභාගිත්වයෙන් පැවැත්විය යුතු කුඩා මහජන සභා මගින් ගමේ සංවර්ධන ප්‍රමුඛතාවයන් හඳුනාගෙන ඒවා අදාල ආයතන මගින් ක්‍රියාවට නැංවීම මෙහි අපේක්ෂාවයි. ඒ අනුව ගම සමඟ පිළිසඳර - වැඩ සමඟ යළි ගමට වැඩසටහන පවත්වා මෙම ඓතිහාසික ග්‍රාමීය සංවර්ධන මෙහෙයුමේ කටයුතු විධිමත්ව සැළසුම් කර ක්‍රියාවට නැංවීම සඳහා පහත සඳහන් තොරතුරු වැදගත් විය හැකිය.

**<u>ගම සමඟ පිළිසඳර වැඩසටහනට අදාල ග්‍රාමීය කමිටු සංයුතිය.</u>**

-විහාරාධිපති ස්වාමීන්වහන්සේ/ පූජ්‍ය පක්ෂය

-පළාත් පාලන ආයතන මහජන නියෝජිතයින්

-ග්‍රාම නිළධාරි

-සමෘද්ධි සංවර්ධන නිළධාරි

-කෘෂිකර්ම පර්යේෂණ නිළධාරි

-ආර්ථික සංවර්ධන නිළධාරි

-පවුල් සෞඛ්‍ය සේවා නිළධාරි

-විදුහල්පති

-තැපැල් ස්ථානාධිපති

-අනෙකුත් ප්‍රජා නායකයින්

-ග්‍රාමසංවර්ධන / මරණාධාර සමිති /යෞවන සමාජ / ක්‍රීඩා සමාජ/ ගොවි සංවිධාන /ප්‍රජාමූල මණ්ඩල/ සමෘද්ධි සංවර්ධන සමිති වැනි ග්‍රාමීය සංවිධානවල ප්‍රධානීන්

**<u>සංවිධානගත කිරීම</u>**

-රැස්වීම් භූමිය පොදු ස්ථානයක් විය යුතුය.

-සභාව කැඳවීම ප්‍රාදේශීය සංවර්ධන කමිටුව විසින් බලය පවරනලද ග්‍රාමීය රාජ්‍ය නිළධාරියෙකු විසින් සිදු කළ යුතුය.

-ප්‍රජා සහභාගිත්වය මුළු ගමම නියෝජනය වන පරිදි අංග සම්පූර්ණ ප්‍රජා සහභාගිත්වයක් තිබිය යුතුය.

-පැමිණීම හා ලියා පදිංචියේදී පැමිණි සියළු දෙනාගෙන්ම පැමිණීම සහවුරු කෙරෙන අත්සන් ලේඛණය ලබා ගත යුතුය.

-යෝජනා ලේඛණගත කිරීමේදී මේ සඳහා පහත ලබා දී ඇති පෝරමය පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

**"ගම සමඟ පිළිසඳර - වැඩ සමඟ යළි ගමට"**

දිස්ත්‍රික්කය--------------------- පළාත්පාලන ආයතනය--------------------------

ප්‍රාදේශීය ලේකම් කර්යාලය -------------------- ග්‍රාමසේවා වසම --------------------

අපේ ගම හදන - අපේ යෝජනා

| යෝජනාව ( ව්‍යාපෘතියේ ස්වභාවය කෙටියෙන් ලියන්න | අදාල විෂය ක්ෂේත්‍රය (මාර්ග, වාරි මාර්ග, කෘෂි, අධ්‍යාපන ආදි) |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

-------------- දින --------------- දී පැවති ගම සමඟ පිළිසඳරේදී පොදු එකගතාවයෙන් සැකසූ මෙම යෝජනාවලිය ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කරන්නෙමු.

----------------------------- ---------------------------- --------------------------------

------------------------------ ---------------------------- ------------------------------

**ආදර්ශ න්‍යාය පත්‍රය**

1. සභාව පිළි ගැනීම ( ග්‍රාම නිළධාරි/ සමෘද්ධි සංවර්ධන නිළධාරි/කෘෂිකර්ම පර්යේෂණ නිළධාරි/ ආර්ථික සංවර්ධන නිළධාරි හෝ වෙනත් ග්‍රාමීය නිළධාරියෙකු විසින්)
2. සංස්කෘතික අංග -01
3. හැදින්වීම - පළාත් පාලන ආයතන මහජන නියෝජිතයා විසින්.
4. සාකච්ඡා වාරය - පළමු අදියර
5. සංස්කෘතික අංගය - දෙවන අදියර
6. සාකච්ඡා වාරය - දෙවන අදියර
7. ස්තුතිය ගම් වැසියෙකු විසින්

**සභාව මෙහෙය වීම**

- නිවේදන හැකියාව ඇති තරුණයෙකුට හෝ තරුණියකට

**සංවර්ධන ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම**

- වැඩි පිරිසකට ප්‍රතිලාභ ලැබෙන වඩාත් ඵලදායි ව්‍යාපෘති
- ජනාධිපතිතුමන්, අගමැතිතුමන් හෝ රජය වෙත මේවන විට යොමු කර ඇති යෝජනා
- ගම සමග පිළිසඳර පෙර වැඩසටහනේදී හඳුනාගත් යෝජනා
- ප්‍රජා මූල සංවිධාන විසින් එදිනට ඉදිරිපත්කරන යෝජනා.
- ප්‍රජා දායකත්වය උපරිම ලෙස ලබා ගත හැකි යෝජනා
- කොටස් නිමකරන ලද අසම්පූර්ණ ව්‍යාපෘති
- ස්වභාවික ආපදාවන්ට ලක්ව ඇති ව්‍යාපෘති
- ජීවනෝපාය සංවර්ධනයට උචිත ව්‍යාපෘති
- පෞද්ගලික මට්ටමින් ඉදිරිපත්වන යෝජනා
-

**ප්‍රාදේශීය සංවර්ධන කමිටුව මගින් ව්‍යාපෘති තේරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු.**

- සෑම ගමකටම අවම වශයෙන් එක ව්‍යාපෘතියක් හෝ ලැබිය යුතුය.
- සියළු විෂය ක්ෂේත්‍රය නියෝජනය වන පරිදි ව්‍යාපෘති තෝරා ගත යුතුය.
- ආයතන වෙත ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ කටයුතු පැවරීමේදි ඔවුන් සතු පහසුකම් හා වැඩ ධාරිතාවන් (working capacity) පිළිබඳ සැළකිලිමත් විය යුතය.
- සමාජයේ විවිධත්වයන් හා සියළු සංස්කෘතීන් වෙත පහසුකම් සැපයෙන පරිදි ව්‍යාපෘති තෝරා ගත යුතුය.

**ලබා ගත් යෝජනා පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ වගකීම.**

- සෑම ග්‍රාමසේවා වසමකින්ම ලැබී ඇති යෝජනා ප්‍රමුඛතාගත කිරීම
- එක් එක් ව්‍යාපෘති වලට අදාල ආයතන හා නිළධාරින් හඳුනා ගැනීම
- එම ආයතන ශීර්ෂයන් යටතේ ව්‍යාපෘති ලේඛණ ගත කිරීම.
- ජනාධිපති කාර්ය සාධන බලකායට හා දිස්ත්‍රික් සංවර්ධන කමිටුව වෙත ප්‍රමුඛතා ගත කරන ලද යෝජනාවල පිටපත් යොමු කිරීම

- හඳුනා ගත් එක් එක් යෝජනා අදාල අමාත්‍යාංශ වෙත යොමු කිරීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එක් එක් ග්‍රාම සේවා වසමට අදාල යෝජනා ජනාධිපති කාර්යසාධන බලකායේ තොරතුරු පද්ධතියට (www.gamasamaga.org) කඩිනමින් ඇතුලත් කිරීම.

**<u>ව්‍යාපෘති තේරීමේදී වැඩි අවධානය යොමු කළ යුතු අංග</u>**

- ළමා හා මාතෘ සායන ඉදි කිරීම.
- ග්‍රාමීය රෝහල් හා ඩිස්පෙන්සරි නවීකරණය.
-සෑම ග්‍රාමසේවා වසමකටම ප්‍රමිතිගත පෙරපාසැලක්.
-ජාතික පාසැල් සංඛ්‍යාව 1000 දක්වා වැඩි කිරීම.
-සෑම පාසැලකටම පානීය ජලය.
- සෑම පාසැලකටම වැසිකිලි හා කැසිකිලි.
-ගම්බද පාසැල් වලට ගුරු නිවාස.
-අධිවේගි අන්තර්ජාල සබදතා සමග ගමට සන්නිවේදනය.
-ග්‍රාමීය තරුණ තරුණියන්ට අලුත් ව්‍යාපාර අවස්ථා.
-ගමට ක්‍රීඩා පිටියක් හා ප්‍රදේශයට මහජන ක්‍රීඩාංගනයක්.
-පාසැල් ක්‍රීඩාපිටි නවීකරණය.
-කුඩා ඇඟළුම් කර්මාන්ත සඳහා පහසුකම්.
-ඔසු පැළ තවාන්.
-පුරන් ඉඩම් අස්වැද්දීම.
- කුඩා ප්‍රමාණයේ කිරි ගොවිපල දියුණු කිරීම.
-කුඩා තේවතු හිමියන් දිරි ගැන්වීම.
- පොල් පැල ලබා දීම.
-කාබනික ආහාර නිෂ්පාදන වැඩි කිරීම.
-ගොවීන්ට අලුත් කෘෂි කාර්මික දැනුම.

- ග්‍රාමීය පොහොර ගබඩා.
- ගමට පානීය ජලය.
- වැව් අමුණු නවීකරණය.
- ග්‍රාමීය මාර්ග කාපට් කිරීම.
- පාලම් බෝක්කු ඉදිකිරීම හා නවීකරණය.
- අලි වැට හා මුර කුටි.
- නාගරික පැල්පත් වාසීන්ට අලුත් නිවාස.
- සෑම ග්‍රාමසේවා වසමකම අඩු ආදායම්ලාභී පවුලකට නිවසක්.
- අලුත් වතු නිවාස
- ඉඩම් හිමිකම් ඔප්පු ලබා දීම.
-නාගරික වන රොද.

-ග්‍රාමීය මාර්ගවල පොදු ප්‍රවාහන සේවා.

-ගමට සතොස.

- මිරිදිය මත්ස්‍ය වගාව.

- ඉස්සන් වගාව

- මල් වගා කරුවන්ට, විසිතුරු මත්ස්‍ය වගා කරුවන්ට ගොවීන්ට අවශ්‍ය පහසුකම්.

- මැටි ආශ්‍රිත ගම්මාන දියුණු කිරීම.

- සම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන වැඩි දියුණු කිරීම.

ව්‍යාපෘතියක් හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම යන සෑම අවස්ථාවකදීම සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය යොදා ගනිමින් ක්‍රියා කිරීම එම ව්‍යාපෘතිය සාර්ථකත්වයට හේතු වේ. මෙම ගම සමඟ පිළිසඳරක් වැඩසටහන මගින් ව්‍යාපෘතියක් හඳුනා ගැනීමේ අවස්ථාවේ මහජන සහභාගිත්වය ලබා ගැනීමේ කටයුත්ත මනාව සිදුවන ආකාරයට වැඩසටහන සැළසුම් කර ඇත. එබැවින් ප්‍රජාවගේ ගැටලු විසඳෙමින් වැඩසටහන සාර්ථක වීමට එම ක්‍රමවේදය ඉවහල් වනු ඇත. (ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන්කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකා ලේඛන ඇසුරින්ය)

# වස විෂෙන් තොර කටට රහට කෑම "ගලහ සමෘද්ධි බොජුන් හල"

ප්‍රදීප් ලංකාපෙල



මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩ දෙල්තොට, පහලගම සමෘද්ධි ආදර්ශ ගම්මාන ව්‍යාපෘතියට සමගාමීව ගලහ නගරයේ සමෘද්ධි දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත 2017 වර්ෂයේදී සමෘද්ධි බොජුන්හල ආරම්භ කරන ලදී.

**මෙම සමෘද්ධි බොජුන්හලේ ප්‍රධාන අරමුණු**

- වස විෂෙන් තොර දේශීය ආහාර පාරිභෝගිකයන්ට ලබාදීම.
- පාරිභෝගිකයාගේ රුචිකත්වයට ගැලපෙන ආහාර වේලක් බොජුන්හලේදීම රස විදීමට අවස්ථාව ලබාදීම.
- සමෘද්ධි ආදර්ශ ගම්මානයේ කාන්තා ව්‍යවසායකයින් සඳහා රැකියා අවස්ථා ලබාදීම.
- පහලගම ආදර්ශ ගම්මානයේ රසකැවිලි නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීම වැනි අරමුණුය.

**ගලහ සමෘද්ධි බොජුන්හලේ නිෂ්පාදනය කරන රස කැවිලි අතර පහත වර්ග ජනප්‍රිය වී ඇත.**









ගලහ සමෘද්ධි බොජුන්හල ගලහ නගරයේ පිහිටිම අනුව කාගේත් නෙත ගැටෙන ස්ථානයකි. මහනුවර ගලහ ප්‍රධාන මාර්ගයට මුහුණ ලා පිහිටීම නිසා පාරිභෝගිකයින්ගේ ආකර්ශනය දිනාගෙන ඇත. එසේම ගලහ නගරයේ ප්‍රධාන පාසල බොජුන්හලේ ඉදිරිපිට පිහිටුවා තිබීම පාරිභෝගිකයින් වැඩි පිරිසක් ආකර්ශණය කර ගැනීමට හේතු වී ඇත.

සමෘද්ධි බැංකු සංගමය පිහිටි ගොඩනැගිල්ලේ සමෘද්ධි බොජුන්හල පිහිටුවා තිබීම නිසා සමෘද්ධි බැංකුව වෙත එන ගනුදෙනු කරුවන් මෙම අලෙවි සැලට පැමිණීම නිසා අලෙවිය වැඩිවී ඇත.



**කාර්ය මණ්ඩලය**

මෙම බොජුන්හලේ කාන්තා ව්‍යවසායකයින් හතර දෙනෙකුගෙන් සමන්විත සාමුහික අලෙවි රටාවක් ඇත. එක් එක් කාන්තා ව්‍යවාසයකයින්ගේ රැකියාවන් අනුව ඔවුන් තම නිෂ්පාදනයන් බෙදාගෙන වෙන වෙනම අලෙවි කිරීම කරයි. සමෘද්ධි කණ්ඩායම් වල ලක්ෂණයක් වන සහභාගීත්ව ප්‍රවේශය ඉතාම හොඳින් ප්‍රායෝගික කරණය වී තිබීම මෙම ව්‍යවසායකයන් තුළ දක්නට ඇත. එය සමෘද්ධි වැඩසටහනේ ප්‍රගතිය විනිවිද කරණයට ලක් වීමකි.

කාන්තා ව්‍යවාසයකයින්:

1. **චිත්‍රාංගනී හේරත් මිය**

සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහනෙන් බිහිවූ කාන්තා ව්‍යවසායකයෙකි. ඇය ඉතා හොඳින් හා පිරිසිදුව කෑම නිෂ්පාදනය කර බොජුන්හලේ අලෙවි කරන්නේය. වඩේ, තෝසේ, පැටිස්, කොළ කැඳ, ඉතා ප්‍රනීතව සාදා අලෙවි කරයි. ඇයගේ ආදායම දිනකට රුපියල් 4000 – 5000 ක් අතර පවතී. තම පවුලේ ආර්ථිකය සඳහා ඇගේ දායකත්වය සපයන බව ඉතා ආඩම්බරයෙන් පැවසුවාය.



2 .**ප්‍රියානි ජයසූරිය මිය**

සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩසටහන මගින් බිහිවූ තවත් කාන්තා ව්‍යවසායිකාවකි. ඇය සමෘද්ධි බොජුන්හලේ ඉඳිආප්ප, තෝසේ, රොටී සහ අළුවා නිෂ්පාදනය කර අලෙවි කරයි. ඇයගේ ආදායම දිනකට රුපියල් 3000 – 4000 ක් අතර පවතින බව ඇය පැවසුවාය. තම නිවසේ වියදම් පියවා ගැනීමට, ළමයින්ගේ අධ්‍යාපනික වියදම් සඳහාද ඉතා රුකුලක් වන බව ඇය පැවසුවාය.



3. දමයන්ති මිය

ඉතා ප්‍රනීතව ලැවරියා සහ උඳුවැල් නිෂ්පාදනය කොට බොජුන්හලේ අලෙවි කරයි. ඇයද දිනකට රුපියල් 3000 – 5000 ක් අතර ආදායමක් ලබන බව පවසන ලදී. ඇයගේ පවුලේ ජීවන බර සඳහා දායක වීමට ඉතා රුකුලක් වූ බව ඇය පැවසුවාය.



4. පුෂ්පරානි මිය

සමෘද්ධි බොජුන්හලේ සිටින දමිළ ව්‍යවසායිකාවකි. ඇය ඉතා ප්‍රනීතව ඉට්ලි, වඩේ, ඉදිආප්ප සාදා අලෙවි කරන අතර, උදේට ඉදිආප්ප අලෙවිය ඉතා හොඳින් වන බව ඇය පැවසුවාය. ඇයගේ ආදායම දිනකට රුපියල් 3000 – 4000 ක් අතර පවතින බව ඇය පැවසුවාය.



මෙම ව්‍යවසායිකාවන් සිය කැමැත්තෙන් හා ස්ව උත්සාහයෙන් තම නිෂ්පාදන අලෙවිකරණය කර ඉතා රසවත් ආහාර ප්‍රදේශයට එන පාරිභෝගිකයින්ට ලබාදෙමින් අනගි සේවාවක් ලබාදෙයි. බොජුන් හලේ පරිපාලන කටයුතු මෙම හතර දෙනා ඉතාම සුහදශීලීව මනා ආකර්ශනයෙන් කරගෙන යාම නිසා පාරිභෝගිකයන්ගෙන් සෑම අවස්ථාවකදීම පිරී ගොස් ඇත. නගරයට එන ජනතාව මෙන්ම සමෘද්ධි බැංකුවට සහ පාසැලට එන අයද මෙම බොජුන්හලේ තිබෙන කෑම රස බලා ගෙදර අයටද රැගෙන යාම දක්නට ලැබේ.

සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ ආරම්භ කළ ගලහ සමෘද්ධි බොජුන්හල වර්තමානය වන විට ඉතා හොඳින් ක්‍රියාත්මක වේ. දෙල්තොට ප්‍රාදේශීය ලේකම්තුමියගේ හා සමෘද්ධි අංශයේ අධීක්ෂණය යටතේ ඉතා හොඳින් ක්‍රියාත්මක වේ.

# ජාතික ආපදාවකදී ප්‍රජාමූල සංවිධානයක ඇති වැදගත්කම.

*එස්.එම්. යූ.බී. සමරකෝන්*

අප අද මුහුණ දී සිටින්නේ ජාතික වශයෙන් පමණක් නොව ගෝලීය වශයෙන් වූ මහා උවදුරකටය. එනම් වර්තමානයේ මුළු ලෝකයටම හුරු, සියලු දෙනාම පාහේ දන්නා වචනය බවට පත්ව ඇත්තේ කොරෝනා හෙවත් කොවිඩ් ය. මෙය අද හඳුන්වන්නේ **COVID-19** යනුවෙනි. මෙය මනිසුන්ගේ ප්‍රතිශක්තිය දුර්වල කරන්නා වූ ප්‍රබල වෛරසයකි. අද මුළු ලෝකයම වෙලාගත් මෙම වෛරසය වෙනස්වෙමින් මිනිසුන්ගේ ශරීරයට ඇතුල්වෙමින් තිබේ. අවසාන ප්‍රතිඵලය මරණයයි. දකින්නට ඇති එකම සැනසීම දැනට රටවල් කිහිපයක් විසින් නිපදවා ඇති එන්නත් කිරීම පමණි.

ලෝක ඉතිහාසය දෙස විමසා බැලීමේදි මෙවන් වූ වසංගත වලට මිනිසා අතීතයේ සිටම මුහුණ පා ඇත. මෙම වෛරසය වයස් බේද, ජාති බේද, ආගම් බේද, කුල ගෝත්‍ර කිසිවක් නොසලකා රාත්‍රී දහවල් නොසලකා ඉතා අනුකම්පා විරහිතව මිනිසාට පොදුවේ පහර දෙයි. නැතිනම් අපේ ශරීරයට හෙමින් සීරුවේ අපට හොරා රිංගා ගනි. එනම් වෛරසය ජීවත් වේ. අපට මරණය ගෙන දේ. මෙහිදි අප විසින් සලකා බැලිය යුතු කරුණු කිහිපයකි. ඒනම්,

1 .මෙවන් වෛරසයක් බිහිවූයේ කෙසේද/ඇයි?

2.මෙම වෛරසයේ ස්වරූපය කොහොමද?

3 මෙම වෛරසයට අප මුහුණ දෙන්නේ (මෙයින් බේරෙන්නේ) කුමන ආකාරයටද ?

යන්නය.

මෙම ඉහත මුල් කාරණා දෙකට ලෝකයේ සිටින එම විෂයය පිළිබද දැණුම ඇති විද්වතුන් පිළිතුරු සොයනා අතරම වඩාත් වැදගත් හා සංවේදි කාරණය වන්නේ මෙම වෛරසයට අප මුහුණ දෙන්නේ (මෙයින් බේරෙන්නේ) කුමන ආකාරයටද යන්නය. එනම් මෙම සැගවුණු පොදු සතුරාට අප මුහුණ දෙන්නේ කෙසේද?මෙය අප හමුවේ ඇති ප්‍රධාන ගැටළුවයි.

මේ සදහා තිරසර වැඩපිළිවෙලක් වහ වහා ක්‍රියාත්මක විය යුතු වන්නේ පොදුවේ සියලු ජනතාව නිවසට වී හුදෙකලාව (අත්‍යවශ්‍ය සේවා හැර) ආර්ථික ක්‍රියාකාරකම් නතරකර දමා දිගුකාලීනව සිටිමට නොහැකි බැවිණී. මෙහිදි රජයට හෝ ඒය මෙහෙයවනු ලබන කුමන ආණ්ඩුවකට හෝ වේවා, කුමන නිලධාරීන්ට හෝ වේවා කුමන පුද්ගලයෙකුට හෝ වේවා දොස් කිය කියා නොසිට අපගේ (ප්‍රජාවගේ) කාර්යභාරය තේරුම් ගත යුතුය. ඒ අනුව මෙහිදී ප්‍රජාව විසින් අවබෝධ කරගත යුතු කරුණු කිහිපයකි. ඒනම්,

1.තනි තනිව මෙම තත්වයට මුහුණ දීමට නොහැකි බව

2.පවතින්නා වූ සම්ප්‍රදායික සංවිධාන වලින් මෙයට විසඳුම් සෙවිය නොහැකි බව

3. **COVID-19** වසංගතයට මුහුණදීම සදහාම වූ නව ප්‍රජා සංවිධානයක අවශ්‍යතාවය ඇති බව.

මෙය වර්තමානයේ දරුණු වසංගතයක් ලෙස ජනතාව අතර පොදුවේ ශීඝ්‍රයෙන් පැතිර යයි. ඒ නිසාවෙන්ම මෙයට මුහුණ දීම සඳහා ජනතාව එකට එකතු විය යුතුයි. එනම් ප්‍රශ්නය තේරුම් ගෙන ඒකරාශී විය යුතුයි. එනම් සංවිධානගත විය යුතුයි.

මෙහිදී ගම තුළ දැනට පවත්නා සම්ප්‍රදායික සංවිධාන වලින් (සුබ සාධක සමිති, මරණාධාර සමිති, වැඩිහිටි සමිති, ග්‍රාම සංවර්ධන සමිති, යෞවන සමාජ,සමෘද්ධි සමිති , කාන්තා සමිති ආදී) මේ සඳහා විසඳුම් බලාපොරොත්තු විය නොහැක. ඊට හේතු වන්නේ මෙම සමිති මෙහෙයවනුයේ ගමතුළ යම් කිසි ලෙසකින් බලවත් වූ අය විසින් වීම නිසාය. රැකියාව, කුලය, වත්පොහොසත්කම, පක්ෂය, උගත්කම ආදි වූ කුමන හෝ දෙයකින් ගමතුල ඉස්මතු වූ අය විසිනි. නැතහොත් මෙම සමිති මෙහෙයවනුයේ විවිධාකාර නමින් වූ නිලධාරින් විසිනි. මේ නිසා සැබෑ ජනතා අරමුණු ඉටු නොවනු ඇත. මෙනිසාමය COVID-19 වසංගතයට මුහුණදීම සඳහාම වූ නව ප්‍රජා මූල සංවිධානයක අවශ්‍යතාවය ඇති වන්නේ. ඒ අනුව මෙම සංවිධානය පිහිටුවීම, මෙහෙයවීම. පාලනය, තිරණගැනීම හා ඒවා ක්‍රියාත්මක කරවීමේ සම්පූර්ණ බලය මෙම සංවිධානය හරහා ගමේ ප්‍රජාවට ලබාදිය යුතු අතර එහිදි මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කල හැකි නව ප්‍රජා නායකයින් කිහිප දෙනෙකු ගම තුළින් පොදු එකගතාවයෙන් තෝරාගත යුතුය. මෙම ප්‍රජා නායකයින් තෝරා ගැනීමේදී මුළු ග්‍රාම නිලධාරී වසම ම නියෝජනය වන පරිදි තෝරාගත යුතු අතර ගමේ ඇති ගම්ගොඩැලි වලින් සුදුසු අය මේ සඳහා තෝරාගත යුතු වන පරිදිද තවද මේවා පිහිටුවීමේදී ගම නියෝජනය කරන්නා වූ සියලුම ක්ෂේත්‍ර නිලධාරින්ද ගමේ ප්‍රජාව හා මුසු විය යුතු අතර නිලතල භාරදීමේදී ඔවුනට ප්‍රමුඛතාවය ලබා නොදිය යුතුය. මෙහිදී ඔවුන් අධික්ෂණයට හා මග ගැන්වීමට පමණක් සිටිය යුතු අතර මැදිහත්වන්නා වූ ප්‍රජා සංවිධාන විෂය හඳුනන වගකිව යුතු බාහිර පිරිසකට ලබාදිය යුතුයි. මෙකි විශේෂඥයින් හරහා අදාල පොදු ගැටළුව (මෙහිදි **COVID-19**) එහි ගෝලීය තත්වයන් හා අරමුණු පිළිබඳ නිරන්තර දැණුවත් කිරීම කල යුතුය.

මේ අනුව ශ්‍රී ලංකාවේ ග්‍රාම නිළධාරී වසම් 14000 ක් පමණ ඇති අතර **COVID-19** ට මුහුණ දීම සඳහා ම වූ ප්‍රජාමූල සංවිධාන දාහතර දහසක් වහා ඇති කල යුතු අතර මේවා හුදු බෝඩ් ලෑලි හෝ රූකඩ වලට සීමා නොවී වහාම වැඩට බැසිය යුතුය. ඒ සඳහා ස්වාධීන බලය හා තීරණ ගැනීමේ අයිතිය ගමට ලබාදිය යුතුය. විශේෂයෙන්ම දේශපාලනය කරන්නාවුන් හෝ නිළධාරීන් මෙම වැඩපිළිවෙල ගම තුළ සැකසීම සඳහා මැදිහත් නොවිය යුතුයි. (හේතුව එය ඔවුන්ගේ කරගන්නා බැවිණි). නමුත් ක්‍රියාකාරකම්වලදී ඒකාබද්ධ ප්‍රවේශයක් යටතේ සියලු නිලධාරීන් හා දේශපාලන පක්ෂ සහයෝගය දැක්විය යුතුයි.

මෙහිදි ප්‍රජාව ඒ සඳහා සවිබලගැන්විය යුතු අතර ගමේ ප්‍රජාව එක කණ්ඩායමක් ලෙස සංවිධාන ගතවිය යුතුයි. මෙය ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික්ක, පළාත් හා ජාතික වශයෙන් මෙන්ම කලාපීය හා ගෝලීය වශයෙන් සංවිධාන ගත විය යුතුයි. මෙම සංවිධානය හරහා තමන්ගේ බල ප්‍රදේශයේ පවත්නා වර්තමාන තත්වය තේරුම් ගෙන ඊට අදාල උපායමාර්ග සකස්කොට ක්‍රියාත්මක කල යුතුය. උදාහරණ ලෙස රෝගයෙන් වැලැක්වෙන ආකාරය, රෝගය වැලඳුන අය ප්‍රතිකාර ගත යුතු ආකාරය, ඉදිරියට මුහුණ දෙන ආකාරය මෙන්ම වසංගත තත්වය හමුවේ පොදු මහජන අවශ්‍යතා ඉටු කරගැනීමේ වැඩලිළිවෙල ආදිය මෙහිදී අවධානයට ගතයුතුයි. එසේම සංවරණ සීමා හමුවේ රාජ්‍ය හා පුද්ගලික ආයතන වසා ඇති තත්වය හමුවේ හා වෙළඳසැල්, ආර්ථික මධ්‍යස්ථාන ආදීය විවෘත නොකර ඇති තත්වය හමුවේ පාරිභෝගික අවශ්‍යතා ඉටු කර ගන්නා ආකාරය, තමාගේ හෝ තම ගමේ නිෂ්පාදන අලෙවිකරගන්නේ කෙසේද යන අංශ පිළිබඳව මෙම සංවිධානයේ සිටින ප්‍රජානායකයින් විසින් ගම්මුන් සමග කරනු ලබන විධිමත් හා නිරන්තර සාකච්ඡා ඔස්සේ තීරණ ගත යුතුය. මෙම තීරණ ගැනීමේදී ගම්මුන්ගේ නැතිනම් ප්‍රජාවගේ අදහස් හා තීරණ වලට මුල්තැන දිය යුතුය. මෙහිදි මෙම ප්‍රජාමූල සංවිධානයට ගමේ සියලුම පවුල්

නියෝජනය අවශ්‍යය වන අතර ඒකී සෑම පවුලක් පිලිබඳවම දත්ත පද්ධතියක් සංවිධානය සතුව තිබිය යුතු අතර ඒවා විනිවිධභාවයකින්ද යුක්ත විය යුතුයි. මෙම දත්ත හා තොරතුරු තීරණ ගැනීමේදී ඉතා වැදගත් වේ.

කෙසේ වෙතත් අවසාන වශයෙන් සදහන් කල හැක්කේ මෙවන් ඒකාබද්ධ ප්‍රජා සංවිධාන වැඩපිළිවෙලක සාර්ථකත්වය රදාපවතිනුයේ අදාල පාර්ශවයන්ගේ උනන්දුව හා අවංක කැපවීම මත පමණක් බවය.

# සමාජ වෙනසියාවේ කාරකය මිනිසා සවිබල ගැන්වීමයි.

ආර්.එම්.කේ.බණ්ඩාර

මිනිසා ඉතා සරළ තත්ත්වයක සිට වර්තමාන පැවැත්මේ සංකීර්ණ තත්ත්වය දක්වා ඔහුගේ පැවැත්මට අවශ්‍ය වන්නා වූ සියලුම සාධකයන් පරිණාමවාදීව වෙනස්වී සහ තවදුරටත් වෙනස් වෙමින් පවතී. මිනිසාගේ චින්තනයේ පරිණාමය සමඟ මිනිස් උවමනාවන් ද ක්‍රමයෙන් සංකීර්ණ තත්ත්වයක් කරා ගමන් කරයි. විද්‍යාව හා කාර්මීකරණයේ නව සොයා ගැනීම් මිනිස් උවමනාවන්වල සංකීර්ණ ස්වභාවය තව තවත් පුළුල් කරන්නට හේතු වී ඇත. මේ නිසාම මිනිසාගේ සමාජ හැසිරීම් රටාවන් ද ක්‍රමයෙන් වෙනස් වෙමින් ඇත. විවෘත ආර්ථිකයට ලෝකය නිරාවරණය වීමත් සමඟ දියුණු තාක්ෂණික මෙවලම් ද සමඟ ඒ ඒ රටවල සංස්කෘතික අංගෝ පාංග ද වැළඳගැනීමක් සිදුවිය. මෙහි ප්‍රතිඵලය වූයේ සමාජ වෙනසියාවක් (සුභවාදී වූ වෙනසක්) ඇති කිරීමට වඩා සමාජ පරිහානියට හේතු වන්නා වූ පරිසරයක් ගොඩනැගීමයි. සමාජයේ මේ පිළිබඳව කථිකාවන් කොතෙක් පැවතුන ද මිනිසාගේ චින්තනය සමාජ වෙනසියාවක් ඇති කිරීම සඳහා යොමුගත වීම දක්නට ඇත්තේ ඉතාම මඳ වශයෙනි. එයට හේතු වන්නේ වර්ථමාන සමාජ ක්‍රමය තුළ පුද්ගලයා පෞද්ගලිකත්වය ඉස්මතු වූ ආත්මාර්ථකාමී හැඟීම් පෙරදැරිව අනෙකෙක් පරයා තමන් ඉහලින් ජීවත් වීමට උත්සාහ කිරීමයි. මේ කාරණයට අමතරව බටහිර සමාජ, ආර්ථික හා දේශපාලන බලවේග විසින් ඒවා යටපත් කිරීමට සමත් වීමයි.

සමාජ සවිබල ගැන්වීමේ අවශ්‍යතාවය මතුවන්නේ රටක් වශයෙන් ඉදිරියට යාම සඳහා සමස්ථ ජනතාවම තම චින්තනය දියුණු කරගත යුතු බැවිනි. සමාජ වෙනසියාවක් සඳහා චින්තනය නිවැරදිව මෙහෙයවා ගැනීමට අවශ්‍ය ශක්තිය පුද්ගලයා, පවුල, කණ්ඩායම හෝ ප්‍රජාව තුළ වර්ධනය වීම සවිබල ගැන්වීම නිසා සිදුවේ. මිනිසා සමාජ විග්‍රහයක නැත්නම් විමර්ශනයක නිරත වෙමින් සමාජ යථාර්ථය ස්වයංව හෝ කණ්ඩායම් වශයෙන් අවබෝධ කරගැනීම සඳහා නැත්නම් ඥාණ ගවේශණය සඳහා යොමු කිරීම පමණක් නොව එම යථාර්ථය තේරුම් ගනිමින් සමජ වෙනසියාවකට හා සමාජ සංවර්ධනයට බලපෑම් කරන්නා වූ සාධක හඳුනාගනිමින් ඒ සඳහා වූ විසඳුම් ක්‍රියාමාර්ග තීරණය කරමින් ඒ වෙනුවෙන් කළ යුතු කාර්යන් හඳුනාගෙන, සැලසුම්සහගතව අවශ්‍ය සම්පත් පිළිබඳ අවබෝධයෙන් යුතුව සජීවිව සමාජ සංවර්ධන කාර්යයට මැදිහත්වීමට තම චින්තනය මෙහෙයවීම සමාජ සවිබලකරණය ලෙස අර්ථ දැකිවිය හැක. සමාජ, ආර්ථික, දේශපාලනික, පමණක් නොව ආධ්‍යාමික ආදී වශයෙන් විවිධ පැතිකඩයන් ඔස්සේ මිනිසා තම චින්තනය මෙහෙයවීමට අභිප්‍රේරණය කිරීමක් මෙමගින් සිදුවේ.

සමාජ ක්‍රමයම අද වන විට අශීලාචර නොහික්මුණු හා බොරුව වංචාව, පොදු මහජනතාවටම අයිති සම්පත් සීමිත පිරිසක් විසින් සොරකම් කරන, දූෂණය රජයන, මමත්වය ඉස්මතු වූ, තවත් පුද්ගලයෙක් පවා දී තම බලය රැක ගැනීමට උත්සාහ කරන, තමා උගතාය, බුද්ධිමතාය කියා ප්‍රකාශ කරමින් තවකෙක් හෙලා දකිමින් කටයුතු කරන තැනට රටම පත්ව ඇති බව වැරදි කරන හා ඉන් බැට කන පිරිස් විසින් තේරුම් ගෙන ඇත. හැකි අය සම්පත් රැස්කරමින් සමාජයේ ඉහළින් වැජඹෙන අතර තමාට ආර්ථික ශක්තිය හා බලය නොමැති පිරිස් යැපුම් මානසිකත්වය නිසා දිළිඳුභාවයෙන් එන්න එන්නම පීඩාවට පත්වී සිටී. පුද්ගලයා දේශීය නිෂ්පාදන පරිභෝජනයට වඩා විදේශීය නිෂ්පාදන පරිභෝජනය කෙරෙහි වැඩි නැඹුරුවක් ඇත. විෂ මත් ද්‍රව්‍ය, මත්පැන් ආදියට පාසැල් සිසුවාගේ සිට වැඩි මහල්ලා දක්වාම ගොදුරුවී හමාරය. ස්ත්‍රී දූෂණ, ළමා අපයෝජන මෙන්ම ඉතා දරුණු ගණයේ

අපරාධ හා මිනිස් ඝාතන දිනෙන් දිනම වැඩිවෙමින් ඇත. මහන්සි වී ආදායමක් උපයනවාට වඩා පහසු හා කෙටි ක්‍රම මගින් මුදල් ඉපයීමේ ක්‍රියාකාරකම්වල නිරතවීම. විෂය දැනුම පමණක් මූලික කරගත් හා සමාජ දැනුමින් තොර වූ හා තරඟකාරී අධ්‍යාපන ක්‍රමයක් කෙරෙහි යොමුවීම, ආධ්‍යාත්මික වශයෙන් පිරිහුන සමාජයක් බිහිවීම. දේශීය සම්පත් විනාශ කිරීම, පරසරය විනාශ කිරීම, මේ රට තමන්ගේය, අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කළ යුතුය යන හැඟීමෙන් තොරව කටයුතු කිරීම, වර්තමානයේ දැකිය හැකි මහා ඛේදවාචකයකි. ඉහතින් දැක් වූ සියල්ල සිදුවන්නේ එකි නෙකාගේ තම චින්තනය මෙහෙයවන ප්‍රමාණය අනුව බව පැහැදිලිය. එසේ නම් යහපත් චින්තනයක් සහිත සමාජයක් ගොඩනැගීම සඳහා මිනිසා සවිබලගැන්වීම කල යුතුමය. සමාජ, ආර්ථික, දේශපාන හා ආධ්‍යාත්මික සාධක ඇතුළු අනෙකුත් සාධක පිළිබඳව පුද්ගලයා සිය චින්තනය මෙහෙයවා සජීවීව සමාජ සංවර්ධන කාර්යය සඳහා දායක කර ගැනීමට මෙමගින් හැකියාව ලැබේ.

නමුත් සමාජ සවිබල ගැන්වීම වර්තමනයේ දී ඉතා ලඝු කොට භාවිතයට ගන්නා බවක් පෙනෙන්නට ඇත. වැඩි වශයෙන් දුප්පත් ප්‍රජාව හා කාන්තාව ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම කෙරෙහි පමණක් මෙම සංකල්පය යොදා ගන්නා බවක් දැකගත හැකිය. මෙහි දීත් වැඩි වශයෙන් දිළිඳු ප්‍රජාව හා කාන්තාවන් අලෙවි කර ගත නොහැකි භාණ්ඩ නිපදවීම නැත්නම් ප්‍රාථමික ස්වයං රැකියාවක නිරත කරවීම පමණක් සිදුවන බව පෙනී යයි. ආර්ථික සවිබල ගැන්වීම යන්න ද ඉතා ගැඹුරු සංකල්පයකි. මුදල් ඉපයිම පමණක් ම නොව මූල්‍ය කලමනාකරණය පිළිබඳ වූ පුළුල් වූ දැනුමකි. මෙහි දී පාරිභෝගික අවශ්‍යතාවය වෙළඳපොල ඉල්ලුම හා සම්පත් පිළිබඳ විග්‍රහය තුළ නවෝත්පාදනයක් බිහි කිරීම පිළිබඳ චින්තනයක් ඇතිකර ගැනීමට අවස්තාව සලසා දීම හා නිෂ්පාදනය, අලෙවිය, ඉතිරි කිරීම හා ආයෝජනය යන මූල්‍ය කළමණාකරන විධි පිළිබඳව ප්‍රජාව සවිබල ගැන්වීම අත්‍යවශ්‍ය වේ.

මෙම ලිපිය ආරම්භයේ දී මා සඳහන් කළ පරිදි සමාජ සවිබල ගැන්වීම ආර්ථික සාධකයට පමණක් ලඝු කොට දැක්වීම සුදුසු නොවන අතර සමාජ සංවර්ධනයේ දී සාකච්ඡා කරන සමාජ, ආර්ථික, දේශපාලනික, ආධ්‍යාත්මික හා අනෙතුත් සාධක කෙරෙහි ද අවධානය යොමු කළ යුතුව ඇත. ඉහත සාධක අතරින් ප්‍රධාන තැනක් ගනු ලබන්නේ දේශපාලන සාධකයයි. එයට හේතුව රටේ ප්‍රතිපත්ති සම්පාදනය හා අනෙකුත් සියලූම දේ දේශපාලන හා බැඳී පැවතීමයි. විශේෂයෙන් දේශපාලන විඥාණය පිළිබඳව ප්‍රජාව තුළ ඇත්තේද නිවැරදි සමාජ යථාර්ථය නොවන බව පැහැදි වන්නේ නිවැරදි නායකත්වයක් තොරා ගැනීමට ඔවුන් අපොහොසත් වීමයි. ශ්‍රී ලංකාවේ පවතින දේශපාලන ක්‍රියාවලිය ගත්විට පැහැදිළි වන්නේ පක්ෂ දේශපාලනය මූලික කරගත් පරම්පරාවෙන් පැවත ගෙන එන පක්ෂයකට තමන්ද අයිති බව සැලකීමයි. මේ නිසා පවතින යථාර්ථය තේරුම් ගෙන තම නායකත්වය තොරා ගැනීම පිළිබඳ ප්‍රජාව සවිබල ගැන්වීම රටක සංවර්ධනයට හේතු වේ. ජනතාව යැපුම් මානසිකත්වය තුළ ජීවිකාව ගෙනයාමට වඩා කැමැත්තක් දක්වන අතරම යමක් නොමිලේ ලබාදෙන විට ඒ කෙරෙහි නැඹුරුවී කටයුතු කරන ආකාරයක් පැහැදිළිව දක්නට ඇත. මේ නිසා මෙවැනි තත්ත්වයන් පිළිබඳව ජනතාව සවිබල ගැන්විය යුතුය. වර්තමාන සමාජ පරිසරයේ ක්‍රියාකාරීත්වය හා එහි වෙනස්වීම් විග්‍රහකර ගැනීමට සමාජ සවිබල ගැන්වීම උපකාරී වේ. පවතින සාරධර්ම, වටිනාකම් හා අගයයන් විග්‍රහකර ගනිමින් සමාජ යථාර්ථය තේරුම් කරගෙන තම පවුල නැමැති සමාජ ඒකකය තුළ වෙනසියාවක් කරගැනීම සවිබලකරණය තුළ සිදුවේ. මෙහි දී ගැටළු මොනවාද, එවා ඇතිවීමට හේතු හා ඒවාගේ ප්‍රමාණාත්මක බව විසඳුම් ක්‍රියාමාර්ග හා අවශ්‍ය සම්පත් පිළිබඳ දැනුවත් භාවයක් සමාජ බලගැන්වීම නිසා නිරන්තරයෙන් සිදුවේ

නාමිකව නිදහස ලබා දශක හතක් පසුකරමින් සිටින මේ මොහොතෙත් ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස පැවතීම කණගාටු දායක ත්ත්ත්වයක් බව සැවොම හඩ නගා කියනු ඇසේ. නමුත් ඒ සඳහා කළයුත්තේ

කුමක්ද ඒ සඳහා පවතින මානව, භෞතික හා මූල්‍ය සම්පත් අවභාවිතයෙන් තොර යොදවන්නේ කෙසේ ද යන්න පිළිබඳ යථාර්ථවාදී අවබෝධයක් නොමැති බව සෑම කටයුත්තකින්ම තහවුරු වේ. සංවර්ධනයේ නාමයෙන් ක්‍රියාත්මක ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘතිවල ස්වභාවය අනුවද පැහැදිලි වන්නේ එවා කොතෙක් දුරට රටේ සංවර්ධනයට දායක වෙනවාද නැත්නම් සමාජ යථාර්ථය විග්‍රහය තුල හඳුනාගනු ලැබූ ඒවාද යන්නයි.

මේ නිසා සමාජ සවිබල ගැන්වීම හුදෙක් දුප්පත් ප්‍රජාව  හා කාන්තාව මූළික වූ ක්‍රියාවලියක් නොව සමාජ යථාර්ථය තේරුම් නොගත් සෑම තරාතිරමකම පුද්ගලයන් සඳහා ක්‍රියාවට තැංවිය යුතු ක්‍රියාකරකමකි. තවදුරටත් මෙය පැහැදිලි කරනවානම් දුප්පත් ප්‍රජාවේ සිට සමාජ සංවර්ධනය පිළිබඳ තීන්දු තීරණ ගන්නාවූ තීරකයන් දක්වාම සමාජ සවිබල ගැනිවීම ප්‍රයෝජනවත් වනු ඇත.

ප්‍රජාව සවිබල ගැන්වීම විද්‍යාත්මක ක්‍රමවේදයක්වන අතර එය ක්‍රමාණූලව අදියරෙන් අදියර පුහුණු සම්පත්දායකයකුගේ මගපෙන්වීම මත සිදු කළ යුත්තකි. මෙය හුදෙක්ම මිනිසාගේ මනස හා බැඳුනු කාර්යයකි. මේ නිසාම ඉතාම ප්‍රවේශම්කාරී ආකාරයට මෙය සිදුකළ යුතුය. මේ සඳහා බුද්ධිකලම්භනය, සමාජ විර්ශනය. ඉගෙනුම් ක්‍රියාවලිය, අත්දැකීම් විග්‍රහය, ආවර්ජනය වැනි ක්‍රම ශිල්ප යොදා ගත හැක.

නිවැරදිව සමාජ යථාර්ථය අවබෝධ කර ගැනීම නිසා ප්‍රජාව තම ගැටළුවලට විසඳුම් ක්‍රියාමාර්ග ගැනීමට පෙළඹෙන අතරම වංචාව, දූෂණය, නාස්තිය, සූරා කෑමට ලක් නොවී ඊට විරුද්දව කටයුතු කිරීමට හා නැගී සිටීමට පෙළෙඹෙනු ඇත. මේ නිසා නිවැරදිව ජීවනෝපාය තොරාගැනීම, නිවැරදිව ආර්ථිකය හසුරුවා ගැනීම, නිවැරදි නායකත්වය තොරා ගැනීම ආදීය පිළිබඳ නිවැරදි තීන්දු තීරණ ගනු ඇත.

# සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය හා විපර්යකාරක කර්යයභාරය.

ජී.ජී.එස්. බණ්ඩාර

සංවර්ධනය යන්න ලෝකය හමුවේ ඇති අභියෝගාත්මක වචනයකි. මෑත සියවසකට ආසන්න කාලයක සිට වැඩියෙන් කථාබහ කරන සංවර්ධනය යන්න, ලෝකයේ රාජ්‍යන්වල සමාජ, ආර්ථික හා සංස්කෘතික ආදී තත්ත්වයන් ප්‍රකාශ කරන වචනයකි. සංවර්ධිත, සංවර්ධනය වෙමින් පවතින, ඌණ සංවර්ධිත, ආදී වචන සමාජ, ආර්ථික මට්ටම අනුව ලෝකයේ රටවල් වර්ග කිරීමට යොදා ගනී. ඒ අනුව සංවර්ධනය ලගාකර ගැනීමට රටවල් විවිධ ආකාරයේ ප්‍රයත්නයන් දරමින්, විවිධ උපක්‍රම අනුගමනය කරමින් සිටී. මෙහිදී ඉතා වැදගත් සංකල්පයක් ලෙස සහභාගීත්ව සංවර්ධන සංකල්පය, හඳුනාගත හැකිය. බොහෝ රටවල් කලක් තිස්සේ අනුගමනය කරනු ලැබූ විවිධ න්‍යායන්, සංකල්ප හා ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් ලෙස සහභාගීත්ව සංවර්ධන සංකල්පය ආරම්භ වූ බව කිව හැකිය. වර්තමාන සංවර්ධන ක්‍රියාවලියේදී විවිධ සමාජ, ආර්ථික, සංස්කෘතික, ආගමික, මෙන්ම පාරිසරික ආදී හේතු නිසා විශාල ජන කොටසක් ප්‍රධාන සංවර්ධන ධාරාවෙන් ගිලිහී යයි. එසේ නොමැති නම් සංවර්ධනයේ ප්‍රතිඵල අහිමිවී යයි, එලෙසම ප්‍රධාන සංවර්ධන ධාරාවට එකතු වීමට ශක්තිය නොමැතිව මග හැරී යයි. මෙවැනි මග හැරී යන ජන කොටස් ප්‍රධාන සංවර්ධන ධාරාව හා සම්බන්ධ කිරීමට ගන්නා උත්සාහය සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙහිදී ප්‍රධාන වශයෙන් සමාජ , ආර්ථික, සංස්කෘතික කරුණු කෙරෙහි පුද්ගල අවබෝධය පිළිබඳ සැලකිල්ලක් දක්වන අතර, විශේෂයෙන්ම මෙහිදී බලපාන පුද්ගල දැනුම, කුසලතා, ආකල්ප, කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වයි.

පුද්ගල දැනුම පිළිබඳව සාකච්ඡා කිරීමේදී, තමා වටා ඇති සමාජ, ආර්ථික, වටපිටාව පිළිබඳව ඇති දැනුම, මෙහිදී වැදගත් කොට සැලකේ. මෙහිදි තමා නිතර සම්බන්ධවන සමාජ, ආර්ථික, සංස්කෘතික, පරිසරය කෙරෙහි ඇති පුද්ගල දැනුම විශේෂිතයි. බොහෝ විට සහභාගීත්ව සංවර්ධනයේදී අප සලකා බලන ප්‍රධාන සංවර්ධන ධාරාවෙන් ගිලිහී ගිය පිරිස් තමා වටා ඇති පරිසර පද්ධතියේ අහිතකර බලපෑමට හසුවී ඇති බව තේරුම් ගන්නා දැනුමක් මේ පිරිස තුල ජනිත කිරීම මෙහිදී ප්‍රමුඛ වේ.

විශේෂයෙන්ම තමා පිළිබඳ ඇති ස්වයං අවබෝධය හා විශ්වාසය ඇති කරමින් මෙම දැනුම ලබාගැනීම වැදගත් වේ. සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලියේදී ආකල්ප සංවර්ධනයටද හිමි වන්නේ විශේෂිත වැදගත්කමකි. ආකල්ප යන්නෙන් බොහෝ විට පුද්ගලයන්, යම් කරුණක් පිළිබඳව හිතන ආකාරය හෝ හිතාගෙන සිටින ආකාරය සඳහන් කල හැකිය. සහභාගීත්ව සංවර්ධනයේදී ආකල්ප සංවර්ධනය ලෙස අප විශේෂිතව සලකන්නේ, සංවර්ධනය සඳහා සංස්කෘතික හෝ ආගමික කරුණු හේතුවෙන් සමාජය තුල, නැතිනම් ප්‍රජාව තුල ජනිත වී ඇති කාරණාය. ප්‍රධාන සංවර්ධන ධාරාවෙන් ඉවත් වූ පිරිස්වල සංවර්ධන ක්‍රියාදාමයට බොහෝ සෙයින් බලපා ඇති කාරණා අතර, සංස්කෘතික කාරණා ඉතා වැදගත් කොට සැලකිය හැකිය. මේ කාරණා හේතුවෙන් මේ පිරිස් විශාල වශයෙන් පීඩාවට මෙන්ම ගැටළු වලටද මුහුණ දී ඇත. නමුත් මෙම කාරණා ඉවත් කර ගත හැකි ඒවා බවත්, තමාගේ ආර්ථික හා සමාජ දියුණුවට එම කරුණු බාධා ඇති කරන බවත් ප්‍රජාවට ඒත්තු ගැන්වීම පහසු කාර්යයක් නොවේ. සහභාගීත්ව සංවර්ධනයේදී මේ පිරිසට අවාසිදායක ලෙස බලපා ඇති සංස්කෘතික කාරණා පිළිබඳව

ගැඹුරින් සහ විශ්ලේෂණාත්මකව සාකච්ඡා කිරීම සහභාගිත්ව සංවර්ධන ක්‍රියාදාමයේදී සිදු වන්නකි. විශේෂයෙන්ම පුද්ගලයන් තුල පවතින යැපුම් මානසිකත්වය සහ ඒ සඳහා බලපා ඇති හේතු මොනවාද ? ඒ හේතු ඉවත් කරන්නේ කෙසේද යන්න මේ තුල සාකච්ඡා කෙරේ.

කුසලතා, පිළිබඳව සැලකීමේදී තමා එදිනෙදා ජීවත්වීමට නිරත වී සිටින කාර්යය කෙරෙහි ඇති කුසලතාවය විශේෂ වේ. උදා: පෙදරේරුවෙක්, වඩු කාර්මිකයෙක්, ගොවියෙක්, කම්කරුවෙක් පිළිබඳ සැලකීමේදී තමාගේ ජීවන මාර්ගය තමා යෙදී සිටින රැකියා මත තීරණය වී ඇත. මෙම රැකියාව කෙරේ කුසලතා වර්ධනය කර ගැනීම, රැකියාවේ සුරක්ෂිතකමට, මෙන්ම වැඩි ආදායමක් ලැබීමට ද හේතුවන බව දැන ගත යුතුය. ඒ අනුව තමා කරන කාර්යය කෙරේ ඇති උනන්දුව, යාවත්කාලීන වීමට, ස්වාධීනව සිතීමට, ප්‍රගතිශීලීව සිතීමට, ප්‍රතිපල තාර්කිකව භුක්තිවිදීමට, වෙනස්කම් සැලසුම් කිරීමට, බොහෝවිට ප්‍රජාව අකමැතිය. තමන් නිරතවී සිටින කටයුතු වන්නාට වාදීව කරනවා විනා ඒ තුල ඉදිරියට යාමට නවතාවයන් කෙරේ යොමුවීමට, තරගකාරීත්වයට මුහුණු දීමට, මේ අය මැලිකමක් දක්වයි. තමා කරන කාර්යය තුළ තමාට ලැබෙන වාසි අවාසි තක්සේරුවකට යාමට ද මැළි කමක් දක්වයි. මේ නිසාම අවාසිසහගත තත්ත්වයන් සහ අහිමි වී යාම් පිළිබඳ සැලකිලිමත් ව කටයුතු කිරීමට හා ඒ පිළිබඳව විශ්ලේෂණාත්මකව බැලීමට හුරු පුරුදු කිරීම සහභාගීත්ව සංවර්ධන ක්‍රමවේදය තුල සිදුවන්නකි. සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයේදී සාකච්ඡා කරන තවත් වැදගත් කරුණක් වන්නේ සහභාගීත්වය යනුවෙන් කුමක් අදහස් කරන්නේද යන්නයි. බොහෝ විට ව්‍යවහාරයේදී සහභාගීත්වය යනුවෙන් අදහස් කරන්නේ, යම් කාර්යයක් සඳහා සහභාගීවීමයි. නමුත් සහභාගීත්ව සංවර්ධනයේදී මෙය තමා නිරතවන කාර්යය පිළිබඳව මූලිකව විශ්ලේෂණයකට පැමිණ, එම කාර්යයයේ සෑම අවස්ථාවක දී ම ප්‍රජාව සහභාගීවීම සහභාගීත්වය යනුවෙන් හඳුනා ගනී. උදා: ගමක සංවර්ධන වැඩක් පිළිබඳව පැවැත්වෙන රැස්වීමකට සහභාගී වූ ගැමියෙක් එහි ගොස් අත්සන් ලේඛනයේ අත්සන් තබා පිටුපසට වී වාඩිවී සිට, රැස්වීම අවසානයේ නිවසට පැමිණ අදාල සංවර්ධන කාර්යට තමා සහභාගී වූ බව පවසයි. සහභාගීත්ව සංවර්ධනයේදී එය සජීවී සහභාගීත්වය ලෙස නොසලකන අතර, අදාල සංවර්ධන කාර්යය සඳහා අදහස් මතුවන තැන සිට එහි අවසානය පසු විපරම දක්වා ඇති සියලු අවස්ථා පිළිබඳව අවබෝධයෙන් සක්‍රීයව කටයුතු කිරීම සහභාගීත්වය ලෙස හඳුනාගත හැකිය. විශේෂයෙන් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමට යාමේ දී ප්‍රධාන අවස්ථා කිහිපයක් පසු කිරීමට සිදුවේ. ඒ අනුව,

01.ගැටළුව හඳුනාගැනීම.

02. ගැටළුවට විසඳුම් තීරණය කිරීම.

03. අදාල විසඳුම සඳහා සැලසුම් කිරීම.

04. සැලසුම් ක්‍රියාත්මක කිරීම.

05. කාර්යය නිම වූ පසු ප්‍රතිඵල භුක්ති විඳීම.

06. එම ප්‍රතිඵල අනුව අදාල කාර්යය පිළිබඳ ගුණ දොස් සොයා බැලීම.

07. කාර්යය දිගටම ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් වැඩ පිළිවෙලක් හඳුනාගැනීම ආදී කරුණු රාශියක් කළ යුතුව ඇත.

කරුණු එසේ වුවත් වර්තමානයේ සිදුවන බොහෝ සංවර්ධන කාර්යයන් වලදී වැඩි වශයෙන්ම ප්‍රජාව සහභාගී වන්නේ ප්‍රතිඵල භුක්ති විඳීමටය. ඒ තුළ ප්‍රජාව යම් යම් ගැටළුද ඇති කරගන්නා බව අපට පෙනී යන කරුණකි.

අදාල කාර්යයන්වල ඉතිරි කොටස් පිළිබඳව දැනුමක් ඇත්තේ ඇතැම් විට අදාල කාර්යය සඳහා රජය මගින් සහභාගීවන නිලධාරියාට හෝ රාජ්‍ය නොවන සංවිධානයක් නම් අදාල සංවිධානය මගින් යොදවා තිබෙන පුද්ගලයාටය. නමුත් සහභාගීත්ව සංවර්ධනයේදී අදාල කාර්යයන් කිරීම සඳහා හඳුනාගන්නා ලද සියලුම අවස්ථාවලදී ප්‍රජාවගේ සහභාගීත්වය ලබාගැනීමට කටයුතු කරයි.

දැනට ක්‍රියාත්මක බොහෝමයක් සංවර්ධන ව්‍යාපෘති රජය හෝ රාජ්‍ය නොවන සංවිධාන මූල්‍ය දායකත්වය මත ක්‍රියාත්මක වේ. මේ නිසාම මෙම ආයතන හෝ සංවිධාන විසින් තම අභිමතවය පරිදි මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, තම ආයතනයේ හෝ සංවිධානයේ අරමුණු පිළිබඳව මෙහිදී විශේෂයෙන් සැලකිලිමත් වන අතර, ප්‍රජාවගේ අරමුණු හා අවශ්‍යතා පිළිබඳව සොයා බැලීම අවම මට්ටම පවතී. ඊට හේතුව මේවා සඳහා මූල්‍ය මෙන්ම ශ්‍රම සැපයුම ද මේ සංවිධානවල වියදමෙන්ම සිදුවන බැවිනි. නමුත් ප්‍රජාවට ඇති ගැටළු සඳහා විසඳුම් හඳුනාගැනීම මූලික වශයෙන්ම ප්‍රජාව විසින්ම කළයුතු එකකි. එසේ වුවහොත් ප්‍රජාවගේ දැවෙන ගැටළු සඳහා විසඳුම් ඒ තුල ලැබෙනු ඇත. ඒ සඳහා ආරම්භය ප්‍රජාව විසින්ම ගතයුතු අතර, තමන් සතු සම්පත් වලින් මෙම කාර්යයන් ආරම්භ කිරීම මෙහිදී අදහස් කෙරේ. ප්‍රජාව සතුව ප්‍රධාන වශයෙන් සම්පත් වර්ග 03 ක් හඳුනාගත හැක. ඒ අනුව භෞතික සම්පත්, (ජලය, වාරිමාර්ග, භූමිය.) ආයතනික සම්පත් (පාසැල, ක්‍රීඩා සමාජය, ප්‍රජාසංවර්ධන සමිතිය) මානව සම්පත් ( විධිමත් නායකයින්- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය, ගුරුවරු, සංවර්ධන නිලධාරි, අවිධිමත් නායකයින්, ස්වෙච්ඡා සමිති නායකයින්, ගොවියන්, ආදී) මීට අමතරව මුදල්, උපකරණ , යන්ත්‍ර සූත්‍ර, ආදිය මෙන්ම ප්‍රජාව සතු දැනුමද මේ සඳහා ප්‍රයෝජනයට ගත හැකිය. එසේ වුවහොත් ප්‍රජාව සතු දැනුම, කුසලතා, ආකල්ප වෙනස්වනු ඇත. ඒ තුල ලබන පන්නරය, තවත් කාර්යයක ආරම්භයක් වනු ඇත. එසේ විශ්වාස කොට "ස්වශක්තියට" සහ සහභාගිත්වයට , මුල් තැන දීම සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයේ මූලික ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකිය. එසේ වුවත්, කාර්යයන් වලදී බාහිර පාර්ශව වලින් ලබාදෙන ආධාර ලබා නොගෙන සිටිනවා යන්න ඉන් අදහස් නොවන අතර, තමන් සතු සම්පත් වලින් කටයුතු ආරම්භ කල පසු එහි වැඩි දියුණුවට බාහිර පාර්ශව ලබා දෙනු ලබන ආධාර ගලපා ගත්තද වරදක් නැත. නමුත් බාහිර ආධාර අපේක්ෂාවෙන්ම කටයුතු ආරම්භ කිරීම මින් අදහස් නොකෙරේ.

සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයේ තවත් සුවිශේෂී ලක්ෂණයක් ලෙස, තම ගැටළු වටා ප්‍රජාව සංවිධානගත වීම දැක්විය හැකි අතර, ඒ තුල ප්‍රජාව තමන් මුහුණ දෙන ගැටලු සඳහා විසඳුම් සෙවීමට ශක්තිය ගොඩනගා ගනී. බොහෝවිට ග්‍රාමීය ප්‍රජාව තනි තනිව හුදකලා වී සිටිනතාක් කල් එහි වාසිය, වරප්‍රසාද ලත් ජනකොටස් විසින් හිමිකරගනී.

ඒ සඳහා වරප්‍රසාද අහිමි වූවන්ගේ සංවිධාන තලය පුළුල් කිරීම සහභාගිත්ව සංවර්ධනයේදී සාකච්ඡා කරන සුවිශේෂී කරුණකි. බොහෝවිට දැනට ග්‍රාමීය මට්ටමේ ක්‍රියාත්මක සංවර්ධන වැඩ බාහිර (රජයේ හෝ රාජ්‍ය නොවන) පාර්ශවයන් මුදල් නොයෙද වුවහොත් ක්‍රියාත්මක නොවන තත්වයක් පවතී. එලෙසම ප්‍රජාවගේ එක් ගැටලුවක් සඳහා යම් විසඳුමක් බාහිර පාර්ශව විසින් ලබා දුන්නද, එහි නඩත්තු වැඩ පිළිවෙලක් හෝ ඒ පිළිබඳ සොයා බැලීමක් සිදුවන්නේ කලාතුරකිනි. සහභාගිත්ව සංවර්ධනයේදී මෙවැනි කාර්යයන් පිළිබඳ නිතර නිතර සොයා බලන අතර නිරන්තරව ප්‍රජාව රැස්වී දැනුවත් වීම් සිදුවේ. නිරන්තර දැනුවත් වීමේ ක්‍රියාවලියක් තිබීමද, සහභාගිත්ව සංවර්ධනයේදී දැකිය හැකි තවත් සුවිශේෂී ලක්ෂණයකි

සහභාගිත්ව සංවර්ධනයේදී ප්‍රජාව තම ගැටලු හා ප්‍රශ්න පිළිබඳ නිරන්තරව සාකච්ඡා පවත්වන අතර, එවැනි තත්ත්වයක් ඇතිවීමට විශේෂ පෙළඹවීමක අවශ්‍යතාවය පවතී. සාම්ප්‍රදායිකව සිදුවන සංවර්ධන කටයුතු වලදී,

රජයේ හෝ බාහිර පාර්ශවයක් විසින් හඳුනාගත් ඉලක්ක වෙත යාම සඳහා සැලසුම් සකස් කරන අතර බොහෝ විට රාජ්‍ය නිලධාරියා මේ සඳහා මැදිහත්වී කටයුතු කරයි. මොහු බොහෝවිට කටයුතු කරන්නේ ඔහුට පැවරුණු ඉලක්ක මත හා අණපනත්, නීතිරීති, රෙගුලාසි මතයි. එලෙසම ඔහු ඒ සඳහා රජය විසින් ඔහු වෙත ලබා දී ඇති උපදේශන වලට අනුකූලව කටයුතු කරයි. නමුත් ප්‍රජාවට වගවෙන ප්‍රජාවගේ අවශ්‍යතා අනුව කටයුතු කිරීමට නම් ප්‍රජාව ගේ පැත්තෙන් සිතන ඔවුන්ගේ වුවමනා එපාකම් හඳුනාගත් පුද්ගලයෙකු සහභාගිත්ව සංවර්ධනයේදී සිටී. ඔහු මැදිහත්කරු ලෙස හඳුනා ගත හැකිය.

සහභාගිත්ව සංවර්ධනයේදී මැදිහත්කරු නැතහොත්, සජීවිකාරක, විපර්යය කාරක, ආදී නම් වලින් හඳුන්වන මොහුගේ කාර්යය සුවිශේෂී එකකි. ප්‍රධාන සංවර්ධන ධාරාවෙන් බැහැර වූ ආන්තීකරණයට ලක් වූ ප්‍රජාව සමග වැඩ කිරීමේදී මෙම මැදිහත්කරු භූමිකාව නැතිවම බැරිය. විවිධ හේතු නිසා සමාජයේ අගතියට පත්වූ මෙම පිරිස් සක්‍රිය සමාජ ක්‍රියාකාරීන් කරවීමේ කාර්යය ඔහුට පැවරී ඇත. මොහුගේ කාර්යය වඩාත් හොඳින් කිරීමට නම් මොහු සතු දැනුම, කුසලතා සහ ආකල්ප, ඉතාම වැදගත් වේ. ඊට හේතුව මෙම කාර්යය සාම්ප්‍රදායික රැකියාවෙන් එහා කාර්යයක් වන බැවිනි. බොහෝ විට විධිමත් රැකියා සඳහා ආයතනයකින් ගොඩනැගූ විෂය මාලාවක් මා උපදෙස් ආදිය තිබුනත් මැදිහත්කරුවෙකුට එසේ ගොඩනැගුණු උපදෙස් මාලාවක් හෝ කාර්යය සමුදායක් නැත. අක්‍රීයව පවතින සමාජ ස්ථරයක සිටින පුද්ගලයන්ගේ හෝ පුද්ගල කණ්ඩායම් වල විභවතාවයන් හඳුනා ගනිමින්, ඒවා ඔප්නංවමින් සක්‍රිය පුද්ගල කණ්ඩායම් බවට පත්කිරීම මොහුගේ ප්‍රධාන කාර්යය වන්නේය. සමාජහිතවාදී ආකල්ප හා සමාජ දැනුම මෙහිදී ඉතාම වැදගත්වන අතර පුද්ගලයන් හා ප්‍රජාව නිවැරදි දිසාවකට යොමුකිරීම සඳහා මොහුගේ දැනුමද ඒ ලෙසටම වැදගත්ය. සෑම පුද්ගලයෙකු තුලම කිසියම් හැකියාවක්, විභවයක් එසේ නැතිනම් ශක්තියක්, ඇති බව සෑම විටම මැදිහත්කරු විශ්වාස කරන අතර, විවිධ සමාජ බලවේග නිසා ඒවා යටපත් වී ඇති බවක්ද, ඔහු විශ්වාස කරයි. ඒ අනුව අදාල ප්‍රජාවට, නැතිනම් පාර්ශවයන්ට නිසි පිළිගැනීම, ඇගයීම ලබා දෙමින් ඔවුන් පුබුදුවාලීම මැදිහත්කරුගේ වගකීම හා කාර්යය වන්නේය.

එලෙසම තත්කාලීන සමාජය නොයෙකුත් විෂමතාවලින් හෙබි එකක් වන අතර, මෙම බොහෝමයක් විෂමතා වලට හේතුව මිනිසුන් විසින්ම නිර්මානය කල ඒවා වන අතර, ඒ සඳහා ස්වභාවික හේතුන්ද පවතී. මෙම හේතුන් අවම කිරීමේ අදහසින් ප්‍රජාව හා පුද්ගලයන් දැනුවත් කිරීම මැදිහත් කරුගේ ප්‍රධාන කාර්යයකි.

මේ හේතුන් නිසාම සමාජය වැඩි පිරිසකට අඩු සම්පත් ප්‍රමාණයකුත්, වැඩි සම්පත් ප්‍රමාණයක් අඩු පිරිසක් අතරේ බෙදී යන බවත් මැදිහත්කරු අවබෝධ කරගෙන සිටී. ඒ අනුව මෙම විෂමතාවය අවම කිරීමේ අදහසින් ප්‍රජාවගේ ගැටළු හඳුනාගෙන ප්‍රජාවට අවබෝධ කරමින් ඒවා විසඳීමට උදවු කරයි. මීට අමතරව විවිධ කුසලතාවලින් හෙබි මැදිහත් කරුවෙකු සතු කුසලතා අතර පවතින සමාජතත්වය අවබෝධ කර ගනිමින් ප්‍රජා ගැටළු හඳුනාගෙන ඒවා විසඳීමට ප්‍රජාව මෙහෙයවීම මැදිහත්කරුවෙකු සතු ප්‍රධාන කාර්යයක් වේ. ආරම්භයේ දී මෙවැනි ක්‍රියාවලියක් සිදු කිරීම අසීරු වුවත්. ප්‍රජාව සමග කරන සෑම සංවර්ධන පියවරකදීම ප්‍රජාවට පහසුකම් සපයමින්, මගපෙන්වමින්, ක්‍රියාත්මක වීම මැදිහත්කරු කාරයයභාරයයි. තීරණ ගැනීම, සන්නිවේදනය, නිරීක්ෂණය, කාල කළමනාකරණය, නිර්මාණශීලි බව, සමානාත්මතාව, ප්‍රජාව ධෛමත් කිරීම, ආදී ගුණාංග මැදිහත්කරු සතුවිය යුතුය. සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලියේ දී මැදිහත්කරු භූමිකාව අසීරු කාර්යයක් වුවත් ප්‍රජාව තම ජයග්‍රහන අත්පත් කරගනිමින් ඉදිරියට යාමේදි මැදිහත්කරු අසිමිත සතුටක් භුක්තිවිඳී.

# වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිකරණය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් මතුවී තිබෙන්නේ ඇයි ?

සුභානි පියසිංහ

අතීතයේ සිටම ශ්‍රී ලංකාව කෘෂිකාර්මික අර්ථ ක්‍රමයක් පැවති රටකි. අතීතයේ මිනිසුන් සිය ප්‍රධාන ජීවනෝපාය වශයෙන් කෘෂිකාර්මික කටයුතු වල නිරත විය. සාමාන්‍ය වශයෙන් ගත් කළ, කෘෂිකර්මය ලෙස හඳුන්වන්නේ බෝග වගා කිරීම, අස්වනු නෙලීම, සැලසුම් සහගත ජල සම්පාදනය හා සත්ත්ව පාලනය ආශ්‍රිත කටයුතුය. කෘෂිකාර්මික කටයුතුවල ආරම්භය පිළිබඳව නිශ්චිත කාල වකවානුවක් දැක්වීම ඉතා අපහසු වුවත් ක්‍රි.පූ. 9000 දී පමණ ගිණිකොන දිග ආසියාවේ පුරාණ මිනිසුන් මස් සපයා ගැනීම සඳහා සතුන් ඇතිකර තිබෙන බවටත් ඊට පසු කාලයේදී ඔවුන් විසින් තෘණ බිම්වල සුදුසු තැන්වල ධාන්‍ය බීජ වගා කිරීමට පටන්ගෙන ඇති බවට සාක්ෂි හඳුනාගෙන ඇත. ඒ අනුව කෘෂිකාර්මික කටයුතුවල ආරම්භය දැනට අවුරුදු දසදහසකට පමණ පෙර සිදුවී ඇති බව පෙනේ.

කෘෂිකාර්මික අලෙවිකරණයේ ආරම්භය කෘෂිකර්මයේ ආරම්භයේ පසුව සිදුවී තිබේ. ආදි කාලීන මිනිසුන් තමන්ගේ මූලික අවශ්‍යතාවයන් තමන් ම සපුරා ගන්නා ලද අතර අවශ්‍ය ආහාර ද්‍රව්‍ය තමන් විසින් ම නිපදවා ගන්නා ලදී. ක්‍රමක්‍රමයෙන් මිනිසාගේ අවශ්‍යතා හා වුවමනාවන් සංකීර්ණ වෙත් ම ඒවා ඉටුකර ගැනීම සඳහා විවිධ ක්‍රමයන් සොයන්නට විය. දඩයමින් සපයා ගන්නා ආහාර වලට වඩා වැඩි ආහාර ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතුවල නිරත වූවන් විසින් නිපදවන්නට වූ අතර එම අතිරික්ත නිෂ්පාදනය තවත් අය සමග හුවමාරු කරගැනීම තුළින් (Barter System) තමන්ගේ ඉටුනොවූ ආහාර පිළිබඳ අවශ්‍යතා හා වුවමනාවන් සපුරා ගන්නට විය. මුදල් භාවිතය ආරම්භ වීමත් සමග මෙම අතිරික්ත නිෂ්පාදන මුදලට හුවමාරු කරගැනීම ආරම්භ විය.

වැඩි වැඩියෙන් කෘෂිකාර්මික බෝග වගාව වෙත යොමුවීම නිසා නිෂ්පාදනය වැඩිවීමත්, අතිරික්ත නිෂ්පාදන හුවමාරු කරගැනීමත් ඉන් පසු එම නිෂ්පාදන මුදලට හුවමාරු කර ගැනීමත් සමග කෘෂිකාර්මික අලෙවිකරණයේ ආරම්භය සිදුවිය. කල් යත්ම එතෙක් පැවති කෘෂිකාර්මික අලෙවිකරණය ක්‍රියාවලියක් බවට පත්විය. පුළුල් අර්ථයෙන් ගත්කල ගොවීන් සඳහා කෘෂි අමුද්‍රව්‍ය සැපයීමේ පටන් ඵලදාව ගොවිපළේ සිට අවසන් පාරිභෝගිකයා අතට පත්කිරීම දක්වා වූ ක්‍රියාවලිය කෘෂිකාර්මික අලෙවිකරණය යනුවෙන් හඳුන්වනු ලබයි.

අලෙවිකරණය හෙවත් අලෙවි කළමනාකරණය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ආයතන හා පුද්ගලයන් එම කාර්යය ඵලදායී ලෙස සිදුකරගෙන යාම සඳහා අලෙවි කළමනාකරණ සංකල්ප ප්‍රායෝගිකව භාවිතා කරනු ලබයි. වෙළඳපොළ තුළ තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දෙමින් තම වෙළඳපොළ කොටස රැකගැනීමට හා වර්ධනය කර ගනිමින් රැඳී සිටීමටත් අලෙවි කළමනාකරණය ඉතාමත් වැදගත් වේ. කෘෂිකාර්මික නිෂ්පාදන සම්බන්ධයෙන් ද එය එසේම බලපානු ලබයි.

කෘෂිකාර්මික අලෙවිකරණය කාර්යයන් කිහිපයකින් සමන්විත වේ. එනම් ;

1. කෘෂිකාර්මික යෙදවුම් නැතිනම් අමුද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම හා සැපයුම තක්සේරු කිරීම

2. අස්වැන්න නෙලීමෙන් අනතුරුව කෘෂි බෝග හා සත්ත්ව නිෂ්පාදන සම්බන්ධ කාර්යයන් හැසිරවීම

3. ගොවිපලේ සිට පිරිපැහැදුම නැත්නම් නිෂ්පාදනාගාරය දක්වා හෝ අවසාන පාරිභෝගිකයා දක්වා සියළුම කෘෂි නිෂ්පාදිතයන් බෙදාහැරීමේ ක්‍රියාවලීන් හා සම්බන්ධිත සියළුම ක්‍රියාවන්

4. කෘෂි භෝග හා සත්ත්ව නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම තක්සේරු කිරීම

5. ප්‍රතිපත්ති හා වැඩසටහන් තක්සේරු කිරීම එනම් මිලකරණය, මෙහෙයවීම, මිලදී ගැනීම හා කෘෂි නිෂ්පාදන හා අමුද්‍රව්‍ය අලෙවි කිරීම හා ප්‍රවර්ධනය සම්බන්ධිත සමස්ත ක්‍රියාවලිය ම ක්‍රියාත්මක කිරීම

යනාදිය වේ.

ශ්‍රී ලංකාව අතීතයේ සිටම කෘෂිකාර්මික අර්ථ ක්‍රමයක් පවතින හෙයින් කෘෂිකාර්මික අලෙවිකරණය කෙරෙහි අවධානය යොමුකිරීම ඉතාමත් වැදගත් වේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ ආරම්භය විජය කුමරුගේ ආගමනයත් සමග සිදුවූ බවත්, ගංගා නිම්න ආශ්‍රිතව ජනාවාස බිහිකර ගනිමින් කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ බවත්, ලිඛිත ඉතිහාසයේ සඳහන් වේ. එසේම අතීතයේදී ශ්‍රී ලංකාවේ ස්වයංපෝෂිත කෘෂි ආර්ථික ක්‍රමයක් තිබූ බවත්, වැව් අමුණු ඉදිකරමින් ඊට අවශ්‍ය යටිතල පහසුකම් සැපයූ විශිෂ්ඨ වාරිකර්මාන්තයක් පැවති බවත් සඳහන් වේ. මහා පරාක්‍රමබාහු රජු දවස මෙරටින් ඉන්දියාවට සහල් අපනයනය කිරීමත්, ශ්‍රී ලංකාව " පෙරදිග ධාන්‍යාගාරය" ලෙස විරුදාවලී ලබා තිබීමත්, මගින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිකරණය හොඳින් ක්‍රියාත්මක වූ බව මනාව පැහැදිලි වේ.

ආසියාවේ සංවර්ධනය වන අනෙකුත් රටවල් මෙන්ම ශ්‍රී ලංකාවේද ආර්ථිකය කෘෂි නිෂ්පාදන අලෙවිය මත රඳා පැවතුණි. නමුත් වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය භූමිය, අමුද්‍රව්‍ය සපයා ගැනීම, නිෂ්පාදනය, මිලකිරීම, බෙදාහැරීම විකිණීම, හා ප්‍රවර්ධනය යන මුළු කෘෂිකාර්මික අලෙවිකරණ ක්‍රියාවලියම තුළ විවිධාකාර ගැටළු මතුවී තිබේ. ක්‍රමිකව වර්ධනය වූ මෙම ගැටළු අදවන විට මහා අර්බුධ දක්වා වර්ධනය වෙමින්පවතින බව ගොවීන්ගේ හා පාරිභෝගිකයන්ගේ හැසිරීම, ප්‍රකාශ, පුවත්පත් හා ප්‍රවෘත්ති වාර්තා මගින් මනාව පැහැදිලි වේ.

සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් මෑතක් වනතුරුම ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයෙන් සිදුවන දායකත්වය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතුනත් පසුගිය වර්ෂ කීපය තුළ කෘෂිකාර්මික නිෂ්පාදනය ඉතා වේගයෙන් පහළ මට්ටමකට වැටෙමින් පවතී. මහ බැංකු වාර්තාවලට අනුව 1960 දශකය මුලදී දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය 40% ක් විය. 1990 වසරේදී එය 23% ක්ද 1994 වසරේදී 20% ක්ද 2000 වර්ෂයේදී 19.7% ක්ද 2019 වසරේදී 7% ක්ද වශයෙන් දායකත්වය ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. රටක අපනයන ආදායම එහි ආර්ථික වර්ධනය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කරනු ලබයි. කෘෂිකාර්මික අර්ත ක්‍රමයක් පැවති ශ්‍රී ලංකාවේ අපනයන ආදායමෙහි ප්‍රමුඛ ස්ථානය හිමිව තිබුණේ කෘෂිකර්මාන්තයටයි. නමුත් 1977 න් පසු අපනයනයට යොමු වූ කාර්මීකරණ ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අපනයන ඉපයුම්වල වැදගත්කම අඩුවී කාර්මික අපනයන ඉපයුම්වල වැදගත්කම වැඩිවී ඇත. මේ හේතුවෙන් අතිරික්ත කෘෂි නිෂ්පාදන අලෙවි කර ගැනීමට නොහැකි වූ අතර ඒවා අපතේ දැමීමට හෝ පුළුස්සා දැමීමට සිදුවිය. මෙම තත්ත්වය කෘෂිකර්මාන්තය සිය ජීවනෝපාය කරගත් ග්‍රාමීය ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කරන ලදී. වෙනත් රැකයාවන් කෙරෙහි යොමුවීමට නොහැකි කෘෂිකර්මාන්තය ජීවනෝපාය කරගත් 65% - 70% පමණ වූ පිරිස කිසිදු ආදායම් මාර්ගයක් නොමැතිව රජයේ සහනාධාර මත යැපෙන්නන් බවට පත්ව තිබේ. කෘෂිකර්මාන්තයෙන් ඈත්වී සිටින මෙම ග්‍රාමීය ප්‍රජාව සවිබල

ගන්වා නැවත ස්වශක්තියෙන් නැගී සිටීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම තුළින් ග්‍රාමීය දිළිඳුබව අවම කිරීම සඳහා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිකරණය සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

රටක සංවර්ධනයට එරටේ ශ්‍රම බලකායෙහි සේවා නියුක්ත ප්‍රමාණය බෙහෙවින් ම බලපානු ලබයි. ශ්‍රම බලකායෙහි සේවා ව්‍යුක්තිය වර්තමානයේ ශ්‍රී ලංකාව මුහණ දි සිටින ප්‍රධාන ගැටළුවක් වේ. මෙරට විරැකියාවෙන් පෙළෙන තරුණ පිරිස ඉතා ඉහළ අගයක් ගනී. මෙයට විසඳුම් ලෙස රාජ්‍ය හා පෞද්ගලික අංශ තුළ විශාල වශයෙන් සේවා නියුක්ති ඉඩ ප්‍රස්ථාවන් බිහිවේයැයි අපේක්ෂා කළ නොහැකි අතර ඒ සඳහා ස්වයං රැකියා මත දැඩි රැදියාවක් දැක්වීමට සිදුවී ඇත. ග්‍රාමීය අංශය තුළ ඒ සඳහා පදනම් කරගැනීමට සිදුවන්නේ කෘෂිකාර්මික අංශයයි. ශ්‍රී ලංකාවේ මුළු සේවා නියුක්තියෙන් වැඩි ප්‍රතිශතයක් සේවා නියුක්තව සිටිනුයේ කෘෂිකාර්මික අංශය තුළය. කෘෂිකර්ම. සත්ත්ව පාලන සහ ධීවර අංශයන්හි සේවා නියුක්ති ප්‍රතිශතය 1990 වසරේදී මුළු සේවා නියුක්තියෙන් 47.7% ක්ද 1995 වසරේදී 36.9% ක්ද 2000 වසරේදී 28.6% ක්ද 2019 වසරේදී 25.3% ක්ද විය. ග්‍රාමීය අංශය තුළ මෙතෙක් ප්‍රෙයා්ජනයට නොගත් කෘෂිකාර්මික සම්පත් ප්‍රෙයා්ජනයට ගනිමින් ස්වයං රැකියා ඉඩ ප්‍රස්ථාවන් බිහි කරමින් සේවා වියුක්ති ප්‍රශ්න විසදා ගනිමින් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවා ආර්ථික සංවර්ධනයක් ඇති කළ හැකිය. නමුත් මෙරට විරැකියාවෙන් පෙළෙන තරුණ පිරිස කෘෂිකාර්මික අංශයට යොමුවීම ඉතා අවම මට්ටමක පවතී. කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමේදී ගොවීන්ට මුහුණ දීමට සිදුවන දුෂ්කරතා , ඒ සඳහා සාධාරණ මිලක් නොලැබීම යන කරුණු නිසා තරුණ පිරිස මින් ඈත්වී ඇත. නමුත් පාරිභෝජනයට අමතරව ඉහළ ආදායමක් ලබාගැනීමට හැකිවන පරිදි කෘෂිකාර්මික අලෙවිකරණය දියුණු කළහොත් ඔවුනට හොඳ ජීවන තත්ත්යවක් ළඟාකරගත හැකිවාක් මෙන්ම සේවා වියුක්ති ගැටළුව විසදීම තුළින් රටේ ආර්ථික සංවර්ධනයද ඇතිකර ගැනීමට හැකි නිසාත් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිකරණය සංවර්ධනය අත්‍යවශ්‍ය වේ.

පොහොර, බීජ, කෘමි නාශක වැනි කෘෂිකාර්මික යෙදවුම් නිසි කලට ලබාගැනීමට නොහැකි වීම හා අධික වියදමක් දැරීමට සිදුවීම , ශ්‍රම හිගය හා ඒ සඳහා අධික වියදමක් දරා නිපදවන කෘෂි නිෂ්පාදන අලෙවි කර ගැනීමට නොහැකි වීමෙන් ගොවීන් පීඩාවටත් කළකිරීමටත් පත්ව සිටිති. මෙයට බලපෑ ප්‍රධානතම හේතුව වූයේ වෙළඳපොළ පදනම් කරගත් වගා රටාවකට අපේ කෘෂි වගා කරුවන් හුරු වී නොතිබීමයි. ඊට පෙර කන්නයේ හොඳ මිලක් ලැබූ බෝග වගාකර අස්වනු නෙලාගැනීමෙන් පසුව වෙළඳපොළ සොයා යාම ඔවුන්ගේ පාරම්පරික අලෙවි ක්‍රමය විය. මෙම පුමය ඔවුන්ට වඩාත් අවාසිදායක තත්ත්වයක් ඇතිකරන ලදී. ඒ අනුව මෙම සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැරව අලෙවිය පදනම් කරගත් කෘෂි ව්‍යාප්ති ක්‍රමයක් තුළින් ගොවීන්ට යම් ආකාරයක වෙනස් අත්දැකීමක් හා ස්ථිර ආදායම් මාර්ගයක් ලැබීම සඳහා කෘෂිකාර්මික අලෙවිකරණය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් මතුවී තිබේ.

ශ්‍රී ලංකාව තුළ මෙන්ම ඉන් පිටතදීත් කෘෂි නිෂ්පාදන සම්බන්ධයෙන් ඇතිවන තරගයට මුහුණ දීමට මෙන්ම වෙනත් ආදේශන වලට මුහුණ දීමටද කෘෂි නිෂ්පාදකයින්ට සිදුවේ. නමුත් ගුණාත්මක කෘෂි නිෂ්පාදන වෙළඳපොල වෙත යොමුකිරීම තුළින් චිරස්ථායී කෘෂිකාර්මික සංවර්ධනයක් ඇතිකළ හැකිය. නව තාක්ෂණික ක්‍රම සමග අලෙවි ප්‍රවර්ධන කටයුතු යොදාගනිමින් කෘෂි නිෂ්පාදකයින් හා ගැනුම්කරුවන් අතර සමීප සම්බන්ධතාවයක් ඇතිකරගත හැකිය. මේ සඳහා මෙරට කෘෂිකාර්මික අලෙවිකරණය සංවර්ධනය කළයුතු වනවා මෙන්ම කෘෂි නිෂ්පාදන අලෙවි කර ගැනීමේදී වර්තමානයේ පවතින අවදානම අඩුකර ගැනීමටද කෘෂිකාර්මික අලෙවිකරණය සංවර්ධන කිරීමේ අවශ්‍යතාවයක් මතුවී තිබේ.

ගංවතුර, නියග සහ වන සත්ත්ව උවදුරු වැනි ස්වභාවික ආපදාවන් , වගාවන් වලට ඇතිවන වසංගත රෝග, පොහොර. කෘමි හා වල් නාශක යොදා ගැනීම නිසා ඇතිවන අහිතකර තත්ත්වයන්. ඉඩම් කැබලි කිරීම හා ගොඩකිරීම, නව තාක්ෂණික දැනුම නොමැති වීම හා යන්ත්‍ර උපකරණ හිගකම හා භාවිතයට දැනුම නොමැතිකම, ගබඩා පහසුකම් නොමැති වීම හා තිබෙන ඒවා ප්‍රමාණවත් නොවීම හා පහසුකම් අඩුවීම, ප්‍රවාහන හා ඇසුරුම් ගැටළු සහ අතරමැදි ග්‍රහනයට හසුවීම වැනි ගැටළු වලට සාර්ථකව මුහුණ දීම සඳහාත් කෘෂිකාර්මික අලෙවිකරණය සංවර්ධන කිරීමේ අවශ්‍යතාවයක් මතුවී තිබේ.

වර්තමානයේ පැතිර යමින් පවත්නා කොරෝනා වසංගත තත්ත්වය හමුවේ පනවනු ලබන සංවරණ හා නිරෝධායන නීතිරීති හේතුවෙන් කෘෂි නිෂ්පාදකයින්ට, විකුණුම්කරුවන්ට සහ පාරිභෝගිකයන්ට ඇතිවී තිබෙන බලපෑම නිසා ජනතාව කෘෂිකර්මය කෙරෙහි දක්වන නැඹුරුතාවය ඉහළ යමින් තිබීමද කෘෂිකාර්මික අලෙවිකරණ ක්‍රියාවලිය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය වඩාත් තීව්‍ර කරවයි.

# වර්තමාන පසුබිම තුළ වෘත්තීය සමාජ වැඩකරුගේ සමාජ ආර්ථික කාර්යභාරය හඳුනා ගනිමු.

ඩී.ඒ. ප්‍රේමානි දාස්වත්ත

සමාජයේ පැවැත්මට බාධාකාරී ලෙස සිදු වන්නා වූ සංසිද්ධීන් අතර අනපේක්ෂිත ලෙස සිදු වන්නා වූ ආපදාවන් (disasters) බහුල කාලපරාසයක් ලෙස වර්තමානය හඳුන්වා දිය හැකිය. ආපදාවන් ස්වාභාවික ආපදා සහ විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ආපදා ලෙස ප්‍රධාන කොටස් දෙකකි. ආපදා අවස්ථාවක් ප්‍රජාවට ගැටළුකාරි තත්ත්වයක් ඇති කරන්නේ එය සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, ආගමික සංස්ථාවන්ගේ පැවැත්මට හානි කර තත්ත්වයක් ඇති කරන බැවිනි. ආපදා අවස්ථාවන්ට ගොදුරු වන්නන් කායිකව හා මානසිකව අසරණ භාවයට පත්වේ. මෙබඳු අවස්ථාවන් ජය ගැනීමට නම් සමාජයේ අනෙකුත් සාමාජිකයන්ගේ සහාය අත්‍යවශය වේ. සමස්ථ ආයතන පද්ධතිය බිඳවැටී ඇති අවස්ථාවක පුද්ගලයාට තනිව නැගී සිටිය නොහැකි අතර සමාජ පැවැත්ම තහවුරු කිරීමට විවිධ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක විය යුතුය.

"මේ මොහොත වන විට ලෝකයේ කොතනක හෝ කිසියම් සේවා ග්‍රාහකයෙක් සමාජ වැඩකරුවෙකු මුණ ගැසීම සඳහා අරගලයක යෙදෙමින් සිටී. නොඑසේනම් සමාජ වැඩකරුවෙකු සේවා ග්‍රාහකයෙකු හමු වීම සඳහා එම නිවස කරා යමින් සිටියි. එසේත් නැතහොත් සමාජ වැඩකරුවකු සිය සේවා ග්‍රාහක කණ්ඩායම හෝ සේවා ග්‍රාහක ප්‍රජාව සමඟ කිසියම් ප්‍රජා කාර්යයක යෙදී සිටියි. මෙකී සමාජ වැඩකරුවා විසින් සමාජයට කිසියම් ප්‍රයෝජනවත් දෙයක් කරමින් සිටින්නේයැයි මිනිසුන් විසින් පිළිගනු ලබති. බොහොමයක් සමාජයන්හි මෙවැනි සමාජ වැඩ නිරන්තරයෙන්ම සිදු වෙමින් පවතී."

ඉහත පාඨය මැනවින් විග්‍රහ කිරීම තුළ සමාජ වැඩ යන වෘත්තිමය ක්‍රියාකාරකම කරනුයේ කවුරුන් විසින් කවුරුන් සමඟ ද, කවුරුන් සඳහාද, සහ එය හඳුනා ගන්නේ කෙසේද, යන්න පිළිබඳ අදහසක් ලබා ගැනීමට හැකියාව ලැබේ.

සමාජ වැඩ යනු ස්වෙච්ඡා (voluntary), පුණ්‍යාධාර (Charity), හෝ පරහිතකාමී (Philanthrophic) කටයුත්තක් ඔස්සේ කරනු ලබන පුද්ගල හෝ ප්‍රජා සේවාවක් යැයි සිතීමට ලංකා සමාජය තුළ අප පුරුදුව සිටී. එහෙත් විධිමත් වෘත්තීය සමාජ වැඩ (Professional Social Work) යනු "පුද්ගලයා, පවුල, සමාජ කණ්ඩායම් හා ප්‍රජාවන්ගේ පුද්ගලික හා සාමූහික සුභ සිද්ධිය ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නා වූ උපකාරක වෘත්තියක් ලෙස හැඳින්විය හැකිය. මෙහි මූලික අරමුණ වන්නේ පුද්ගලයා සතු නෛසර්ගික හෝ සාධනය කර ගන්නා ලද කුසලතා සහ ශක්තීන් කුළුගන්වා තමා සතු සම්පත් තමන්ගේම සුභසාධනය හා සුභසිද්ධිය සඳහා යොදා ගැනීමට හැකියාව ලැබෙන ආකාරයෙන් ප්‍රජාව සවිබල ගැන්වීමයි. එය සමස්ථයක් ලෙස පුද්ගල තලයෙන් ආරම්භව පවුල, කුඩා කණ්ඩායම් හා ප්‍රජා තලයන් ඔස්සේ අවසානයේ සමාජ තලය දක්වා විහිදෙන, පුද්ගල සුභසිද්ධිය වැඩි දියුණු කර ස්ථාපිත කිරීමේ සමාජමය ක්‍රියාවලියට වෘත්තිමය වශයෙන් කෙරෙන මැදිහත් වීමක් ලෙස හඳුන්වාදිය හැක.

මේ අනුව සමාජවැඩකරු කුමන ආකාරයක හෝ ගැටළුවකින් පීඩා විඳින පුද්ගලයෙකුට හෝ ප්‍රජාවකට ඉන් මිදීමට අවශ්‍ය මානසික ශක්තිය ලබාදීම, ඔවුනට අවශ්‍ය භෞතික හා මානව සම්පත් සපයා දීම හා සමාජය තුළ නැවත එවැනි තත්ත්වයක් ඇති වීම වැළැක්වීමට කටයුතු කිරීම සිදු කරයි.

සමාජ වැඩ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී සමාජ වැඩකරු සතුව විශේෂ පුහුණුවක් තිබීම අවශ්‍ය වේ. සමාජයක ජීවත් වන පුද්ගලයන් සියලුම දෙනා එක හා සමාන නොවේ. ස්ත්‍රී පුරුෂ භාවය, වයස , කුලය, පන්තිය, ජනවර්ගය ආගම අනුව සමාජ විෂමතා පවතී. එමෙන්ම කායික වෙනස්කම් සහිත පුද්ගලයින් එනම් අන්ධ, ගොළු, බිහිරි ආදි ආබාධිත තත්ත්වයට පත් අයද සමාජයේ ජීවත්වේ. මෙවැනි විවිධ තාවයන් සහිත පුද්ගලයන් ආමන්ත්‍රණය කිරීමේදී සමාජ වැඩකරු අගතීන් (Prejudice), පරමාදර්ශී තත්ත්වයන් (Ideal type), රාමුගත කිරීම් (Sterio type) වලින් බැහැර විය යුතුය. නිසි පුහුණුවක් නොලැබූ පුද්ගලයෙක් සමාජ වැඩකරුවෙකු ලෙස සේවය කිරීමේදී ලබාදෙන සේවය පාර්ශවීය වීමට ඇති ඉඩ බොහෝය. වැඩි වරප්‍රසාද හා වාසි ලබන කණ්ඩායම් මේ තුළින් මතුවිය හැක. මේ තත්ත්වය පුද්ගලයන් අතර ගැටුම් නිර්මාණය කිරීමටත්, සේවාවන් අවශ්‍යම පුද්ගලයන් වෙත එම සේවය නොලැබී යාමටත් හේතු වේ. සමාජ වැඩකරු ප්‍රජා අවශ්‍යතා වහා හඳුනා ගැනීමට, ගැටළු අවබෝධකර ගැනීමට, අවශ්‍ය විසඳුම් ලබා දීමට හා අදාළ ආයතන වෙත ප්‍රජාව යොමු කරලීමට සමත් දැනුම, කුසලතා ආකල්ප වලින් පොහොසත් පුද්ගලයෙකු වීම වැදගත්වේ.

සමාජ වැඩකරු පොදු ක්‍රියාකාරිකයෙක් (Generallist practitioner) වේ. එනම් ඕනෑම සමාජ සංදර්භයක් තුළ ඕනෑම ජන කොටසක් සමඟ කටයුතු කිරීමේ හැකියාව සමාජ වැඩකරුට තිබිය යුතුය. මොහුගේ සුවිශේෂී කාර්යය වනුයේ දෙන ලද අවස්ථාවට වඩාත්ම ප්‍රතිඵලදායි කාර්යය උපදේශකයෙකු, සජීවීකාරකයෙකු, මැදිහත්කරුවෙකු හෝ පහසුකාරකයෙකු ලෙස ඉටු කිරීමය. එහිදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

**ඇගයුම්**

සමාජ සාධාරණත්වය, සමානාත්මතාවය, මානව හිමිකම්, මානව ගරුත්වය, මානව වටිනාකම් යනාදි කරුණු කෙරෙහි සැළකිලිමත් වීම.

**ප්‍රතිපත්ති**

සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම, මූලික මිනිස් අයිතිවාසිකම් වලට ගරු කිරීම හා සුරැකීම, සෑමදෙනාගේම නෛසර්ගික වූ අදීනත්වයට හා වටිනාකමට ගෞරව කිරීම, දේශීයව පිළිගත් ආචාර ධර්ම චර්යා ධර්ම හා මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කිරිම.

**චර්යාධර්ම**

සමාජ වැඩකරු අවශ්‍ය වූ නිපුණතා පුහුණුව වර්ධනය හා භාවිතය, ඍජු ප්‍රතිපත්ති, මානව දයාව හා සහානුකම්පාව, අවධානය හා යුතුකම, විශ්වාසනීයත්වය සහ රහස්‍යභාවය, ස්වයං ක්‍රියාවට වගවීම, සදාචාරාත්මකව දැනුවත් වූ තීරණ ගැනීම, තීන්දු සඳහා ඇති යුක්ති සාධනය, දේශීයත්වයට ගරු කිරීම, චර්යාධර්ම වලට එකඟව කටයුතු කිරීම හා පවත්වාගෙන යාම.

**වර්තමානයේ ශ්‍රී ලාංකික සමාජයේ සිදු වෙමින් පවතින දැවැන්ත සමාජ පරිවර්තන හමුවේ පැනනැඟී ඇති අනේකවිධ පුද්ගල හා සමාජ ප්‍රශ්න මෙන්ම නිරන්තරයෙන් අත්විදීමට සිදුව ඇති ස්වාභාවික ආපදාවන්ගේ විනාශකාරි අතුරු ප්‍රතිඵල හමුවේ, පීඩිත ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ඉහත පරිදි කටයුතු කළ හැකි වෘත්තීය සමාජ වැඩකරුවන් ගොඩනැංවීම හා පුහුණු කිරීම කඩිනමින් කළ යුතු අවධියකට අපි අවතීර්ණ වී ඇත්තෙමු. එය අපගේ සමාජ වගකීමක්ද වන්නේය.**

# ග්‍රාමීය සංවර්ධනයේදී මූල්‍ය සාක්ෂරතාවයේ ඇති වැදගත්කම. (සමෘද්ධි නිෂ්පාදන ගම්මාන හා සෞභාග්‍යා පොකුරු ගම්මාන ඇසුරෙන්)

*ඩබ්. අනූෂා ප්‍රියන්ජනී*



ලෝකයේ රටවල් පිළිබඳ විග්‍රහයේදී සමස්ථ මුළු ජනගහනයෙන් අඩකටත් වැඩියෙන් ජීවත් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවලය. කාලීනව මෙම ප්‍රතිශතයේ යම් අඩුවීමක් දක්නට ලැබුනද, සමස්ථ ලෝකයේම ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ප්‍රතිශතය නාගරික ප්‍රදේශවලට වඩා ඉදිරියෙන් සිටී. ශ්‍රී ලංකාව පිළිබඳ විමසීමේදී මෙකී තත්වය ලෝකයේ තත්වයටත් වඩා ඉදිරියෙන් බව කිව හැකිය. ලෝක බැංකු වාර්තාවලට අනුව ලෝක ජනගහනයෙන් නාගරික ප්‍රදේශවල ජීවත් වන ප්‍රමාණය 38% වන අතර 62% පමණ බහුතර ජනතාවක් ජීවත් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවලයි. එම නිසාවෙන් සංවර්ධනයේදී විශේෂ අවධානයක් යොමු කළ යුතු සේම ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දෙන්නේද මෙම ග්‍රාමීය ජනතාවයි.

පිළිගත් මතය අනුව රටක ග්‍රාමීය අංශය යනුවෙන් අදහස් කරනුයේ ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් එනම්,70% පමණ ජීවත් වන්නාවූද, සේවා නියුක්තිය ඉහළ මට්ටමක පවතින හා ක්‍රම සම්පාදන පහසුකම් විදුලිය භාවිතය, දුරකථන සේවා, නළ මඟින් ජලය සැපයීමේ සේවාවන්, වැනි පහසුකම්ද, පරිගණක භාවිතය, ලිවීමට කියවීමට ඇති හැකියාවද මෙන්ම සාමාන්‍ය අදායම වැනි මේ සියල්ලම නාගරික අංශයට වඩා පහත් මට්ටමක පවතින ආර්ථික ව්‍යුහයකි. මෙහි පොදු ලක්ෂණ වශයෙන් ඌන සේවා වියුක්තිය, කෘෂි කර්මාන්තය මත පදනම් වූ ජීවනෝපාය රටාව, කෘෂිකාර්මික අංශයේ අඩු ඵලදායිතාව, දළ දේශීය නිෂ්පාදිතය සඳහා 1/4 ක් තරම් වූ අවම දායකත්වය, පවුලක යැපෙන්නන් සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම, ඉඩම් හිඟය ආදී ලක්ෂණ දැක ගත හැකිය. සංවර්ධනය වෙමින් පවත්නා තුන්වන ලෝකයේ රටක් වශයෙන් ශ්‍රී ලංකාව පිළිබඳ විමසා බැලීමේදී මුළු ජනගහනය මිලියන 21 වන අතර(මූලාශ්‍රය: 2017 මහබැංකු වාර්තාව) ඉන් නාගරික අංශය තුළ 2.79% ක්ද ග්‍රාමීය අංශය තුළ මිලියන 15.83%ක්ද හා මිලියන 1.09ක් වන වතු අංශය තුළ ද වාසය කරති. ( මූලාශ්‍රය: ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2009/2010)එනම් මුළු ජනගහනයෙන් 3/4 ක් ග්‍රාමීය අංශය තුළ වාසය කරති. මේ නිසා ශ්‍රී ලංකාව මූලික වශයෙන් ග්‍රාමීය රටක් ලෙස සැළකේ.

සංවර්ධනය යනු පුළුල් මානව ක්‍රියාකාරකමකි. නූතන ලෝකයේ සෑම රාජ්‍යක්ම සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට විශාල උත්සාහයක් දරමින් සිටී. සංවර්ධනය යන්න විවිධ චින්තකයින් විවිධ ආකාරයෙන් අර්ථ නිරූපණය කර ඇත.

එය අද වන විට විශේෂිත වූද, විවිධාංගීකරණය වූද, වඩාත් ජනතා සිතුම් පැතුම් සමඟ සම්බන්ධ වූද සංකල්පයක් බවට පත්ව තිබේ. සංවර්ධනය යනු නිෂ්පාදනය, ඵලදායිතාවය හා ආදායම් ව්‍යාප්ති විෂමතාවය අඩු කිරීම, රැකියා අවස්ථා ජනනය කරලීම, දිළිඳුකම මුලිනුපුටා දැමීම, සමාජ සාධාරණත්වය ඇති කර ලීම හා ඒ තුළින් සමස්ථ ආර්ථිකයම වෙනස් කිරීමයි. මේ සඳහා ග්‍රාමීය අංශය ප්‍රධාන වශයෙන් දියුණු කළ යුත්තේ බහුතර පිරිසක් එහි ජීවත් වීමත් ජාතික ආර්ථිකයේ වැදගත් කොටසක් ඔවුන් වීමත් නිසාය. ඊට හේතුව ග්‍රාමීය ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය සමස්ත රටේම ක්‍රියාකාරීත්වය සඳහා ඍජු බලපෑමක් සිදු කරන බැවිනි.

වර්තමාන ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය වූ කලී "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතපත්ති ප්‍රකාශය මඟින් ක්‍රියාත්මක වේ. මෙහිදී ජාතික සංවර්ධනයේදී ප්‍රධාන වශයෙන්ම පවුල මූලික සංවර්ධන ක්‍රියාදාමය තුළින් ග්‍රාමීය සංවර්ධනය ඉලක්ක කර ගනිමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර දිළිඳුකම තුරන් කිරීමට හා සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සමාජයක් බිහි කිරීමට මානව සමාජයේ කුඩාම තැනුම් ඒකකය වන පවුල සංවර්ධනය කිරීම ප්‍රමුඛ කාර්යය වී ඇත. එමගින් බලාපොරොත්තු වන්නේ පවුල් ඒකකය සතුට, සෙනෙහස හා සුහදතාවය වර්ධනය වූ ආර්ථික වශයෙන් සවිමත් කොට එකිනෙකාට ගෞරවයෙන් බැඳුණු සුන්දර ස්ථානයක් බවට පත් කිරීමයි. ඒ සඳහා අවශ්‍ය මනෝ සාමාජීය සංවර්ධන පරිසරයක් ගොඩනැගීම, ගෘහස්ථ ආර්ථිකය ශක්තිමත් කිරීම, හා ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම මඟින් ජාතික සංවර්ධනයක් ඇති කිරීමයි.

ඒ සඳහා දැනට සුන්දර ගමක්, ගම සමඟ පිළිසඳරක්- වැඩ සමඟ යළි ගමට, සමෘද්ධි නිෂ්පාදන ගම්මාන හා සෞභාග්‍යා පොකුරු ගම්මාන වැඩසටහන ආදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මේ සියල්ලෙන් අපේක්ෂා කරනුයේ සංවර්ධනයේදී ඉතා වැදගත් කොට සළකන ග්‍රාමීය සංවර්ධනය තුළින් රටේ සංවර්ධනය ඇති කිරීමයි. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය දෙස විමසිල්ලෙන් බැලීමේදී මූලික වශයෙන් කෘෂිකාර්මික කටයුතු වල නිරත වූවන් දැකිය හැකි අතර ඊට අමතරව ධීවර කටයුතු, සත්ත්ව පාලනය, කෘෂි කාරමික කම්කරුවන්, ගෘහස්ත කර්මාන්ත මට්ටමේ සුළු පරිමාණ කර්මාන්තවල නිරත වූවන් , ස්වයංරැකියාවල නිරතවූවන් ග්‍රාමීය ආර්ථිකය සඳහා ඉතාම වැදගත් දායකත්වයක් සපයන අතර මොවුන්ගේ අදායම් මට්ටම වැඩිදියුණු කිරීම තුළින් ග්‍රාමීය ආර්ථිකය නඟා සිටු වීම පහසු වේ. එහිදී ඔවුන් ගේ ආර්ථික කටයුතු වන නීෂ්පාදනය, අලෙවිය , ඉතිරි කිරීම් හා ආයෝජන, ණය ආදී සියළු කටයුතු වලදී ඔවුන් තුළ ඇති මූල්‍ය සාක්ෂරතාවය ඉතා වැදගත් වේ.

සාක්ෂරතාව සඳහා විවිධ නිර්වචනයන් ඇති අතර මූල්‍ය සාක්ෂරතාව සඳහාද විවිධ නිර්වචන ඇත. සරලව කිව හොත් මූල්‍ය සුභසාධනය අත්පත් කරගැනීමට පුද්ගලයාට ඇති හැකියාව මූල්‍ය සාක්ෂරතාව වේ. වඩා හොඳ ජීවන තත්වයක් ලඟා කර ගැනීම සඳහා මුදල් ඉපයීමට, ඉතිරි කිරීමට, වියදම් කිරීමට හා ආයෝජනය කිරීමට පුද්ගලයා සතු දැනුම හා හැකියාව මූල්‍ය සාක්ෂරතාව වේ. මිනිසාගේ අවශ්‍යතා අසීමිත වීමත්, සම්පත් සීමිත වීමත් කරණ කොට ගෙන අසමතුලිතව විසිරී ඇති සම්පත් හුවමාරු කර ගැනීම පහසු කර ගැනීමටත්, අවශ්‍යතා පහසුවෙන් ඉටු කර ගැනීමටත් මූල්‍යක්‍රමය නිර්මාණය විය. මූල්‍ය උපකරණ, මූල්‍ය ආයතන, මූල්‍ය යටිතල පහසුකම්, මූල්‍ය වෙළඳපොළ යන අංග මූල්‍ය ආර්ථිකයක් තුළ අනිවාර්යය අංග වන අතර ඉහත ක්‍රම පිළිබඳ පුද්ගලයා සතු සාමාන්‍ය අවබෝධය මූල්‍ය සාක්ෂරතාව වේ.

ග්‍රාමීය සංවර්ධනයේදී මූල්‍ය සාක්ෂරතාව ඉතා වැදගත් වේ. මන්ද යත් ග්‍රාමීය නිෂ්පාදකයාගේ භාණ්ඩ හෝ සේවාව නිෂ්පාදන අවස්ථාවේ පටන් , ආදායම් ඉපැයීමට, වියදම් කිරීමට , ආයෝජනය කිරීමට හා ඉතිරිකිරීම් යන සියළු අවස්ථාවන්හිදී මූල්‍ය සාක්ෂරතාවක් තිබීම වැදගත් වේ.

2016 වසරේ සිට ආරම්භ කරන ලද සමෘද්ධි නිෂ්පාදන ගම්මාන හා සෞභාග්‍යා පොකුරු ගම්මාන ලංකාව පුරා තෝරා ගත් ග්‍රාම නිලධාරී වසම් තුළ ක්‍රියාත්මක වෙමින් පවතින අතර මෙම ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාව සතු මූල්‍ය සාක්ෂරතාව නිෂ්පාදනයෙන් උපරිම ලාභ ලබා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ. එනම්

තමාගේ භාණ්ඩ හා සේවාව සඳහා මිළක් නියම කිරීමට වෙළඳපොළ මිළ ක්‍රමය පිළිබඳව මෙන්ම, තමාගේ තරඟකරුවන්ගේ භාණ්ඩ වල මිළ පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය. ලබා ගන්නා අමුද්‍රව්‍ය සඳහා ගෙවන මිළ අමුද්‍රව්‍ය සඳහා වැය කරන වියදම අවම කර ගැනීම ආදිය මෙන්ම තම භාණ්ඩය හෝ සේවාවේ නිෂ්පාදන වියදම විශ්ලේෂණය කිරීමට නිෂ්පාදකයාට දැනුමක් තිබිය යුතුය. එමෙන්ම තමාගේ නිෂ්පාදනය සඳහා ලාභය ගණනය කිරීමට හැකියාව තිබිය යුතුය. මේ සියල්ල සඳහා මූල්‍ය සාක්ෂරතාව අවශ්‍ය වේ. එහෙත් සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වල ග්‍රාමීය නිෂ්පාදකයන්ගේ නිෂ්පාදනයේදී මේ පිළිබඳව කිසිදු අවබෝධයක් ඔවුන්ට නොතිබීම හේතුවෙන් ඔවුන්ට හිමි ලාභය ලැබෙන්නේදැයි සැකයක් පවතී. මේ හේතුව නිසාම නිෂ්පාදනයෙන් උපරිම ලාභ ලබා ගත නොහැකි අතර එහි වාසිය නිරන්තරයෙන්ම අතරමැදියාට හිමි වීම මෙම ග්‍රාමීය ආර්ථිකයේ දක්නට ලැබෙන විශේෂත්වයකි. කර්මාන්ත වශයෙන් ගත් කළ බිම්මල් කර්මාන්තය, මැටි කර්මාන්තය මෙන්ම නිමි ඇඳුම් මැසීමේ කර්මාන්තය, ගෙවතු වගාව, අතකම් භාණ්ඩ නිර්මාණය , සත්ත්ව පාලනය වුවද මේ සියලු කර්මාන්තවල නිෂ්පාදන, ගමට පැමිණ මිළදී ගන්නා ගැණුම්කරුවන් වන අතරමැදියා තමාගේ ව්‍යාපාර නාමයෙන් තමා මිළට ගන්නා නිෂ්පාදන සුපිරි වෙළඳසැල්වලට හෝ වෙළඳපොළට නිකුත් කරනුයේ නිෂ්පාදකයාගෙන් ගන්නා මිළට වඩා ඉතාම ඉහළ මිළකටය.



එමෙන්ම මෙම නිෂ්පාදන ගම්මාන වල නිෂ්පාදන කටයුතුවල නිරත නිෂ්පාදකයින් මූල්‍ය උපකරණ පිළිබඳ අවබෝධයක් නැති නිසා එමඟින් ලබා ගන්නා වාසිද ලබා ගත නොහැකි වී ඇත. තමා උපයන ආදායම නිවැරදි මූල්‍ය ආයතනවල ආයෝජනය කිරීමටද මූල්‍ය සාක්ෂරතාව ඉවහල් වේ. වර්තමානය වන විට ලංකාවේ බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල මෙන්ම මෙම සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවලද අවිධිමත් මූල්‍ය ව්‍යාපාර ආරම්භ වී ඇති අතර ආසන්නතම නගරයේ ඇති ක්ෂුද්‍රමූල්‍ය ආයතනලින් මෙම ගම්මානවලට පැමිණෙන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් ග්‍රාමීය නිෂ්පාදකයන් ඉතා අපහසුවෙන් උපයා ගන්නා ආදායම් ඉතාම අඩු පොළී ප්‍රතිශතයන් සඳහා තැන්පත් කර ගැනීමට ග්‍රාමීය නිෂ්පාදකයා පොළඹවා ගෙන ඇති බව අධ්‍යයනවලදී හෙළි වී ඇත. මේ හේතුවෙන් ඔවුන් උපයා ගන්නා ආදායමින් ආයෝජනය සඳහා මෙන්ම තැන්පත් මුදල් සඳහා නියම වටිනාකමක් හා පොළියක් ලබා ගැනීමට නොහැකි වී ඇත්තේ ඔවුන් පොළිය ගණනය කිරීමට නොදැනීම නිසාය. මේ අනුව පෙනී යන්නේ ග්‍රාමීය ජනතාවට තම නිෂ්පාදනවලින් ලාභය උපරිම කර ගැනීමටත් ආයෝජනවලින් උපරිම ප්‍රයෝජන ගැනීමටත් මූල්‍ය සාක්ෂරතාව ඉතා වැදගත් වන බවයි.

රටපුරා විවිධ නම්වලින් අවිධිමත් මූල්‍ය ආයතන හා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන බිහිවෙමින් පවතින අතර මොවුන්ගේ ඉලක්ක කණ්ඩායම වන්නේ ග්‍රාමීය ජනතාවයි. ග්‍රාමීය ජනතාව අතරින්ද මේ සඳහා ඉලක්ක කණ්ඩායම වන්නේ කාන්තාවන්ය. ඊට හේතුව වන්නේ ග්‍රාමීය ස්වයංරැකියාවල නිරත බහුතර පිරිස කාන්තාවන්ය. මොවුන් විවිධ

නම්වලින් ගමට පැමිණෙන අතර 3-4 දෙනාගෙන් සමන්විත කුඩා කණ්ඩායම් වලට ණය නිකුත් කරන අතර මේ සඳහා 10%- 20% ත් අතර ඉහළ පොළී ප්‍රතිශතයක් අය කරයි. එහෙත් මේ පිළිබඳව කිසිදු අවබෝධයක් ග්‍රාමීය කාන්තාවන් තුළ නොවන අතර ණය ලබා ගෙන වාරික හා පොළිය අයකිරීම ආරම්භ කළ පසුමෙම තත්වය අවබෝධ වුවද ඒ වන විට ඔවුන් සංකිර්රණ ණය උගුලක පැටලී හමාරය. මේ හේතුවෙන් මෙම ගම්වල කාන්තාවන් සිය දිවිනසා ගත් අවස්ථාවන්ද අසන්නට ලැබේ.

එමෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල කුඩා පරිමාණ නිෂ්පාදකයින් මුහුණු පාන ප්‍රාග්ධන ගැටළුව විසඳා ගැනීම සඳහා ආයතනික හා ආයතනික නොවන අංශවලින් ණය ගැනීමට නිරන්තරයෙන් ඔවුන් පෙළඹී සිටියි. වාණිජ බැංකු, සමුපකාර සමිති, ග්‍රාමීය බැංකු, හා පෞද්ගලික ආයතන ආයතනික අංශය වශයෙන් ද, උකස් බඩු ගන්නන්, වෘත්තීය ණය දෙන අය, ගම්බද කඩකාරයින් ,ඥාතීන් හා හිතවතුන් ආයතනික නොවන අංශය ලෙස ද, මෙම ගම්මාන තුළ ණය නිකුත් කිරීමේ ක්‍රියාවලියේ නිරත වේ. මේ අතරින් සමෘද්ධි බැංකු ග්‍රාමීය නිෂ්පාදකයින් වෙනුවෙන් ඉතා ම නම්‍යශීලී කාර්යභාරයක් ඉටු කරන අතර මේ නිසාවෙන් ඔවුන්ගේ ප්‍රාග්ධන ගැටලුවට යම් තරමක් හෝ සහනයක් ලබා ගත හැකි වී තිබේ. විශේෂයෙන්ම මෙම නිෂ්පාදන ගම්මාන ආශ්‍රිත ගම්මානවල ජනතාව ආයතනික අංශයට වඩා ආයතනික නොවන අංශය සමඟ මූල්‍ය ගනුදෙනු කරන බවක් දක්නට ලැබේ. ග්‍රාමීය ජනතාව තුළ මෙවැනි ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මේ තරම් ජනප්‍රිය වීමට හේතු වශයෙන්

1. රජයේ හෝ සමුපකාර වැනි ආයතනවලින් සපයන මූල්‍ය පහසුකම් පිළිබඳ දැනුවත්භාවයක් නොතිබීම.
2. සමුපකාර හෝ වෙනත් රජයේ මූල්‍ය ආයතනවලින් ණය සැපයීමේදී අනුගමනය කරන ක්‍රියාමාර්ග දිගු කාලීන වන අතර ඒ සඳහා ආකෘතිපත්‍ර රාශියක් පිරවීමට සිදු වීම.
3. ආකෘති පත්‍ර පිරවීම සඳහා සාක්ෂරතාවක් නොවීම.
4. ආයතනික අංශයෙන් ලබා ගත් ණය එක්වරක් ගෙවීම් පැහැර හැර ඇති විට ඔවුන් නැවත ණය ගැනීමට නුසුදුස්සන් වීම.
5. ඇපකර සඳහා වත්කම් හෝ පුද්ගලයින් අවශ්‍ය නොවීම.
6. අවිධිමත් ණය මූලාශ්‍රවල පවතිනපහසුකම, නම්‍යබව හා සුගමබව.

යන ආදී හේතු දැක්විය හැකිය. ඒ අනුව සලකා බැලීමේ දී ග්‍රාමීය ජනතාවගේ අඩු මූල්‍ය සාක්ෂරතා දැනුම නිසා මෙම වැඩසටහන් ප්‍රචලිත වුවද මේ හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව දැනටමත් දීර්ඝ කාලීන ණය උගුලක හසු වී ඇත.

ඉහත කරුණු අනුව පෙනී යන්නේ ග්‍රාමීය සංවර්ධනයේ දී මූල්‍ය සාක්ෂරතාව තිබීම ඉතා වැදගත් වන බවයි. එසේ හෙයින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඊට සමගාමීව එම ප්‍රදේශවල ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට ද වැඩසටහන් සැළසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

# සහභාගිත්ව සංවර්ධනයේ මෑත කාලීන උපාය මාර්ග හා සංකල්ප.

ඩබ්. ඩී. එන්. වීරසූරිය

සහභාගිත්ව සංවර්ධනයේ මෑත කාලීන උපාය මාර්ග හා සංකල්ප පිලිබඳව සලකා බැලීමට පෙර එම ප්‍රවේශය බිහිවීමට පදනම් වූ ජාත්‍යන්තර හා දේශීය පසුබිම පිලිබඳව විමසා බැලීම වැදගත් වේ. සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය මෑතභාගයේ විශේෂයෙන් දකුණු ආසියාතික රටවල විවිධ ස්වරූපයෙන් ක්‍රියාවට නැංවුණු සංවර්ධන ආකෘතියක් ලෙස යොදා ගැනේ.

1970 දශකයට පෙර ලෝකයේ රටවල අනුගමනය කරන ලද සංවර්ධන ආකෘතීන් වල විවිධ අඩුපාඩු සහ දුර්වලතා මතුවිය. විශේෂයෙන් දියුණු වෙමින් පවතින රටවල මෙම තත්වය බරපතල ලෙස පැවතුනි. තවද සංවර්ධිත යැයි සලකනු ලැබූ රටවල පවා තමන් අනුගමනය කරනු ලැබූ සංවර්ධන ආකෘතීන් වල ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන් තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීමට නොහැකි තත්වයක් උදා විය. විශේෂයෙන් අපේක්ෂා කල පරිදි සංවර්ධනය අවශ්‍ය වූ ප්‍රජාවට එය නොලැබුණු බවත්, එම වැඩසටහන් තිරසර නොවූ බවත් සංවර්ධනය හා සම්බන්ධ පවත්වන ලද ජගත් සම්මන්ත්‍රණ තුලින් අනාවරණය විය. විශේෂයෙන් දියුණු වෙමින් පවතින රටවල සංවර්ධනය ලඟාවිය යුතු ප්‍රජාවට මෙම වැඩසටහන් තුලින් ඇතිවූ ප්‍රතිඵල අවම වූ අතර ඇතැම් වැඩසටහන් තුලින් එම ජනකොටස් තව තවත් පීඩනයට පත් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ බොහෝ රටවල සාර්ථක සංවර්ධනයන් සඳහා විකල්ප සෙවීමට උනන්දුවක් දැක්විය.

ඒ අනුව සංවර්ධනයට පාත්‍ර විය යුතු ප්‍රජාවට එහි ප්‍රතිඵල ලැබෙන අයුරින් තිරසාර සංවර්ධන ආකෘතීන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය 1972 දී ස්ටොක් කොම් හි පැවතුණු ජාත්‍යන්තර සංවර්ධන හා පරිසර කමිටුව මගින් අවධාරණය කරන ලදී. 1972 වර්ෂයේ දී ලෝක බලවතුන්ගේ නියෝජිතත්වයෙන් රැස් වූ රෝම සමුළුවේදී ද (Club of Rome) මෙය තවදුරටත් තහවුරු විය.

පරිසරය හා සංවර්ධනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ “මිහිකත සමුළුව” 1992 දී රියෝද ජැනයිරෝ නගරයේදී පැවතිනි. එහිදී ජගත් ප්‍රජාවගේ දිළිඳුකම පිටුදැකීම, සමාජ ආර්ථීක තිරසර සංවර්ධනය, මානව සම්පත් ඵලදායීව යෙදීම හා පරිසර සංවර්ධනය ඇතුළු විවිධ ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කෙරිණි. එහිදී ගත් තීරන වලට අනුව ක්‍රියාකාරකම් සිදුකිරීමේදී සංවර්ධනයේ කේන්ද්‍රීය වන ළමුන්, තරුණයින්, කාන්තාවන් හා දිළිදු ප්‍රජාව සක්‍රීයව සහභාගී කරගත යුතු බවට තීරණය විය.

දියුණු වෙමින් පවතින ආසියා, අප්‍රිකා හා ලතින් අමෙරිකානු රටවල එවකට ක්‍රියාත්මක වෙමින් පැවතුණු සංවර්ධන ආකෘතීන් පිළිබඳව ද ගැටළු මතුවන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස දිළිදු ප්‍රජාවගේ ජීවන තත්වය නංවාලීම සඳහා දේශයට ගැලපෙන සංවර්ධන ආකෘතීන් අත්හදා බලන්නට විය. ටැංසානියාවේ දුප්පත් කම අවම කිරීම සඳහා ජුලියස් නියරේරේ ආරම්භ කරන ලද උජම්මා විජිනිනි (Ujamma Vijinini) ව්‍යාපාරය, සැමුවෙල් උන්ඩොක් (Samuel Undog) නමින් දකුණු කොරියාවේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්ද ඒ අතර විය.

මෙම කාල වකවානුව තුල ඉංදියාව, බංගලාදේශය වැනි රට වලද විකල්ප සංවර්ධන ප්‍රවේශයන් හඳුනා ගැනීමේ අදහසින් ගවේශනශීලී ක්‍රියාදාමයන් සිදුකරන ලදී. බංගලාදේශයේ පොශිකා (Proshika) ආයතනය මෙහෙයවන ලද ඉඩම් අහිමි ගොවීන් මුහුණ පෑ ගැටළු විසඳීම සඳහා ක්‍රියාත්මක කල සංවර්ධන වැඩසටහන ඉන් එක් උත්සාහයකි. ඉන්දියාවේ මහාරාෂ්ඨ ප්‍රාන්තයේ ගෝත්‍රිකයන්ගේ “භූමිසේනා” නමින් ප්‍රචලිත විමුක්ති වැඩසටහන තවත් එවැනි උත්සාහයකි.

දිළිඳුකම අවම කිරීම සඳහා යොදාගත හැකි සංවර්ධන උපායමාර්ග හඳුනා ගැනීම සඳහා ඉන්දියාව, පාකිස්තානය, ශ්‍රී ලංකාව, බංගලාදේශය හා බුරුමය වැනි රටවල නියෝජිතයින්ගෙන් සමන්විත වූ 1974 බැංකොක් නුවර පැවැත්වූ සම්මේලනයද නව සංවර්ධන ප්‍රවේශය සඳහා පදනම් වූ සුවිශේෂී අවස්ථාවකි.

මේ ආකාරයට නව සංවර්ධන ප්‍රවේශයන් සඳහා වූ පර්යේෂණාත්මක ක්‍රියාදාමයන් ජාත්‍යන්තරව ක්‍රියාත්මක වූ අතර ශ්‍රී ලංකාවේ සංවර්ධනය කෙරෙහිද ඒවා කිසියම් බලපෑමක් ඇතිකරන්නට සමත් විය.

1948 න් පසු ශ්‍රී ලංකාව යටත් විජිත තත්වයෙන් නිදහස් වුවද 1970 දශකය වන තෙක් ගතවූ කාලපරිච්ඡේදය තුල සංවර්ධනය සඳහා අනුගමනය කල විවිධ වැඩසටහන් තුලින් බලාපොරොත්තු වූ අරමුණු ඒ ආකාරයෙන්ම ඉටුකර ගැනීමට අපොහොසත් විය. විශේෂයෙන් සුභසාධනය මුල්කර ගත් සංවර්ධන ආකෘතීන් ක්‍රියාවට නංවන ලදී.

මෙම අවධියේ ක්‍රියාත්මක කරන ලද සම්ප්‍රදායික සංවර්ධන වැඩසටහන් තුලින් හා අනෙකුත් සංවර්ධන ප්‍රතිලාභ සෘජුවම ග්‍රාමීය ප්‍රජාව වෙත ලඟා නොවීමෙන් එතෙක් ක්‍රියාත්මක වූ සංවර්ධන ප්‍රවේශයේ බරපතල අඩුපාඩු පවතින බව හැඟී යන ලදී. මේ නිසා විකල්ප සංවර්ධන ප්‍රවේශයන් පිළිබඳ අවධානය යොමු කිරීමට 1970 දශකය මැද භාගය වන විට සිදුවිය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු වඩාත් පුළුල් කිරීමට රජයේ අවධානය යොමු විය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පුහුණුවීම් ලබා දීම සඳහා 1974 වර්ෂයේ දී ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය පිහිටුවන ලදී. ඒ අනුව ජනතාව පුරෝගාමී වීම, සැලසුම් කරුවන්, ක්‍රියාත්මක කරවන්නන් හා ප්‍රතිඵල භුක්ති විඳින්නන් ලෙස ක්‍රියාවලියක නිරත වන සහභාගීත්ව සංවර්ධනය නම් වූ උපාය මාර්ගය 1970 දශකය තුල බිහිවීම සුවිශේෂී කරුනක් විය. ග්‍රාම සංවර්ධන අභයාස හා පර්යේෂණ ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ කාර්ය බද්ධ පුහුණු හා පර්යේශන කාර්යෙහි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගුණු විපර්යකාරක වැඩසටහන

තුලින් ක්‍රියාත්මක වූයේ මෙම සහභාගීත්ව සංවර්ධන සංකල්පයයි. යටිතල පහසුකම් හා සුභසාධනය ඉක්මවා ගිය දිළිඳුකම පිටු දැකීමේ මූලික තේමාව ලෙස අවධානයට ලක්වෙමින් සමාජ සජීවීකරණ ක්‍රමවේදය ඒ සඳහා උපාය මාර්ගයක් ලෙස තහවුරු වූයේ විපර්යකාරක වැඩසටහන තුලින්ය.

1979 වර්ෂයේ ආරම්භ කර ක්‍රියාත්මක වූ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන, අන්තර් දිස්ත්‍රික් සංවර්ධන අසමබරතාවය තුරන් කරමින් ග්‍රාමීය ජනතාවගේ දුගී බව පිටු දැකීම මූලික අරමුණ විය. 1984/85 කාලය තුල ක්‍රියාත්මක වූ නිවාස දශලක්ෂයේ වැඩසටහන හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ රාජ්‍ය නොවන සංවිධාන හවුලේ මෙහෙය වූ සජීවීකරණයට පසුව වාරි මාර්ග ජලපාලන කටයුතු සියල්ලක්ම ගොවීන්ට භාරදීමේ විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට සිදුවිය.

1989 වර්ෂයේ ආරම්භ වූ ජනසවිය වැඩසටහන රාජ්‍ය අනුග්‍රහය ලබමින් දිළුදුකම පිටු දැකීමේ ප්‍රධාන වැඩසටහනක් වූ අතර එය ප්‍රධාන උපාය මාර්ග දෙකක් ඔස්සේ ක්‍රියාත්මක විය. පළමුවැන්න සුභසාධන වැඩසටහනක් වූ අතර

දෙවැන්න ආදායම් වර්ධන වැඩසටහනකි. මෙම වැඩසටහන ද සුභසාධක වැඩසටහනක් ලෙස ජනප්‍රිය වීම නිසා අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීමට නොහැකි විය.

සහභාගීත්ව සංවර්ධන ක්‍රමවේදය යොදා ගනිමින් දිළිඳුකම පිටු දැකීම අරමුණු කොට ගෙන ආරම්භ වූ සමෘද්ධි වැඩසටහන 1995 දී හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන උපාය මාර්ග 03 ක් ඔස්සේ ක්‍රියාවට නංවන ලදී. සුභසාධන වැඩසටහන, ඉතිරිකිරීම් හා ණය වැඩසටහන, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ ප්‍රජාපාදක ග්‍රාම සංවර්ධන වැඩසටහනයි. තවද විවිධ ව්‍යපෘති හා රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රජා ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතීන්, ගැමිදිරිය, මඟ නැගුම, ගම නැගුම ඇතුළු ජාතික මට්ටමේ බොහෝ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් විසින් සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයේ ඇතැම් සංකල්ප හා උපාය මාර්ග අනුගමනය කල බැව් පෙනේ. විශේෂයෙන් ගම නැගුම වැඩසටහන තුල ගමට සම්බන්ධ ප්‍රජාව, දේශපාලන අධිකාරිය හා නිළධාරීන් යන සියල්ලම සම්බන්ධ වන පරිදි ජනසභා නමින් ඒකකයක් පිහිටුවන ලදී. ඒ අනුව එම වැඩසටහන තුල සජීවීකරණයට ලක්විය යුත්තේ අඩු ආදායම් ලාභී ප්‍රජාව පමණක් නොවන බවත් මෙම ක්‍රියාවලියට සම්බන්ධ සියලුම පාර්ශවයන් සජීවීකරණ ක්‍රියාදාමයට යොමුකර තිබීමත් සහභාගිත්ව සංවර්ධනයේ නව උපාය මාර්ගයක් ලෙස පෙන්වා දිය හැක.

මේ වන විටත් රජයේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන ලෙස ක්‍රියාත්මක වන සමෘද්ධි වැඩසටහන තුලද නව සහභාගීත්ව උපාය මාර්ගයන් යොදාගන්නා බව පැහැදිලි වේ. එහිදී සියලුම අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා වෙනත් සියලුම රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන ආයතනද එකම වැඩසටහනක් සඳහා ඒකාබද්ධ කොට තිබීම දක්නට ලැබේ. සියලුම රාජ්‍ය නිලධාරීන් මෙම වැඩසටහන සඳහා සම්බන්ධ කර ගැනීම සිදුකර ඇත.

විශේෂයෙන්ම ගම්මාන මට්ටමින් රාජකාරි කටයුතු වල නියැලී සිටින රජ්‍ය නිළධාරීන් එකම වැඩ සටහනක් තුල ඒකාබද්ධ වී කටයුතු කිරීමේ ප්‍රවනතාවයක් දක්නට ඇත. තමන්ට පැවරී ඇති ප්‍රධාන රාජකාරියට අමතරව වෙනත් විශේෂ සංවර්ධන කාර්යන් සඳහා ඒකාබද්ධව කටයුතු කිරීමට පොළඹවා තිබීම නව උපාය මාර්ගයක් ලෙස පෙන්වා දිය හැක.

තවද ගම්මාන මට්ටමින් තම රාජකාරි කටයුතු වෙන වෙනම හුදකලාව ප්‍රජාවට ලබා දීම වෙනුවට නව උපාය මාර්ග යොදා ගනිමින් එකම ස්ථානයක සිට සහයෝගයෙන් කටයුතු කරන වැඩපිළිවෙලකට පැමිණ සිටින බැව් පෙනේ. මේවාද නව උපාය මාර්ග ලෙස පෙන්වා දිය හැක.

සහභාගීත්ව සංවර්ධන සංකල්ප හා උපාය මාර්ග යොදා ගනිමින් සිදුකරනු ලබන සංවර්ධන වැඩසටහන් මේ වන විට සෑම ක්ෂේත්‍රයක් පුරාවටම විහිදී ගොස් තිබීම මෑත කාලීනව දක්නට ලැබෙන සුවිශේෂී තත්වයකි. කෘෂිකර්ම, ධීවර, සත්වපාලනය, සෞඛ්‍ය හා සනීපාරක්ෂක, වාරි මාර්ග, අධ්‍යාපනය වැනි ප්‍රජා සංවර්ධනයට අදාල විවිධ ක්ෂේත්‍රයන් තුල ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රජාවගේ සජීවී සහභාගීත්වය ලබා ගැනීමට සහභාගීත්ව සංවර්ධනයේ විවිධ උපාය මාර්ග අනුගමනය කරමින් සිටී.

වර්තමාන රජයේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශනය තුලින්ද ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැංවීම මූලික අරමුණ කරගෙන ඇත. විශේෂයෙන් ගම සමග පිළිසඳරක් වැඩසටහන තුල ග්‍රාමීය කමිටු සාමාජිකයින් සහ ප්‍රජා සහභාගීත්වයෙන් පැවැත් විය යුතු කුඩා මහජන සභා මගින් ගමේ සංවර්ධන ප්‍රමුඛතාවයන් හඳුනාගෙන ඒවා අදාල ආයතන මගින් ක්‍රියාවට නැංවීම සිදුකරනු ලබයි.

සහභාගීත්ව සංවර්ධනයේ මෑත කාලීන උපාය මාර්ග හා සංකල්ප පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී පෙනීගිය කරුනක් වූයේ එහි නව සංකල්ප බිහිවීමට වඩා මෙම ක්‍රමවේදයේ උපාය මාර්ග අනුගමනය කරමින් සිදුකරනු ලබන

සංවර්ධන ක්‍රියාකාරකම් වල සීඝ්‍ර වර්ධනයක් වර්තමාන සමාජ ආර්ථික දේශපාලන පරිසරය තුල සිදුකරමින් පවතින බවයි.

# ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ වැඩිහිටි ඉගෙනුම් ක්‍රියාවලිය ලෙස ක්‍රියාත්මක සහභාගිත්ව පුහුණුව හා එහි මූලධර්ම .

එස්.ඩී.අල්ගම

ඉගෙනුම නැතහොත් අධ්‍යාපනය යනු, “දැනුම කුසලතා ආකල්ප වර්ධනය කර ගැනීමේ ක්‍රියාවලියක් වේ”. යනුවෙන් විකිපීඩියා හි සටහන් වී ඇත. සොක්‍රටීස්ට අනුව, “වාර්තාගතව ඇති දැනුම නැවත ආවර්ජනා කිරීම”- ඉගෙනුම නැතහොත් අධ්‍යාපනය ලෙස හඳුන්වයි. කොමිනියස් ට අනුව අධ්‍යාපනය යන්න, “සම්පූර්ණ මානව චර්යාව වර්ධනය කිරීම අධ්‍යාපනයේ අරමුණ” වූවක් වේ. එසේ ම "පුහුණුවේ හෝ අත්දැකීමේ ප්‍රතිඵලයන් වශයෙන් පුද්ගල චර්යාවේ ඇතිවෙන සාපේක්ෂවූත් ස්ථාවරවූත් දීර්ඝකාලීන වෙනස” ඉගෙනුම යනුවෙන් හැඳින් විය හැකි බව දක්වා ඇත. එසේම “කය සහ ආත්මය සංවර්ධනය කිරීම” අධ්‍යාපනය ලෙස ප්ලේටෝ ද සඳහන් කර ඇත. ඕනෑම පුද්ගලයෙකුට විභව ශක්තියක් පවතින බවත් එය අවදි කර ගැනීම ඉගෙනුම තුළින් සිදු කළ යුතු බවත් දක්වා ඇත. එසේ ම අධ්‍යාපනය යනු “දැනුම සුභවාදී චින්තනය සහ ඥාණය බෙදා හදා ගැනීම ලෙස ද දක්වා දක්වා ඇත. විවිධ ඉගෙනුම් ක්‍රම යොදා ගනිමින් ඉගැන්වීම් සිදුකරනු ලබන අතර එය මනෝ විද්‍යාත්මක, දාර්ශනික, පරිගණක ආශ්‍රිත, භාෂාමය, ස්නායුමය සහ සමාජමය ක්‍රමෝපායන් අනුව සිදු කෙරේ. මේ ලෙස ඉගෙනුම නැතහොත් අධ්‍යාපනය යන්න, විවිධ පුද්ගලයන් විවිධාකාර ලෙස නිර්වචනය කර ඇත. මේ සියලුම අදහස් අනුව පුද්ගලයෙක් දැනුමින් සන්නද්ධ කිරීම යන සරල අදහසේ සිට අධ්‍යාත්මිකව ලබනා ගැඹුරු ඥාන සම්භාරය දක්වා වූ පුළුල් පරාසයක් තුළ මෙම ඉගෙනීම යන අදහස නිර්වචනය කර ඇත.

එවන් වූ ඉගනුම පිළිබඳ කතා කරන විට අප අධ්‍යාපනය නැතහොත් ඉගෙනුම් ලබා ගන්නා විවිධ ක්‍රම හඳුනාගත හැකිවේ. කුඩා දරුවෙක් ලෙස ප්‍රාථමික පාසල් අධ්‍යාපනය තුළින් ආරම්භ කරන ඉගනුම උසස් අධ්‍යාපන ආයතන දක්වා කරගෙන යනු ලබන්නේ විධිමත් ආකාරයකින්, විධිමත් කාල සටහනකට අනුව, පූර්ණ කාලීනව ය. මෙලෙස කෙරෙන මෙම ඉගෙනගනුම, " **විධිමත් අධ්‍යාපනය** " ලෙස හඳුන්වයි. නමුත් වැඩිහිටි පුද්ගලයෙක් ඉගැනුම ලබන ක්‍රම වන්නේ මෙම විධිමත් අධ්‍යාපන ක්‍රමය නොවන බව ඔබ හොඳින් දනී. ඔවුන් බොහෝ විට තමා ජීවත්වන අවට පරිසරය ඔවුන්ගේ ඉගෙනුම් මාධ්‍යය කරගෙන ඇත. නැහොත් රූපවාහිනිය, පුවත්පත්, විවිධ ජනමාධ්‍ය, අන්තර්ජාලය, අවට සමාජය ආදිය ඔවුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සපුරා ගනු ලබන මාධ්‍යය වේ. ඔවුන්ට අවශ්‍ය වෙලාවට අවශ්‍ය ක්ෂේත්‍රයන් පිලිබඳ ඉගනුමට ඔවුන්ගේ කැමැත්ත පරිදි යොමු වීම මෙහි දී දක්නට ලැබෙන ලක්ෂණය වේ. මෙම අධ්‍යාපන ක්‍රමය අපි **"අවිධිමත් අධ්‍යාපන"** ලෙස හඳුන්වමු.

මෙවන් වූ අධ්‍යාපන ලබාගන්නා විධිමත් සහ අවිධිමත් යන ක්‍රම දෙකේ සංකලනයක් ලෙස **නොවිධිමත් අධ්‍යාපනය** අපට හඳුනාගත හැකිවේ. වැඩිහිටි අවශ්‍යතාවයන්ට සහ ඔවුන්ගේ චර්යා රටාවට ගැලපෙන ලෙස නැතහොත් සුවිශේෂී කණ්ඩායමක් ඉලක්ක කරගෙන සුවිශේෂී අරමුණක් සඳහා ඉගෙනුම් ලබාදෙන ක්‍රමයක් ලෙස නොවිධිමත් අධ්‍යාපනය අපට හඳුනා ගත හැක. බොහෝවිට මෙහිදී ඉගනුම ලබන පුද්ගලයාට අනුව යම්කිසි සැකැස්මකට අනුව අධ්‍යාපනය ලබාදීම සිදු කරයි. මේ ලෙස ඉගෙනුම ලබාදෙන ඉගෙනුම් ක්‍රමය පුහුණුව ලෙස හඳුන්වනු ලබයි.

පුහුණුව යන්න අධ්‍යාපන ක්‍රියාවලිය තුළ නොවිධිමත් ස්වරූපයන් ගත්තද සත්‍ය ලෙස ම පුහුණුවක් සිදු කරන විට එම පුහුණුව ව්‍යුහගත සිද්ධියක් බවට පත් වේ. එබැවින් මෙම ව්‍යුහගත ඉගෙනුම් ක්‍රිවලිය තුළ දී පුහුණු කරවන්නාගෙන් විශේෂඥ දැනුම පුහුණුව ලබන්නාට ලබාදීම සිදුකරන බවත් එම නිසා පුහුණුවක් සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා පුහුණුව සිදු කිරීම ආදී සියලු කාර්යයන්ගේ වගකීම පුහුණු කරන්නා හුදකලාවම දැරිය යුතු බව උපකල්පනය කරයි. ඒ අනුව පුහුණුව කෙටිකාලීන අධ්‍යාපනයක් ලැබීම උදෙසා පාසලට යාමකට සමාන කල හැකිය. පුහුණු වන්නන් හිස් බෝතල් ලෙස සලකමින් පුහුණු කරුවන් විසින් ඒවා පිරවිය යුතු බව සිතන මෙම ලක්ෂ ඇති පුහුණු වැඩසටහන් සම්ප්‍රදායික පුහුණු ලෙස සලකනු ලබයි. මෙවැනි පුහුණු වැඩසටහන්,

- පුහුණු වන්නන් ප්‍රධාන කර ගනිමින් සිදු කරන ක්‍රියාවන් මගින් විෂය දැනුම ලබා දීම.
- පෞද්ගලිකව වෘත්තියමය, රැකියාමය වර්ධනය ඇති කිරීම.
- පුහුණු කරුවන් උගන්වන කුමක් වුවත් ඉගෙන ගැනීම.
- පුහුණු ආයතන වල වගකීම පුහුණු කිරීම.

යන උපකල්පන මත පදනම් වී කටයුතු කරයි. සම්ප්‍රදායික ලෙස එසේ සිතුවද දැනුම, ආකල්ප හා කුසලතාවය ඇතිකරන අධ්‍යාපන ක්‍රියාවලියක් ලෙස ද පුහුණුව දෙස බැලිය හැකි වේ. ඒ අනුව පුහුණුව විවිධ කරුණු පිළිබඳ දැනුම, තොරතුරු ලබාදීමට පමණක් නොව විඥානය පිබිදවීම සඳහා ද දායක කරගත හැකි වේ. එසේ කිරීමෙන් පුහුණුවකින් සමාජ ප්‍රගමනය උදෙසා දැනුම පමණක් නෙව පුද්ගලයෙකුගේ ඇගයුම්, ආකල්ප හා දිශානතීන් තීරණය කිරීමට ද පුහුණුව උපකාරී කරගත හැකිය. මේ නිසා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය ප්‍රජාවගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීම තුළින් සංවර්ධනයට කරා ලගා කිරීමට සුදුසු වැඩිහිටි ඉගෙනුම් ක්‍රමයක් වශයෙන් “පුහුණුව” යොදා ගැනීම ප්‍රධාන කාර්යය කොට සලයි.

මේ අනුව ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය ඉගෙනුම් ක්‍රිවලියක් ලෙස සම්ප්‍රදායික පුහුණුව වැඩසටහන් පවත්වාගෙන යාමට අදහස් නොකරයි. අප ආයතනය පුහුණුව, පුහුණු වන්නන් සහ පුහුණු කරන්නා විසින් ක්‍රිත්මක කෙරන ඉගෙනුම් ක්‍රිවලියක් ලෙසය සලකනු ලබයි. එසේම මෙම පුහුණු ලබා දෙනු ලබන්නේ ප්‍රජාවත් සමග කටයුතු කරන, ඔවුන්ගේ සංවර්ධනය උදෙසා කටයුතු කරන, සංවර්ධන වැඩකරුවන් උදෙසා වන බැවින්, මෙහි පුහුණු වැඩසටහන් වල සන්දර්භය ඉතා වැදගත් වේ. මෙම පුහුණු මගින් පුහුණුව ලබන්නා අන් අය සමඟ ඵලදායි ව කටයුතු කිරීම සඳහා හැකියාව ලබා දීම පමණක් නොව පුහුණු වන්නන් හට තමා පිළිබඳව, තම අවශ්‍යතා, හැඟීම්, අපේක්ෂාවන්, අත්දැකීම් ආදිය පිළිබඳවද අවබෝධ කර ගැනීමට හැකිවන පරිදි පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි.

එබැවින් පුද්ගලයෙකුගේ සමස්ත තත්ත්වයම අවබෝධ කර ගැනීමට හැකි වන පරිදි මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබිය යුතුයි. ප්‍රජාවට මගපෙන්වනා එම පිරිසට සමස්ත තත්ත්වය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා දීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා ශක්තිමත් කිරීම සඳහා පමනක් උපකාර විය යුතු පුහුණුවක් ලබාදීම පමනක් නොව එම කරුණු පිළිබඳ අවධාරණය කෙරෙන ඉගෙනුම් ක්‍රිවලියක් ලබා දිය යුතු වේ. පවතින සම්ප්‍රදායික තත්ත්වයන් ගෙන් මිනිසුන් නිදහස් කර ගැනීමටත්, තමන්ගේ ම අත්දැකීම් වලින් යථා ස්වභාවය පරීක්ෂා කිරීමටත් ඉන් මිනිසුන් දැනුවත් කිරීම සඳහාත් මෙම පුහුණු වැඩසටහන් උපකාරි විය යුතුයි.


මෙහි ඉගෙනුම් ක්‍රමවේදය පුද්ගල අත්දැකීම් මත පදනම් වන අතර පුද්ගලයන් නැතහොත් කණ්ඩායම් කේන්ද්‍රීය වේ. මෙම ඉගෙනුම් ක්‍රියාවලියේ දී විවිධ අංශ පිළිබද විශ්ලේෂණය සහ විග්‍රහයන් කිරීම සඳහා අවස්ථාවන් ඇති කරමින් ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා සහභාගී වීමට පුහුණු වන්නන් හට අවස්ථාව පුහුණු වැඩසටහන් තුලින්ම සපයනු ලබයි. එසේම මෙහි දී සහභාගී වන්නන්ගේ කාර්යයන් වැඩිදියුණු කිරීමට මෙන්ම

ශක්තිමත් කිරීමට අවශ්‍ය කරන අවස්ථා සලසා දීමේ ක්‍රියාවලියක් පුහුණුව තුළින් ලබා දේ. එමඟින් සමාජීය, ආර්ථික හා දේශපාලනික විශ්ලේෂණයන් දියුණු කිරීම තුළින් රටක ඵලදායි සංවර්ධන ක්‍රියාදාමයන් ගොඩ නගා ගැනීම අපේක්ෂා කෙරේ. එබැවින් පුහුණුව යන්න සම්ප්‍රදායික පුහුණු ක්‍රමයන්ට සීමා නොකර එහි ඉගෙනුම් ක්‍රියාවලියේ බලපෑම ඓතිහාසික, සමාජයීය හා ආර්ථික පසුබිම, දේශපාලන ආදී සියලුම අංශ තුළ සලකා බැලිය යුතුය. වෙනස් කිරීමේ කාර්යය පුහුණුව මගින් කළ හැකි වන්නේ එවිටය. එසේ නොමැතිව සිදු කරන සෑම පුහුණුවකම සමබර බවක් දක්නට නොලැබේ.

සත්‍යවශයෙන් ම සමාජ විපර්යාසයක් ඇති කළ යුතුද....?. ඇතිකළ හැකිද...?. සමාජයක් වෙනස් කිරීමේ කාර්යය පුහුණුව මගින් සිදු කළ හැකි ද...?. සිදු කළ හැක්කේ කෙසේ ද...?. මේ ප්‍රශ්ණ වලට පිළිතුරු පදනම් විය යුත්තේ සමාජය වෙනස් වීම යනු කුමක්ද? හා එය සිදුවන්නේ කෙසේ ද? යන්න පිළිබඳ අපගේ අවබෝධය මතයි. එසේම වර්තමාන සමාජ ස්වභාවය පිළිබඳ අවබෝධය මත සමාජ විපර්යාසය පිළිබඳ අපගේ ඉගෙනුම් ක්‍රියාකාරකම් පදනම් විය යුතුවේ.

ඔබ අවට සමාජය දිහා හොඳින් බලන්න... ඔබගේ ගම දිහා, ඔබ අවට ඉන්න පවුල් හා පුද්ගලයන් දිහා, මේ සියලුම දෙනා අතර සමාන බවක් ඔබට දැකගත හැකි ද?.අප අවට මේ සමාජය ගොඩ නැගී ඇත්තේ සම්පත්වලිනි. ඒ සම්පත් බෙදීයාමේ විවිධත්වයක්, විෂමතාවයක් ඇති වීම තුළින් සමාජයේ ද විෂමතා රැසක් ඇති වී ඇති අයුරු ඔබට දකින්න ලැබෙනවා ඇත. "**සම්පත්**" ලෙස කුමක් අදහස් වෙයිද?. අප ආයතනයේ පුහුණුව තුලදී මෙය, සරලව ගතහොත් සම්පත් යනු භූමිය, ධනය, ශ්‍රමය, යන්ත්‍ර සූත්‍ර වැනි දේවල් පමනක් නොව දැනුම (භෞතික, මානව, ආයතන යන අංශවලට අයත් ) ආදිය ද මේ යටතට ගනු ලැබේ. මේ සම්පත් හි පාලනය හා හිමිකම දරන්නේ කවුද?.

**සම්පත් බෙදී යාම විෂමතාවය පිළිබඳ සටහන**





ඉහත සටහන අනුව සම්පත් බෙදීයාමේ විෂමතාවයන් පිළිබඳ අදහසක් අපට ලැබා ගත හැක. මෙවැනි වෙනසක් ඇත්නම්, මෙම වෙනස වර්ධනය වන්නේ නම්, නව සංවර්ධන නිර්නායක අනුව මේ රටවල් සංවර්ධිතද?. .. සංවර්ධනය වූ සමාජයන්ද?...

අප අවට සමාජය හොඳින් විග්‍රහ කර ගතහෙත් ඉහත සටහනට අනුව මෙසේ සම්පත් වලින් වැඩි කොටසක් සුළුතරයක් වූ උගත්, බලවත් එසේ නැතහෙත් මැනවින් සංවිධානය වූ සුලු පිරිසක් වෙත පවතින ආකාරය ඔබට දැකගත හැකිවනු ඇත. එසේම සමාජීය, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික ජීවිත කෙරෙහි මෙම පිරිස් විසින් ආධිපත්‍ය පතුරන ආකාරය අපට දැකගත හැකිවේ. එසේම බහුතරයක් ප්‍රජාව තම ශ්‍රමය, දැනුම ඇතුළු අනෙකුත් සම්පත් කෙරෙහි කිසිදු බලපෑමක් කළ නොහැකි තත්ත්වයක් ඇතිව සිටින අයුරු ඔබ දකිනු ඇත.

අපි මෙවැනි පිරිස් පිළිබඳ දරන අදහස කුමක්ද?... ඔවුන් දුර්වල ය, කිසිම සංවිධානාත්මක බවක් නැත, ඔවුන් දුප්පත් ය, කම්මැලි ය, ආදී කරුණු රැසක් ඉදිරිපත් කරනු ඇත. බොහෝවිට සුළු රැකියාවන් වල යෙදී සිටින කම්කරුවන්, ගොවියන්, කාන්තාවන් මේ කොටසට අයිති වෙන අතර මේ කොටස වැඩිවන්නට වැඩිවන්නට ඒ සමාජය දුප්පත්, සංවර්ධනය නොවූ යන විශේෂන පද සහිතව හඳුන්වා දීම සිදු කෙරේ. එසේම අපේ සමාජ ව්‍යුහය තුළ මේ ඉහළ හා පහළ කොටස් අතර මැද කොටසක් ද ඇති බව අපට හඳුනා ගත හැක.

අප ආයතනය සමාජය වෙනස් කිරීම (සජීවී කරණය) යනුවෙන් හැඟවෙන්නේ පවතින මෙම ව්‍යුහය තුල වැඩි අයහපත් බලපෑමකට ලක්වන බහුතර ප්‍රජාවක් තමන්ට උචිත යැයි සලකනු ලබන විවිධ අංශ පිළිබඳ ඔවුන්ගේ ජීවන මට්ටම වැඩි දියුණු කිරීමයි.

මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලියට අනුව ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාගැමේ හැකියා අනුව ස්තර කිහිපයකට බෙදා දක්වා ඇත.




මේ අනුව එක් එක් ස්තරයේ සිටින පිරිසගේ සම්පත් හිමිකම අනුව අවශ්‍යතා ද වෙනස් ස්වභාවයක් ගනී. මූලික අවශ්‍යතා පවා සපුරා ගත නොහැකි වැඩි පිරිසක් සිටින පහළ ස්තරයේ පිරිස් වැඩි රටක්, සමාජයක් සංවර්ධිත ද?... මේ පහළම ස්තරයන් ගෙන් පුද්ගලයින් ඉහළට ඔසවා තැබීම, නැතහොත් **"සමාජය යහපත් ලෙස වෙනස් කිරීම"** අප ආයතනයේ පුහුණු වැඩසටහවල අපේකෂාව වන්නේය.

මෙය සිදු විය යුතු ද?... එසේ නම් මේ සඳහා පුද්ගලයන් හා කණ්ඩායම් වෙනස් කරන්නේ කෙසේද?... මෙසේ සමාජ වෙනස් කිරීමේ ක්‍රියාවලිය සඳහා බහුතර ජනතාවගේ සිය දුර්වලතා හඳුනා ගැනීමට අදාළ දැනුවත් කිරීම කළ යුතුයි. මෙම දැනුවත් කිරීම ජනතාවගේ අපේක්ෂාවන් සඵල කර ගැනීම සඳහා, තනි තනිව හා සාමූහිකව කටයුතු කිරීමට සුදුසු ආකාරයේ දැනුවත් කිරීමක් හා සංවිධානය කිරීමක් නොකළ හොත් සමාජ තුල ඉහත කී විපර්යාස කල නොහැක. ඒ අනුව සමාජය වෙනස් කිරීම යන්නෙන් අදහස් වන්නේ මෙම ප්‍රජාව තුළ,

- විඥානය පිබිද වීම
- බලය නැති තැනට බලය පැවරීම
- අසංවිධිත පුද්ගලයන් සංවිධිත් කිරීම වේ.

මෙසේ යහපත් ලෙස සමාජය වෙනස් කිරීමේ ක්‍රියාවලිය පහසු කිරීමේ කාර්යය උදෙසා **සහභාගිත්ව පුහුණුව** මගින් වැදගත් කාර්ය භාරයක් ඉටු කළ හැකි ය. මේ කරුණ පිලිබඳ විශේෂ අවධානයක් යොමු කරන අප ආයතනය සහභාගීත්ව පුහුණු වැඩසටහන් මගින් පුද්ගලයන්, සමජය වෙනස් කිරීමේ කාර්යය ඉටු කිරීම උදෙසා කටයුතු කරයි.

සහභාගීත්ව පුහුණු තුළින්,

- පුද්ගලයා තුල පෞද්ගලික වෙනස්කම් ඇති කිරීම, මේ සඳහා

  සමාජ ගතික හා සමාජ වෙනස්වීම.

  ඔවුන්ගේම ශක්තීන් හා දුර්වලතා.

  සමාජ වෙනස් කිරීම් ක්‍රියාවලියෙහි ලා ඔවුන් තුළ ඇති ශක්‍යතා, කාර්යභාරය.

  හඳුනාගත හැකි ලෙස පුහුණු සංවිධානය කරනු ලබයි.
- සමාජය වෙනස් කිරීමේ කාර්යය අර්ථවත් ආකාරයට කිරීම සඳහා, දැනුම ආකල්ප කුසලතා ලබාගත හැකිවීම.
- කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කිරීම සඳහා ත් විශාල සංවිධානයක කොටසක් වශයෙන් කටයුතු කිරීම සඳහා ත් පුද්ගලයන්ට හා කණ්ඩායම් වලට හැකියාව ලැබීම.
- පුහුණු වැඩසටහන් වලද ප්‍රජාතන්ත්‍රවාදීව හා සහභාගීත්වයෙන් කටයුතු කළ හැකි බැවින් සමාන සමාජය තුළ ඔවුන්ගේ දර්ශනය අත්හදා බැලීමට පුහුණුවක් ලැබීම.
- එවැනි විකල්ප සමාජයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය ආකල්ප හා උචිත සාරධර්ම පුද්ගලයාට හා කණ්ඩායමට ලබාගත හැකිවීම.

යන කරුණු රැසක් ඉටුකරනු ලබයි.

මෙලෙස සහභාගීත්ව පුහුණුව මගින් පෞද්ගලිකව හා සාමූහිකව වෙනසක් ඇති කිරීම සඳහා අවශ්‍ය අත්දැකීම් ලබා දී පුළුල් පරිමාණයේ වෙනස් කිරීමේ ක්‍රියාවලියට පදනම සපයයි.

සහභාගීත්ව පුහුණුව මගින් එක වරම සමාජය වෙනස් කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක වෙනසක් ඇති නොවන බව පැහැදිළිය. නමුත් සමාජව්‍යුහයේ හා සමාජ ක්‍රමයෙහි වැදගත් වෙනසක් ඇති කිරීම සඳහා පුහුණු වැඩසටහන් වලට බැහැරින් කිසියම් පියවරක් ගත යුතු වුවද සමාජයේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කිරීම සඳහා අවශ්‍ය බීජ වැපිරිය හැකිය. පුහුණුවට අමතරව යම් යම් පියවර ගැනීම තුලින් එය මල්පල නෙළාගත හැකි වේ.

මෙයාකාරයෙන් වැඩිහිටි ඉගෙන්ම් ක්‍රමයන් ලෙස පුහුණු කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව විමසා බැලීමේදී අප හට දැකිය හැකි වන්නේ, සාම්ප්‍රදායික පුහුණුව සහ සහභාගීත්ව පුහුණුව වශයෙන් පුහුණු ක්‍රමවේදයන් දෙකක් හඳුනාගත හැකි බවයි.

**ඉගෙනුම් ක්‍රියාවලියක් ලෙස සම්ප්‍රදායික පුහුණුව හා සහභාගීත්ව පුහුණුව**

සම්ප්‍රදායික පුහුණු වේ දී පුහුණු වන්නා සමාන කළ හැක්කේ හිස් බෝතලයකට වන අතර එය පිරවිය යුත්තේ පුහුණු කරුවා විසිනි. ඔහු කුමක් ඉගැන්විය යුතුද? එය කෙසේ සකස් විය යුතුද යන්න පුහුණු කරුවා විසින් නිශ්චය කළ යුතුය. පුහුණුකරුවන් තමා සෑම දෙයක්ම දන්නා බවත් පුහුණු වන්නන් කිසිම දෙයක් නොදන්නා බවත් උපකල්පන මත සිට පුහුණු සිදු කරයි. මෙහිදී පුහුණුවට අවශ්‍ය මග ගැන්විය යුතු විෂය කුමක්ද?, සහ එම ඉගැන්වීම් තුළින් අවශ්‍යතාවයන් ළඟා කරගත හැකිද?, යන්න පිළිබඳව පුහුණු කරුවා විසින් අර්ථ දක්වයි. මේ නිසා පුහුණු වන්නන්ට ඉගෙනීමේ කාලය තුළ මෙම කරුණු හැර වෙනත් කාර්යයක් නොමැත. ඔවුන් ඉගෙනිමේ ක්‍රියාවලියට සහභාගි වෙමින් පුහුණු කරුවා පවසන ඕනෑම දෙයක් ඉගෙනීමට බැඳී සිටී. එබැවින් මෙම පුහුණුවේ එළඹුම අනුව, පුහුණුව තුල ඔබට ක්‍රියාකාරී ලෙසින් සහභාගී වීමට ඉඩ නොදී ක්‍රියාවලියේ මුළු පාලනයම පුහුණුකරු ලබා ගනී. මෙහිදී ඔහු මූලික වී අරමුණ පිළිබඳව අර්ථ කථනයේ සිට පුහුණුව අගය කිරීම දක්වා සෑම දෙයක්ම සිදු කරයි. පුහුණුවේ මුලු ක්‍රියාවලියම හැසිරවීමේ කේන්ද්‍රය පුහුණු කරුවා බව අපට ඒත්තු යයි. එබැවින් කෙනෙකුට පැවසිය හැකි වන්නේ මෙම සම්ප්‍රදායික එළඹුම පුහුණු කරුවා කේන්ද්‍ර කොටගත් පුහුණු බවයි.

සම්ප්‍රදායික පුහුණුව තුළින් ඉහතින් සඳහන් කළ සමාජ මෙහෙවර ක් ලබා දීමට නොහැකි නිසා විකල්ප පුහුණු ක්‍රමයක් ලෙස ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය තුළ සහභාගිත්ව පුහුණු ක්‍රමවේදය භාවිතා කරයි. මිනිසුන් දියුණු කිරීමට නොහැකි බවත් ඔවුන්ට දියුණු විය හැක්කේ සිය ක්‍රියාකාරීත්වය තුළින් තමන් විසින්ම බවත් විශ්වාස කරමින් මෙම සහභාගීත්වය පුහුණු භාවිතා කරයි. මෙම පුහුණු එළඹුම තුළින් සහභාගී වන්නන්ට ඔවුන්ගේ හැකියාවන් තේරුම් ගැනීමට ධෛර්යමත් කිරීම, යථා ලෝකය පිළිබඳ තොරතුරු සහ දැනුම ලබාදීම සිදු කරයි. සහභාගිත්ව පුහුණුවෙන් මිනිසුන් කිසිම දෙයක් නොදන්නවා යැයි පිළිගැනීම ප්‍රතික්ෂේප කරයි. එසේම ඔවුන්ට ඉගෙනීමේ ක්‍රියාවලිය සඳහා සහභාගි වීමට ධෛර්යවත් කොට ඔවුන්ගේ දැනුම අගය කරයි. එවිට ඔවුන් වැඩ කිරීමෙන් හා අත්දැකීමෙන් ලත් දැනුමෙන් ඔවුන්ගේ අව්‍යතා උපායශීලීව වෙනස් කිරීමට හැකියාව ලබනු ඇත. පුහුණුවේ ඉගෙනුම් කාලය තුළදී පාලනය ගෙන යනු ලබන්නේ පුහුණුවන්නන් වන අතර පුහුණු කරුවාගේ කාර්යය වන්නේ ඉගනුම් ක්‍රියාවලිය පහසු කිරීමයි. මෙහි දී සහභාගිවන්නන් ඉගෙනුම් ක්‍රියාවලියට හවුල් කරවා ගනිමින් ඔවුන්ටම බලය ලබා දීම තුළින් ඔවුන් තුළ පවතින දැනුම සහ එහි වටිනාකම ඔවුන් විසින්ම හඳුනාගනී. මෙම ක්‍රමවේදයේ දී ඔවුන්ගේ සාමාන්‍ය දැනුම ශක්තිමත් කිරීමට ඔවුන් තුළ ඇති අධ්‍යාපනික අත්දැකීම් ඉවහල් වන අතර ඔවුන් තුළ ඇති දැනුම පිළිබඳ ඇගයීම් කොට සාමූහික වගකීමකින් නව දැනුම සොයා ගැනීම ආරම්භ කිරීමෙන් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් පුළුල් කර ගැනීම සිදුකෙරේ. තමන් දැනුවත් බව ඔවුන්ට හැඟී ගිය විට සාමූහිකව දැනුම විශ්ලේෂණය කොට අගය කිරීමට පටන් ගනී. එසේ සාමාජිකයින් තුළ වෙනසක් ඇති වීම නිසා, සහභාගීත්ව පුහුණුව වෙනසක් ඇති කිරීමේ මෙවලමක් බවට පත්වේ. එම නිසා සහභාගීත්ව පුහුණු ක්‍රමවේදයේ දී, දැනුම නිර්මාණය කිරීම තුළින් මිනිසුන් වෙනස් කළ හැකි බවත්, එමගින් කෙනෙකුගේ තත්ත්වයේ වෙනසක් ඇති කිරීමට හැකි බවත් තේරුම් කරවයි. එසේ පුද්ගලයන් හට, තමන් සඵල කර ගැනීමට අපේක්ෂා කරනු ලබන්නේ කවර ආකාරයේ වෙනස්කම් ද යන්න හඳුනාගෙන ඒවා සඵල කර ගන්නේ කෙසේද? යන්න පිළිබඳව හැකියාව ලබා දීම සිදුකෙරේ.

" පුද්ගලයන් සංවර්ධනය කළ නොහැක. ඔවුන් තමන් විසින්ම සංවර්ධනය විය යුතුය. බාහිර පුද්ගලයෙකුට මිනිසෙකුගේ නිවසක් ගොඩනැගිය හැකිය. නමුත් මිනිසකු වශයෙන් තිබිය යුතු ආත්ම විශ්වාසය තවත් බටහිර පුද්ගලයෙකුට ඇති කළ නොහැක. පුද්ගලයා සිය ක්‍රියාකාරීත්වය තුළින් තමන් විසින් ම එවැන්නක් ඇති කර ගත යුතුයි. තමා කරන දෙයින් පුද්ගලයා සංවර්ධනය වෙයි. තමාගේම තීරණ ඇති කර ගැනීමෙන් ඔහු සංවර්ධනය වේ. තමා කරන්නේ කුමක්ද යන්න පිළිබඳ අවබෝධය වර්ධනය කර ගැනීමෙන් ඔහු සංවර්ධනය වේ. එසේ ම සිය පූර්ණ සහභාගිත්වය තුළින් ද සංවර්ධනය වන්නේය" _ ජූලියස් නියරේරේ ප්‍රකාශ කරන ලද්දේ එබැවිනි.

අසමානතාවය නොවැළැක්විය හැකි දෙයක් බවත්, පීඩිත ජනතාව කිසිවක් නොදන්නා බවත්, ඔවුන් විශේෂඥයන් නොවන බවත් පීඩිතයන් විශ්වාස කරන තත්ත්වයක් ඇති කිරීම නිසා ආධිපත්‍ය දරන පුද්ගලයන් මත රඳා පැවැතීමක් ප්‍රජාව තුළ නිර්මාණය වී තිබේ. නමුත් ඔවුන් තුළ දැනුම තිබෙන බව, ඔවුන්ට දැනුම ලබාගත හැකි බව, සහභාගිත්ව පර්යේෂණ මගින් තහවුරු කෙරේ. (මෙහි දී අවිධිමත් ඉගෙනුම් ක්‍රම තුළින් ලත් අවිධිමත් දැනුම ප්‍රධාන වේ) ඇතැම් විට මිනිසුන්ගේ මේ දැනුම නිවැරදි සහ නිරර්ව්‍යාජ විය හැකි අතර තවත් විටෙක එසේ නොවිය හැකිය. මෙම දැනුම සමාජ විද්‍යාවේ දී ජනප්‍රිය දැනුම යනුවෙන් හඳුන්වනු ලැබන අතර එය හඳුනාගැනීම සඳහා සහභාගීත්ව පුහුණුව බෙහෙවින් උපකාරී වේ. හඳුනා ගැනීමේ ක්‍රියාවලිය හා ජනප්‍රිය දැනුම අගය කිරීම මගින් ජනතාවගේ දැනුවත් බව ඉහළ නැංවීමටත්, ජනතාවට බලය පැවරීමටත් ආරම්භයක්, දායකත්වය ලබාදීමට හැකි වේ.

සහභාගීත්වය පුහුණුවේ දී කේන්ද්‍රීය ප්‍රශ්නය වන්නේ පුහුණුව මගින් සපුරාලිය යුත්තේ කාගේ අභිප්‍රය ද?.. යන්නයි. ඔබගේ පිළිතුර කුමක්ද..?. ඔබගේ පිළිතුර වන්නේ, විය යුත්තේ දුකින් පිරී ගිය හා විෂමතාවයන්හි පහළ ස්ථරයේ සිටින පීඩිතයන්ගේ අභිප්‍රායන් බවයි. එසේනම් දැනුවත් භාවය ඇති කිරීම, බලය පැවරීම හා සාමූහිකව සංවිධානය කිරීම තුළින් මෙම පීඩිතයන් හා දුගීන් අවදි කිරීම මගින් සමාජ විපර්යාසයක් ඇති කිරීමේ ක්‍රමවේදයක් ලෙස සහභාගිත්ව පුහුණුව සැලකිය හැක .

සහභාගිත්ව පුහුණුව යන්න සත්‍යවශයෙන්ම වැඩිහිටි ඉගෙනුම් ක්‍රම වේදයක් ද වේ. එබැවින් සහභාගිත්ව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේදී වැඩිහිටි පුහුණු උපකල්පන මත ම පදනම් වී පුහුණු වැඩසටහන් සංවිධානය කළයුතු වේ. එහිදී සහභාගීත්ව පුහුණු වැඩසටහන්වල දී පිළිගනු ලබන මූලධර්ම රැසක් පවතී.

**සහභාගීත්ව පුහුණු වේ මූලික සිද්ධාන්තයන්**

- ප්‍රධාන වශයෙන් සහභාගීවන්නන් කේන්ද්‍ර කොටගත් එකක් වීම. පුහුණු කරන්නන්ගේ අරමුණු මත නොව, පැහැදිලිවම සහභාගි වන්නන්ගේ සුවිශේෂ අවශ්‍යතාවයන් මත පුහුණුව ආරම්භ විය යුතුයි. පුහුණුව තමන්ගේ අරමුණු වෙත ම යොමු වන බැවින් ඔවුන් මනාව පුහුණු ක්‍රම මත පාලනයක් හා බලපෑමක් පවත්වා ගනී. පුහුණු වන්නන් ගේ සහභාගීත්වයෙන් පුහුණු ක්‍රම හා ඒ සඳහා අවශ්‍ය උපකරණ, අන්තර්ගතය, ස්ථානය, කාලය සහ පුහුණු ක්‍රමය තීරණය කරනු ලැබේ. එමගින් පුහුණු කරන්නා සියල්ල දත් අයෙකුට වඩා ඒකාබද්ධ ගවේෂකයෙකු බවත් පකෙරේ. මෙම සහභාගිත්වය අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස සහතික කිරීමට අපහසු විය හැකි නමුත් පුහුණුකරුගේ උනන්දු කිරීම හා අවදි කිරීම් මගින් පුහුණු වන්නාගේ සහභාගීත්වය වැඩි දියුණු කෙරේ. එමනිසා පුහුණුකරුවන් පුහුණු වෙන්නා යන දෙදෙනාම සහභාගිත්ව පුහුණුව කෙරෙහි බලපෑම් ඇති කරයි.

- සහභාගිත්ව පුහුණුවේ දී සවිස්තරාත්මක ස්වභාවය, අවබෝධය, දැනුම සහ දක්ෂතා පිළිබඳව එකවරම සලකා බැලිය යුතුය. කෙනෙකු සිටින තත්ත්වය හා අවස්ථා, සමාජ ආර්ථික රටාව ආදිය පිළිබඳ ඔවුන්ට අවබෝධය වැඩි කිරීම ඉතා වැදගත් වේ. සෑම පුහුණුවකම පොදු අරමුණ දැනුම ලබා ගැනීම වුවත්, ආකල්ප, දක්ෂතා පිළිබඳ ඉගෙනීමත් සහභාගීත්ව පුහුණු වැඩසටහන් තුළ අන්තර්ගතවේ. දැනුම අවබෝධය සහ දක්ෂතා පිළිබඳව එකවර සලකා බලන විට පුහුණු ක්‍රමය තෝරා ගැනීම සංකීර්ණ බවට පත් වෙයි. එක් එක් අරමුණු පූර්ණ ලෙස ලඟා කර ගැනීම සඳහා අවබෝධය වැඩි කිරීම, පුහුණුවන්නන් හා පුහුණු කරුවන් අතර සංවාදය මගින් සාර්ථකව සිදු කරනු ලැබේ. ඒ සඳහා විෂය මූලික හා මනෝ මූලික යථාර්ථය පිළිබඳ විවේචනාත්මක විමසා බැලීමක් සිදු කළයුතු වේ. කියවීමෙන් කතා කිරීමෙන් හා දේශන මගින් දැනුම ලබාගැනීම ඉතා කාර්යක්ෂමව කළ නමුත් සහභාගීත්වය පුහුණුවේ දී සිදුකරනු ලබන්නේ නිවැරදි හා අදාල තොරතුරු බෙදා හැරීම හා ලබා ගැනීමයි. එවිට පුහුණු වන්නන්ගේ දක්ෂතා ප්‍රයෝගිකව යොදා ගැනීම පිළිබඳ අවශ්‍යතාවයක් පුහුණු වැඩසටහනේදීම ඇති වේ. මේ සහභාගිත්වය මගින් පුහුණුව සඳහා පුහුණු ක්‍රම එකතුවක් යොදා ගැනීමට සිදුවෙයි.

- සහභාගි වන්නන් අත්දැකීම් තුළින් ඉගෙන ගැනීම. සහභාගීත්ව පුහුණුව ප්‍රධාන වශයෙන්ම පුහුණුවන්නන්ගේ අත්දැකීම් මත රඳා පවතී. පුහුණුවේ තේමාවට අනුකූලව පුද්ගලයන්ගේ අත්දැකීම් ක්‍රමානුකූලව බෙදා හදා ගැනීම මෙහිදී සිදු කෙරේ. මෙම අත්දැකීම් පසුව පුහුණුවන්නන් සහ පුහුණු කරන්නන් එකතුව විශ්ලේෂණයකට භාජනය කරමින් සියල්ලෝම ඒ තුළින් අවබෝධයක් ලබා ගැනී. අත්දැකීම් අගය කිරීමේ වැදගත් කම අවධාරණය කරයි. අද්දැකීම් පුහුණුවේ ම තවත් පැත්තක් වන්නේ පුහුණු කාලය තුළදීම පොදු අත්දැකීමක් ඇති කරන බැවිණි. පුහුණුවේ තේමාවට ගැළපෙන ලෙස පුහුණුවන්නාට ලබාදිය හැකි අත්දැකීම් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා අභ්‍යාස සැලසුම් කිරීම මගින් ඔවුන් මෙසේ අත්දැකීම් ලගා කර ගනී. මෙම

අභ්‍යාස පුහුණු වන්නන් හා පුහුණු කරන්නන් එකතුව විශ්ලේෂණය කිරීම මගින් ඉගෙනීමට අවශ්‍ය දත්ත සැපයයි. එහි දී අනිත් අත්දැකීම් හා පුහුණුව තුළ දී ලබාගත් අත්දැකීම් අතර සම්මිශ්‍රණයක් තිබෙන අතර ඉගෙනීමට අවශ්‍ය ආධාරක සපයයි.

- <u>ඉගෙනීමට සුදුසු පරිසරයක් ඇති කිරීම.</u> මේ පිළිබඳව සහභාගිත්ව පුහුණු වේ දී විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. පුහුණු වන්නන් හට තම මිත්‍යා මත බැහැර කිරීමටත් නව දැනුමක් ලබා ගැනීමට අවස්ථාවක් තිබිය යුතුය. මෙම ක්‍රියාවලි දෙකම පුද්ගලයාට හානිකර විය හැක. සහභාගීත්ව පුහුණුවේ දී පුහුණු වන්නන්ගේ වර්තමාන අඩුපාඩු ගැන ඉස්මතු කිරීමක් සිදු කරන නිසා වැඩසටහන් සකස් කිරීමේ දී මනෝවිද්‍යාත්මක වශයෙන් ආරක්ෂිත හා අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකාට උදව් ලබා ගත හැකි වන්නසේ සකස් විය යුතුය. පුහුණුවේ දී සිදු වන දේවල් ඔවුන්ට එරෙහිව යොදා නොගන්නේ ය, යන විශ්වාසය ඇති වන සේ ඉගෙනුම් පරිසරය සකස් කළ යුතුයි. මෙවැනි පරිසරයක් සකස් කිරීම පහසු නැති බැවින් ඒ සම්බන්ධයෙන් පුහුණු කරන්නාගේ විශේෂ අවධානයක් යොමු විය යුතුයි. එවැනි පරිසරයක් ඉබේ ඇති නොවේ. ඉගෙනුම් පරිසරයක් සකස් කිරීමේ දී සිද්ධි නිරූපණයක් වන බැවින් පුහුණුවන්නන් ඉගෙනීමට උනන්දු කරවන සිත්ගන්නාසුලු ආකාරයෙන් පවත්වාගෙන යා යුතුය අතර සහභාගී වන්නන් ගේ උනන්දුව සහ කැමැත්ත අඩු වන ආකාරයේ සිදුවීම් ඉක්මනින් ඇතිවිය හැකි අතර එවැනි අවස්ථා අවබෝධයෙන් වලක්වා ගැනීමට උත්සාහ ගත යුතු වේ.

- <u>පුහුණුව එදිනෙදා ජීවිතයේදී උපයෝගී කරගත හැකි බව.</u> උගත් දේ සැබෑ ජීවිතයට යොමු කර වීම අත්‍යාවශ්‍ය වේ. මෙසේ උගත් දේ සැබෑ ජීවිතයට යොමු වීම ඉබේ සිදු නොවන නිසා පුහුණු වැඩසටහන් තුළින්ම ඊට අවස්ථාව ලබා ගැනීමට ක්‍රමානුකූලව සැලසුම් කළ යුතුයි. මේ සඳහා භාවිතා කරන ක්‍රමයක් වන්නේ සහභාගි වන්නන් විසින් ම ඔවුන්ගේ සැබෑ ජීවිතයේ විසඳුම් අවශ්‍ය වන්නා වූ ප්‍රශ්න හඳුනාගැනීමේ ක්‍රියාකාරී වැඩසටහන් සකස් කිරීමයි. මෙහි දී තම ප්‍රශ්න ගැටලු වලට විසඳුම් සොයන ආකාරය, එහිදී නව දැනුම යොදා ගන්නා ආකාරය, පුහුණුව අවසාන අවස්ථාවේ දී සලකා බැලේ. මෙම දැනුම සැබෑ ජීවිතයට යොමු කිරීම ඉතා පැහැදිලි අවබෝධයකින් හා සැලකිල්ලෙන් හා අවධානයකින් කිරීම ඉතාමත් වැදගත් වේ.

- <u>සහභාගිත්වය ඇගයීමේ දී පුහුණුව සමාජය අංගයක් සමාජ ක්‍රියාදාමයක් බවට පත් වීම අවශ්‍ය වන අතර සහභාගීත්ව පුහුණු වැඩසටහන තාවකාලික සංවිධානයක් විය යුතු වේ</u>. මෙම තාවකාලික සංවිධානය පුහුණු අරමුණු වලට ගැලපෙන සමාජ සාරධර්ම හා ඇගයීම් අනුගමනය කළයුතු වේ.

- <u>සහභාගීත්ව පුහුණුව කණ්ඩායමක් නැතහොත් සංවිධානයක් ගොඩනැගීම කෙරෙහි අරමුණු කරගනිමින් කටයුතු කරන බැවින් කණ්ඩායම් පුහුණු කිරීම් කෙරෙහි අවධානය යොමු කළ යුතුයි.</u> මෙහි දී සියලුම කුසලතා වර්ධනය කිරීමත් එකම දැනුම සියලුම දෙනා අතර බෙදා ගැනීමත් කෙරෙහි සැලකිලිමත් නොවන අතර සමස්තයක් වශයෙන් කණ්ඩායමට අවශ්‍ය වන දැනුම ආකල්ප හා කුසලතා පමණක් බෙදාහැරීම තහවුරු කරයි. එසේම කණ්ඩායම ගොඩනැගීමත් ශක්තිමත් කිරීමත් පුහුණුවේ ම කොටසක් වේ. මෙම කණ්ඩායම් සංවර්ධනයේ දී ද, තාවකාලික සංවිධානය කිරීමේ දී මෙන්ම සාරධර්ම හා ඇගයුම් පද්ධති ගැන ද සැලකිල්ලට ගනී.

- <u>පුහුණු කරන්නන්ගේ හැසිරීම් රටාව සහභාගිත්ව පුහුණු වේ ඉතා වැදගත් අංගයක් වේ.</u> සම්ප්‍රදායික පුහුණු වේ දී පුහුණු කරන්නාගේ තාක්ෂණික විශේෂඥතාවයක් තිබීම එකම අවශ්‍යතාවය වන නමුත් සහභාගීත්ව පුහුණු එසේ නොවේ. සහභාගීත්ව පුහුණුවේ දී පුහුණු කරන්නන් ගේ හැසිරීම මෙන්ම සමාජ ඇගයීම් රටාවද විවේචනයට තුඩු දිය හැක. පුහුණු කරන්නා තමා පිළිබඳ මනා අවබෝධයකින් සිටිය යුතු අතර අනෙත් අය

කෙරෙහිද සංවේදී විය යුතු වේ. පුහුණු කරන්නා කණ්ඩායම සමඟ කටයුතු කිරීමේ කුසලතා තිබිය යුතු අතර පුද්ගල හා කණ්ඩායම් ක්‍රියාවලින් විමර්ශනය කිරීමේ ගුණාංග පිහිටා තිබිය යුතුය. එසේ ම පුහුණු කරන්නාගේ හැසිරීම පුහුණු වැඩසටහනේ ඉලක්ක ඇගයීම, හා මූලධර්ම සමඟ අනුකූල විය යුතුය. පුහුණු කාලය තුළ පුහුණුවට අදාල නොවන්නා වූ කිසිම ආකාරයක හැසිරීමක් පුහුණු කරන්නා විසින් නොපෙන්විය යුතුය. පුහුණු කරුගේ ඇඳුම් පැළඳුම්, කතා කරන විලාසය, අසුන් ගෙන සිටින ආකාරය සහ ආහාර ගන්නා ආකාරය වැනි  සාමාන්‍ය හැසිරීම් පවා පුහුණුවේ ඇගයීම් පද්ධතිය පිළිබිඹු කරයි. පුහුණුකරන්නන් තමාට වඩා උසස් එමෙන්ම යම් ආධිපත්‍යයක් දරන පුද්ගලයකු යැයි පුහුණුවන්නන් තුළ ඇති විය හැකි ආකල්පය මග හැරවීම සඳහා විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය. අනෙක් අයගේ අදහස් වලට විවෘතව සවන් දීම ඉතා වැදගත්ය. මෙම සියලුම කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් හැසිරීම පුහුණුකරුට අපහසු විය හැකි නමුත් එසේ කිරීම අත්‍යවශ්‍ය වේ.

සමාජ ප්‍රගමනය උදෙසා සහභාගීත්වය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේදී මේ පිළිබඳ ගැඹුරු  අවබෝධයකින් කටයුතු කිරීම ඉතා වැදගත් වේ. ඕනෑම කාලයක, ඕනෑම සමාජයන පවතින තත්ත්වය තුළ එම තත්ත්වයන් විග්‍රහ කර ගනිමින් සහභාගීත්ව පුහුණු ඉගෙනුම මගින් ලබාදෙන මෙම ඥානනය අත්‍යවශ්‍ය වේ. වර්ථමානයේ විවිධ මාධ්‍යය තුළ සිදුවන සාංවාද ඔස්සේ සිදු කෙරෙන මතවාදයන්, ප්‍රකාශයන් විමසා බැලීමේ දී මේ පිළිබඳ නව පිබිදීමක් ඇති විය යුතු බව දක්නට ලැබේ. එබැවින් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට සහභාගීත්වය පුහුණු වැඩසටහන් තුළින් සමාජය අවදි කිරීමේ කාර්යයේ වැදගත්කම පෙරටත් වඩා ඉස්මතුවෙමින් ඇති ස්වභාවයක් දක්නට ලැබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


- ශ්‍රී ලංකා පදනම් ආයතන - සහභාගිත්ව පුහුණු අත්පොත- -1994
- ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යාස කටයුතු සඳහා - ප්‍රජා සංවර්ධනය පුහුණු අත්පොත කොන්රාඩ් - ආඩිනවුර් පදනමේ අනුග්‍රහයෙන් 1978
- ස්ටැන්ලි ගජනායක, ජයා ගජනායක - ප්‍රජාව සවිබලකරණය - ප්‍රජා ව්‍යාපෘති සඳහා සහභාගීත්ව අත්පොත. 1995
- පෙරේරා අයි. රණසිංහ - පුහුණු ක්‍රමවේදය -හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනය- 1996-
- එස්. තිලකරත්න - සහභාගී ග්‍රාමීය සංවර්ධනය_ නිදර්ශන දෙකක් - _ 1982
- ඩයිනිස් ඒ.පී.,  පල්ලේගෙදර සිරිල් - සමාජ සජීවීකරණය -සංකල්ප, ක්‍රමවේදය,භාවිතය,අභියෝග, සහ පුහුණු අත්වැල -2011
- ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය - විපර්යකාරක පුහුණු ක්‍රමවේදය _ සමෘද්ධි යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය- 1999
- ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය -නව සංවර්ධන ප්‍රවේශය -1992
- ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය - ග්‍රාම සංවර්ධනය හා සමාජ සජීවීකරණය -2010
- ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය  - විපර්යකාරක කයීය බද්ධ පුහුණුව _ 2000
- ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය - පුහුණු කරු පුහුණුව- - 2000
- අන්තර්ජාලය

# වැනිලා වගාව පිළිබඳව දැනුවත් වීමෙන් ආදායම සරුකර ගනිමු

ඩබ්.ඒ.ඩී මංගලා චිත්‍රානි

කුළු බඩු ලොවේ රැජින ලෙස සැලකෙන වැනිලා දෙවන වන්නේ සැක්රෝස් වලට පමණි. ලෝකයේ වැඩි වශයෙන් භාවිතා වන ස්වභාවික රස කාරකය හඳුන්වනු ලබන්නේ වැනිලා යන නමිනි. වැනිලා රස කාරකය කුඩා දරුවන් පවා දන්නා නිසා ලෝකයේ වඩා ප්‍රචලිත රස කාරකය වී ඇත. එහි සක්‍රීය රසායනික සංයෝගය හඳුන්වනු ලබන්නේ වැන්ලීන් යන නමිනි. රස කාරක රුජිණ ලෙසින් ප්‍රචලිත වැනිලා ශාක වර්ගීකරණයට අනුව ඕකිඩේසී කුලයට අයත් වේ.

ලෝකයේ වැනිලා වගාවේ ප්‍රමුඛයා වන්නේ මැඩලස්කරයයි. වැනිලා වගා කරන රටවල් අතරින් බොහෝමයක් රටවල් ශ්‍රී ලංකාවට වඩා වියළි දේශගුණයක් සහිත රටවල් වෙයි. එමෙන්ම ප්‍රධාන ලෙස කෘෂිභෝග වගාවන් සඳහා ප්‍රචලිත නොවූ රටවල් වෙයි. පරිභෝජනයට සරිලන ලෙස කැපවීමක් කල නොහැකි නිසා ස්වභාවික වැනිලා වල මිළ දිනෙන් දින ඉහල යමින් පවතී. පසු ගිය වසර 10 තුළ වැනිලා වල මිල ඉහල යාමක් වේගයෙන් සිදු වු අතර, ඉදිරි වසර කීපය තුළද මිළෙහි යම් වැඩි වීමක් බලාපොරොත්තු විය හැකිය. වැන්ලීන් සාරය කිලෝ 01 ක මිළ ඩොලර් 1000 ( රු. 150000.00) වඩා වැඩිවේ.

ශ්‍රී ලංකාව තුළ වැඩි වශයෙන් වැනිලා වගා කරන ප්‍රදේශ වනුයේ කොත්මලේ, ගම්පොළ, හිගුල, කෑගල්ල, මහනුවර හා මාතලේ යන ප්‍රදේශ වලය. මේ සඳහා මහා පරිමාන වගාකරුවන් නොමැති අතර, කුඩා පරිමාන වගාකරුවන් හා ගෙවතු වල වැඩි වශයෙන් වගා කරයි. වගා කරුවන්ගේ අස්වනු වෙළඳ පලට බහුලව ලැබේ. දැනට නිෂ්පාදනය කරන ප්‍රමාණය අපනයනය කලත් එය සංඛ්‍යාත්මක අඩු අගයකි. ලංකාවේ මුළු අපනයනය වසරකට ටොන් 2.6 ක් පමණ වේ. වැනිලා වගා කිරීම තුළ ප්‍රයෝජන රාශියක් ලබා ගත හැක. ඒ අතර ප්‍රධාන වශයෙන් වැන්ලීන් නිෂ්පාදනයට යොදා ගනී. ඊට අමතරව රස කැවිළි නිෂ්පාදනයට , සුවඳ විලවුන් නිස්පාදනයට ,ඖෂධ නිපදවීමට හා රස කාරකයක් වශයෙන් ද භාවිතා කරයි.

**වැනිලා වගාවට අවශ්‍ය පාරිසරික හා දේශගුනික සාධක**

- වැනිලා වගාව මුහුදු මට්ටමේ සිට මීටර 600 ක් දක්වා ප්‍රදේශයන්හි වගා කල හැකියි.
- කාබනික ද්‍රව්‍ය බහුල ලොම් පසක් තිබිය යුතුය.
- උෂ්නත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 21- 32 දක්වා වු පරාසයක තිබිය යුතුවේ. වඩාත් යෝග්‍ය වන්නේ සෙන්ටිග්‍රේඩ් අංශක 27 ක උෂ්නත්වයකි.
- මිලිමීටර 2000 -2500 ක වර්ෂාපතනයක්ද මේ සඳහා නිර්දේශ කොට ඇති අතර, එම වර්ෂාපතනය මාස 10 ක කාලයක් පුරාවට විසිරී පවතින්නක් විය යුතුය. මල් පීපීමට වැල් ආකාරයට පත් කල යුතු නිසා මාස දෙකක වියළි කාලයක් තිබිය යුතුය. ලංකාවේ වැනිලා වගාවට වඩාත් යෝග්‍ය වන්නේ තෙත සහ අර මැදි කළාපයයි.
- සාර්ථක වැනිලා වගාවක් සඳහා 70%- 75 අතර සෙවනක් තිබිය යුතුය.උස සෙවන සඳහා මාර, සබුක්කු ආදී ශාක ද පහළ සෙවන ශාක ලෙස ගිනිසීරියා හා එරබදු යොදා ගත හැකියි.

**වැනිලා වැල් රෝපනය සහ අස්වනු නෙලීම දක්වා සිදුවන ක්‍රියාවලිය**

❖ රෝපනය

මල් පිපුනු වැල් වල මල් නොපිපිපුණු මීටර 1-3 ක් පමණ දිග දඬු කැබලි රෝපනය සඳහා යොදා ගනී. මීට අමතරව පටක රෝපන පැලද වගාව සඳහා යොදා ගනී.(දැනට මෙම ක්‍රමය ලංකාව තුළ භාවිතා නොකරයි. එයට හේතුව වන්නේ පටක රෝපන පැල වල අස්වනු ලබා ගැනීමට කල් ගත වීමයි.)

දඬු තෝරා ගැනීමේදී පහත ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කල යුතුය.

1. විශාල සහ මාංසල පත්‍ර සහිත කඳන්
2. රෝග හා කෘමි හානී වලින් තොර වීම
3. වේගවත් වර්ධන විලාසය
4. ඉහල අස්වැන්නක් සහිත මවු ශාඛය

❖ ආධාරකය සහ පරතරය

අවම වශයෙන් වැනිලා වැල් රෝපනය කිරීමට මාස 06 කට පෙර උස මීටර දෙකක් වන ආධාරක සිටුවිය යුතුය. එසේ නොමැති නම් දැනට පවතින කෝපි හා පොල් වැනි වගාවන් තුල අතුරු බෝගයක් ලෙසද පවත්වාගෙන යා හැකිය. එම අවස්ථා වලදී ශාක අතර නයුලෝන් ලණුවක් හෝ ලීයක් බැද ඒ මත වැනිලා වැල් යැවිය හැකිය.

❖ පැල සිටුවීමට බිම සකස් කිරීම.

1. වගා භුමියේ ඇති අනවශ්‍ය පදුරු ඉවත් කර එළි කර ගත යුතුය.
2. නියමිත පරතරයට සකසා ගත් ආධාරකය වටා අඩි 3 ක් පමන කවයක් සුද්ද කර පස් බුරුල් කර කාබනික පොහොර එක් කල යුතුය.
3. වැනිලා වැල් අඩි 8 * 5 පරතරයට සිටුවිය යුතුය. ඒ අනුව අක්කර 01 කට වැනිලා පැල 1089 ක් පමණ අවශ්‍ය වේ.

❖ වැල් සිටු වීම

ආධාරකයේ පාදස්ථානයේ සිට සිරස් අතට සකසන ලද අගල් 2 ½ ගැඹුරු ඇලිය තුළ අඩි 1 ½ ක් පමන දිගට කපා ගත් වැනිලා වැල යට කර පුරුක් 3 ක් 4 ක් පමන ඇති වැල් කොටස ආධාරකයට තබා බැඳ කෙසෙල් පඩරුල් මගින් ආධාරකය වටා

❖ වසුන් යෙදීම

වැලේ පාමුල දිරා ගිය ශාක කොටස් හා කාබනික ද්‍රව්‍ය දමා වසුන් යෙදීම ඉතා වැදගත් වේ. වැනිලා වලට සෙවන අඩු බවක් දැනේනම් ඒ සඳහා කෙසෙල් පඩරුල් හෝ පුවක් අතු 3- 4 ක් තබා ආවරණය කල යුතු වේ.

❖ මල් පරාගනය

වැනිලා කරල් ලබා ගැනීම සඳහා මල් කෘතීමව අතින් පරාගනය කල යුතුය. එය අදේ 8- 10 දක්වා කිරීම වඩාත් සුදුසුය. සාමාන්‍යයෙන් මල් ඉත්තක මල් 30 -40 ක් පමණ හට ගනී. එක් මලකින් එක් කරලක් ලබා

ගත හැකිය.නමුත් මේ මල් සියල්ලම පරාගනය නොකල යුතය. එසේ කල හෙත් කොට කරල් සහ ඇද ගැසුනු කරල් හට ගනී. මේ නිසා එක් මල් කිනිත්තකින් මල් 10 -15 ත් අතර ප්‍රමාණයක් පරාගනය කිරීම සුදුසු වේ. දිනකට මල් කිනිත්තක මල් 13 ක් දක්වා පිපිම සිදු වේ. එක් වැලකින් කරල් 100-ත් 150 ත් අතර ලබා ගැනීම වඩාත් සුදුසු වේ. මල් පරාගන ක්‍රියාවලිය අවස්ථා තුනකින් සිදු කරයි.

❖ අස්වනු නෙලීම

අප්‍රේල් මාසයේ පරාගනය කල මලක් ඔක්තෝබර් හෝ නොවැම්බර් මාසය වන විට අස්වනු නෙලන තත්ත්වයට පත්වේ. කරල් පහල සිට ඉහල ට සෙන්ටිමීටරයක් පමන කහ පැහැ වනවිට අස්වනු නෙලීම සිදු කල යුතුය. කරල් මේරීම සඳහා මාස 8- 9 ත් අතර කාලයක් ගතවේ. වැනිලා වැලක් සිටුවා වසර 3 ක් පමන ගත වූ පසු අස්වනු නෙලීම ආරම්භ කල හැකිවේ. වසර 7 ක් පමන ගත ව පසු උපරිම අස්වැන්නක් ලබා ගත හැකි අතර,වසර 10 ක් යන තෙක් එයින් ඉතා හොඳ අස්වැන්නක් ලබා ගත හැකිවේ. අමු වැනිලා කරල් 60 ක් 70 කින් පදම් කල වැනිලා කිලෝ එකක් ලබා ගත හැකි වේ.

පසුගිය වසර පහ තුළ වැනිලා මළ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කල අතර,අමු වැනිලා කිලෝ 1 ක මිළ රු. 500 සිට රු. 6000 දක්වා වර්ධනයක් පෙන්නුම් කර ඇත. පදම් කල වැනිලා වල මිළ රු. 23000 සිට රු. 60000 ක් දක්වා වර්ධනය වී ඇත. ලෝකයේ බොහෝ රටවල් කෘතීම වැනිලා වලින් බැහැර වී ස්වභාවික වැනිලා භාවිතය සඳහායොමු වී ඇත. ඒ අනුව එක්සත් රාජධානිය ,ඩෙන්මාර්කය,ප්‍රංශය, කැනඩාවඑජපානය හා ඕස්ට්‍රේලියාව වැනි රටවල් වල වැනිලා ඉල්ලුම දවසින් දවස වැඩි වීමට පටන් ගෙන ඇත.ශ්‍රී ලංකාවට ද අවශ්‍ය වැනිලා ඉල්ලුමට සරිලන නිෂ්පාදනයක් රට තුළ නිෂ්පාදනය නොවීම මත විදේශ රටවලින් වැනිලා ආනයනය කිරීමට සිදු වී ඇත. එබැවින් රටට අවශ්‍ය වැනිලා රට තුළ නිෂ්පාදනය කර ගැනීම තුළින් ඉහල ආදායමක් ලබා ගත හැකි වනවා සේම විදේශ විනිමය ඉතිරි කර ගැනීමටද හැකිවේ.

# ක්ෂුද්‍ර මූල්‍ය උපාය මාර්ගය : ආරම්භය හා වර්ධනය පිළිබඳව සංක්ෂිප්ත හැඳින්වීමක්

ආර්.එම්.ඩබ්.ඩබ්.එන්.එස්.බී. ඒකනායක

දිළිඳු ජනතාව වෙත සිය ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට හැකිවන ණය පහසුකම් සැපයීම හා එමඟින් ඔවුන්ගේ ආදායම් උත්පාදන හැකියාවන් වර්ධනය සඳහා යොමු වූ මූල්‍ය පහසුකම් සැපයීම සංවර්ධන ප්‍රතිපත්තිවලට අලුත් දෙයක් නොවේ. ග්‍රාමීය නිෂ්පාදන අංශය ඉලක්ක කර ක්‍රියාත්මක වූ විවිධ කෘෂිකාර්මික හා ස්වයං රැකියා ණය යෝජනා ක්‍රම මේ සඳහා නිදසුන් ය (Bouman, F.J.A. 1977). එහෙත් ක්ෂුද්‍ර මූල්‍යන උපාය මාර්ගය පෙර සඳහන් කල ණය යෝජනා ක්‍රමවලින් විශේෂ වනුයේ එකී ණය පිළිබඳ විෂයෙහි අන්තර්ගත නොවූ ප්‍රධාන ලක්ෂණ දෙකක් මේ තුළ භාවිතා වීම හේතුවෙනි (Indian Institute of Banking And Finance, 2009). ක්ෂුද්‍ර මූල්‍ය උපාය මාර්ගය සතු එම විශේෂ ලක්ෂණ දෙක වනුයේ,

I. ණය ලබාදීමට අමතරව ඉතුරුම්, රක්ෂණ පහසුකම්, මුදල් හුවමාරු සේවා වැනි මූල්‍ය සේවාවන් මෙන්ම, ව්‍යවසායකත්වය හා ව්‍යාපාර සංවර්ධන සේවා වැනි අනෙකුත් මූල්‍ය නොවන සේවාවන් සැපයීම
II. ණය හා ඉතුරුම් කළමනාකරණය සඳහා ශක්තිමත් ගිණුම්කරණ ක්‍රමයක් සහ මූල්‍ය කළමනාකරණයකින් යුත් ආයතනික පාලනයක් පැවැතීම ය.

දිළිඳු හා අඩු ආදායම්ලාභීන් සිය සමාජ ආර්ථික කටයුතුවලදී නිතර මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වනුයේ සාම්ප්‍රදායික, සම්මත බැංකු සහ විධිමත් මූල්‍ය ආයතන මගින් මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීමට ඇති දුෂ්කරතාවය යි (Armendariz Beatriz & Morduch Jonathan 2005). මෙම මූල්‍ය ආයතන මගින් මූල්‍ය පහසුකම් ලබා ගැනීමේදී සම්පූර්ණ කිරීමට සිදුවන පූර්ව අවශ්‍යතා වන ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කළයුතු භෞතික හෝ මානව වත්කම් නොමැතිකම, ස්ථාවර ආදායම් මාර්ග පිළිබඳ සහතික නොමැතිකම, ආදායම් වාර්තා සහ අතීත මුදල් ගණුදෙනු පිළිබඳ වාර්තා නොමැතිකම වැනි හේතු නිසා දිළිඳු ජනතාවට තම මූල්‍ය අවශ්‍යතා සඳහා සාම්ප්‍රදායික සහ සම්මත බැංකු සහ එවැනි විධිමත් මූල්‍ය ආයතනවලින් මූල්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සීමා වී තිබේ (Yunus. Muhammad.1984). මෙම ගැටලුවට පිළියමක් ලෙස ක්ෂුද්‍ර මූල්‍යනයට සම්බන්ධ කටයුතු 1970 දශකයේ මැද භාගයේ සිට සංවර්ධනය වෙමින් පවත්නා රටවල ගොඩනැගී තිබේ.

එකමුතුකම හා පුද්ගල සාමූහික විශ්වාසය මත පදනම් වූ ණය ක්‍රම (Solidarity Lending) එමගින් ක්‍රියාත්මක කර ඇත (Coleman B. E 1999 : Indian Institute of Banking and Finance, 2009).

ක්ෂුද්‍ර ණය වැඩසටහන් තුළ, ගතානුගතිකව පැවති ඇප ක්‍රම වෙනුවට සාමූහික පුද්ගල වගකීම හා විශ්වාසය සහිත කුඩා කණ්ඩායම් සාමාජික ඇප ක්‍රමයක් ක්‍රියාත්මකය. සමාජික ණය ආපසු අයකර ගැනීමේදී හා ඉතුරුම් වර්ධනයේදී සමාජ ක්‍රියකාරීත්වයක් ලෙස කුඩා කණ්ඩායම්වල පෙළඹවීම හා සහයෝගය සමාජ ඵලදායීව යොදා ගනී. සමාජික අවශ්‍යතාවයට අනුව සැකසුනු ප්‍රගතිශීලී ණය ක්‍රම මෙම වැඩසටහන් තුළ ක්‍රියාත්මක වේ. සමාජ සජීවීකරණ ක්‍රියාකාරකම් මගින් දුප්පතුන්ගේ දැනුවත්භාවය හා සාමූහික ශක්තිය ගොඩනැගීමට ක්‍රියා කෙරේ. මෙයට අමතරව දුප්පතුන් නිතර මුහුණ දෙන අවදානම් හා සමාජ ආර්ථික අවිනිශ්චිතතාවයන් මගින් ඔවුන් වෙත ඇති වන විවිධ පීඩනයන් හා බෙදනීය ප්‍රතිඵල අවම කිරීමට විවිධ සමාජ රක්ෂණ ක්‍රම කෙරෙහි අවධානය යොමු කර තිබේ. එසේම ව්‍යවසායකත්ව හැකියා වර්ධනය, කුඩා ව්‍යාපාර සංවර්ධනය සහ වෙනත් ජීවනෝපාය

ව්‍යාපෘතීන්හි දිගු කාලීන පැවැත්ම තහවුරු කිරිම වැනි දුගී භාවය අවම කිරීමේ නවතාවයන් ගෙන් යුත් ඵලදායි ක්‍රම භාවිතයේ පවති (Thilakaratna.at.al,2006).

බංගලිදේශයේ ග්‍රාමීන් බැංකු ව්‍යාපාරය ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුවල සාර්ථක වර්ධනයට හා එහි ප්‍රවර්ධනය උදෙසා කළ කාර්යභාර්ය ජාත්‍යයන්තරව ඇගයීමට ලක්ව තිබේ. සම්ප්‍රදායික, සම්මත බැංකු විසින් මූල්‍ය පහසුකම් ලබා නොදුන් අන්ත දුගී ජනයාවෙත වෙත ණය මුදල් ලබා දී එම ණය මුදල් තුළින් ග්‍රාමීය මට්ටමේ කුඩා ව්‍යවසායන් ආරම්භ කර දුප්පත් කමින් මිදීමට ඔවුන්ට හැකියාව ලබා දීම ග්‍රාමීන් බැංකුවේ මූලික පරමාර්ථයි.

ග්‍රාමීන් බැංකුව දුප්පතුන්ගේ විශ්වාසය හා සහයෝගිතාවය මත පදනම් වූ බැංකු ක්‍රමයකි (Seibel H D.2005). බංගලිදේශයේ ග්‍රාමීන් බැංකු ව්‍යාපාරය මගින් දුප්පතුන්ගේ ආදායම ඉහළ නැංවීමට කළ මෙහෙවර උදෙසා 2006 වර්ෂයේදි එම ව්‍යාපාරයේ නිර්මාතෘ චිතගොන් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා මහාචාර්ය මොහොමඩ් යුහුනුස් හට නොබෙල් සාම ත්‍යාගය ද හිමි විය. “දිළිඳු ජනතාව ණය ලාභීන් වීමට සුදුකම් නැත්තෝ නොවෙති. සුදුසුකම් නොමැත්තේ එම ජනතාව ප්‍රතික්ෂේප කරනු ලබන බැංකුකරුවන්ටය” යන සංකල්පය ග්‍රාමීන් බැංකු ක්‍රමයේ ප්‍රමුඛ පිළිගැනීම යි. මෙයට අමතරව මෙම බැංකු ක්‍රමයේ ඇති සුවිශේෂ ලක්ෂණයක් වනුයේ ණය මානව අයිතිවාසිකමක් ලෙස සැලකීමය (Yunus Muhammad.1984).

බංගලිදේශයේ දක්ෂිණ ප්‍රදේශයේ ජෝබ්‍රා නම් දිළිඳු ග්‍රාමයේ කාන්තාවන් කිහිපදෙනකු වෙත මහාචාර්ය යුහුනුස් සිය පෞද්ගලික මුදලින් ටාකා 400ක් (ඇ.ඩො.27කට සමාන මුදලක්) දිළිඳු පවුල් කිහිපයක් වෙත ණය වශයෙන් ලබා දී ඇත. ඊට අමතරව එම මුදල් ඵලදායිව යෙදවීම පිළිබඳව අවබෝධයක් ලබා දෙමින් එම ප්‍රදේශයේ ඉල්ලුමක් පැවති ඇඳුම් මැසීම හා බට පතුරු මගින් භාණ්ඩ විවීමේ ස්වයං රැකියාවන් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම ද ලබා දී ඇත. ඒසේ ලබා දුන් ණය මුදල් ආයෝජන කළ ඔවුනට මාස කිහිපයකට පසුව, ලබා ගත් එම ණය මුදල ආපසු ගෙවීමට පමණක් නොව සිය පවුල්වල ආදායම් තත්වය වැඩිකර ගැනීමට සමත් වු ලාභ උපදවන ජීවනෝපාය බවට ද ඒවා පත් කර ගැනීමට හැකියාව ලැබී තිබේ. දුප්පතුන් හට මුදල් ඉතුරු කළ නොහැකිබවත්, ලබාගත් ණය ආපසු ගෙවීමේ හැකියාවක් හෝ පුරුද්දක් දුප්පතුන්ට නොමැති බවටත් පැවති මිත්‍යා මතයන් දුරු කිරීමට මෙම ග්‍රාමීන් ව්‍යාපාරයට හැකි විය. මෙම සාර්ථක අත්දැකිම තුළින් ක්ෂුද්‍ර මූල්‍ය, දිළිඳුකම අවම කිරීම සඳහා යොදා ගත හැකි තවත් එක් සාර්ථක උපාය මාර්ගයක් ලෙස මහාචාර්ය මොහොමඩ් යුහුනුස් ලොවට ඉදිරිපත් කළ අතර, බංගලිදේශ රජයේ හා වෙනත් ආධාර සපයන ආයතනවල සහය ඇතිව බංගලිදේශයේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ තුළ මෙම නව වැඩපිළිවෙළ ව්‍යාප්ත කළේ ය (https://www.amazon.com:Robinsion,2001). ග්‍රාමීන් බැංකු ක්‍රියාවළිය ලෙස වර්තමානයේ ප්‍රචලිතව ඇත්තේ එම වැඩපිළිවෙළයි. දරිද්‍රතාවයට එරෙහිව ක්‍රියාකරමින් රටේ සංවර්ධනය සඳහා දායක විය හැකි නවතාවයකින් යුත් සාර්ථක විසඳුමක් ඉදිරිපත් කළ මෙම ග්‍රාමීන් බැංකු සංකල්පය සහ ක්‍රියාවළිය නූතන ක්ෂුද්‍ර මූල්‍යන උපාය මාර්ගයේ ආරම්භය ලෙස සැලකේ (http;//en.Wikpedia.microfinance org/wki;key principle of microfinance,200).

දුප්පතුන් ඇතුළුව සමාජයේ සෑම මිනිසෙකු තුළ ම තම පැවැත්ම ගෙන යාහැකි විභවයක් පවතින බව ග්‍රාමීන් බැංකු ක්‍රමයේ විශ්වාසය වන අතර ඉන් පල නෙළා ගැනීමට ඔවුනට අත දීමක් වශයෙන් ප්‍රාග්ධනය ඇතලු සේවා පහසුකම් සැපයීම ග්‍රාමීන් බැංකු ක්‍රමය මගින් සිදුව තිබේ. ( https://www.amazon.com.) මේ වන විට ග්‍රාමීන් බැංකු ශාඛා 2468ක් බංගලිදේශය පුරා ක්‍රියාත්මක අතර එහි සේවක සංඛ්‍යාව 24703කි. අවරණය කර ඇති මුළු ගම්මාන සංඛ්‍යාව 80257ක් වන අතර ගණුදෙනුකරුවන් සංඛ්‍යාව මිලියන හතක් පමණ වන බව සඳහන් වේ (http;//en.Wikpedia.microfinance org).

ජනතාවට සමීප, විශ්වාසදායි හා සාධාරණ පිරිවැයක් සහිත මූල්‍ය සේවාවක් පවත්වාගෙන යමින් දුප්පත් කම අවම කිරීම සඳහා ග්‍රාමීන් බැංකුව දැක්වූ එම සාර්ථකත්වය කෙරෙහි 1980 දශකයේ මුල් භාගය වන විට ලොව බෝහෝ රටවල අවධානය යොමු වී තිබේ. මෙම ග්‍රාමීන් බැංකු ක්‍රියාවලිය සංවර්ධනය වෙමින් පවත්නා රටවල ප්‍රචලිත කිරීමට, සංවර්ධනය සඳහා අධාර සපයනු ලබන ජාත්‍යන්තර සංවර්ධන ආයතන (ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි) මගින් ද සහය දක්වා තිබේ. වර්තමානයේ වන විට ලොව බොහෝ රටවල දිළිදුකම අවම කිරීම සහ ප්‍රජා සංවර්ධනය සම්බන්ධ විවිධ රාජ්‍ය අනුග්‍රාහක වැඩසටහන් තුළ මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන විසින් ක්‍රියාත්මක විවිධ ව්‍යාපෘති සඳහා ක්ෂුද්‍ර මූල්‍යානය ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගයක් ලෙස හෝ පරිවාර සංවර්ධන ක්‍රියාකාරකමක් ලෙස භාවිතයට ගනි යි (Seibel H D.2005).

මුල්කාලයේ ක්ෂුද්‍ර මූල්‍ය හා සම්බන්ධ වැඩසටහන් සුළු ණය දීම (Microcredit) සඳහා සීමා වී තිබූ නමුත් 1980 දශකය මැද භාගය වන විට එය ණය සැපයීම සමග ඒකාබද්ධව ඉතුරුම්, රක්ෂණය, මුදල් හුවමාරු කටයුතු වැනි මූල්‍ය සේවාවන් මෙන්ම ව්‍යවසාය සහ ව්‍යාපාර සංවර්ධන සේවා සැපයීම වැනි මූල්‍ය නොවන සේවාවන් සැපයීම වෙතට ද පුලුල් වී තිබේ (http;//www.Microfinance.lk/ publications/2010). එසේම එම කාලසීමාව වනවිට ක්ෂුද්‍ර මූල්‍යාන බැංකු ක්‍රමයේ ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවන් වෙත කුඩා ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මූල්‍ය පහසුකම් ලබා දීමට යොමු වීමක් විශේෂයෙන් දැකිය හැකි ය. මීට පෙර කුඩා ව්‍යවසාය කටයුතුවල නිරතව සිටි ගොවීන් වෙත ණය සැපයීම කෙරෙහි වැඩි නැඹුරුවක් ක්ෂුද්‍ර මූල්‍ය වෙළෙඳපොල තුළ දක්නට විය (Robinson,2001). මෙසේ ක්ෂුද්‍ර මූල්‍ය වෙළෙඳපොළ පුළුල් වීම හේතුවෙන් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සඳහා වන ඉල්ලුමේ විශාල වර්ධනයක් ඇති විය. මේ සඳහා අවශ්‍ය වූ ප්‍රාග්ධන අරමුදල්, සමාජික ඉතුරුම් , බාහිර ආයතන වල මූල්‍ය ප්‍රදාන හා ප්‍රතිපූරක ණය පහසුකම් වැනි විවිධ ක්‍රම ඔස්සේ එම ආයතන විසින් ම සොයා ගැනීමට යොමු වි ඇත.

ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලාභදායිව සැපයීම වෙත 1990 දශකයේ මෙම සේවාව සැපයූ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලට හැකියාව ලැබී තිබේ. 1990 දශකයේ අවසානයත් සමග ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ අරමුණු වඩාත් පුළුල් වී සුළු ව්‍යාපාර හා ජීවනෝපායන් සංවර්ධනය තුළින් දිළිදුකම පිටුදැකිමේ භූමිකාව වෙත අවතීර්ණව, ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල දිගුකාලීන පැවැත්මට අවශ්‍ය ලාභ ඉපයීමේ වාණිජ ව්‍යවසායක් බවට ඒවා පරිවර්තනය වී තිබේ (Robinson,2001;Seible D,2005).

2006 වර්ෂයේ පැවැත් වූ ජාත්‍යන්තර ක්ෂුද්‍ර මූල්‍ය සම්මේලනයේ වාර්තාවට අනුව ක්ෂුද්‍ර මූල්‍ය ආයතන 3000කට අධික ප්‍රමාණයක් ජාත්‍යයන්තරව ක්‍රියාත්මක වේ. එම සංවිධානවල සේවාලාභින්ගෙන් මිලියන 100කට අධික පිරිසක් සංවර්ධනය වෙමින් පවත්නා රටවල දිළිඳු සහ අඩු ආදායම්ලාභින් ගෙන් සමන්විත බව වාර්තා වේ (http://int.microfinace+outlook+2004). මෙවැනි ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සංඛ්‍යාවක් ක්‍රියාත්මක වුවද, ලොව පුරා ජීවත් වන දිළිඳු වැඩිහිටියන් ගෙන් සියයට 62කට එනම් බිලියන 2.5ක පමණ ප්‍රමාණයකට බැංකු ගිණුමක් හෝ විධිමත් මූල්‍ය ආයතන වෙත ප්‍රවේශවීමට හැකියාවක් ලැබී නොමැති බව 2015 වර්ෂයේ සිදු කළ ජාත්‍යයන්තර අධ්‍යයනයක් මගින් හෙළි කර තිබේ (www.microfinacegetway.org).

ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වර්තමානයේදී විවිධ සංවිධාන ස්වරූපයෙන් ලොව පුරා දැකිය හැකි ය. ලාභ ඉපයිමේ අරමුණින් තොරව ක්‍රියාත්මක වන කුඩා ප්‍රමාණයේ ප්‍රජා මූල සංවිධාන, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සිට වාණිජ පරමාර්ථයෙන් ක්‍රියාත්මක මහා පරිමාණ මූල්‍ය ආයතන දක්වා පරාසයක එම ආයතන ව්‍යාප්තව තිබේ. ක්ෂුද්‍ර මූල්‍ය සේවාවන් සැපයීම සඳහා අන්තර්ජාල පහසුකම් ඔස්සේ ජංගම දුරකථන ජාල ද මේ වන විට ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් යොදා ගෙන ඇති අතර ඩිජිටල් බැංකුකරණ කටයුතු වලට ද පරිවර්ථනය වෙමින් තිබේ.

ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධයෙන් ඉදිරිපත් වි ඇති නිර්වචන සහ ක්ෂුද්‍ර මූල්‍යානයේ අන්තර්ගත සේවාවන් විමර්ශනයේ දී පැහැදිළි වනුයේ ක්ෂුද්‍ර මූල්‍යකරණයේ ප්‍රධාන අරමුණ වනුයේ අඩු ආදායම්ලාභීන් වෙත නව ජීවනෝපායන් ඇති

කර ගැනීම හෝ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සංවර්ධනය කර ගැනීම සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන පහසුකම් සැපයිමයි. මූල්‍ය සේවා ලෙස සැලකෙන ණය, ඉතුරුම්, රක්ෂණ, මුදල් ප්‍රේෂණ සේවා සහ මූල්‍ය නොවන සේවා වන ව්‍යාපාර සංවර්ධන සේවා සහ සුභසාධන සේවා ඒ අතර වේ. මෙම සේවා පහසුකම් ක්ෂුද්‍ර මූල්‍ය නිෂ්පාදන (Microfinance products) ලෙස ද හඳුන්වනු ලැබේ. මේවායේ අන්තර්ගත ලක්ෂණ අනුව අනෙකුත් සංවර්ධන මැදිහත්වීම්වලින් වෙන්කර හඳුනා ගත හැකි කැපීපෙනෙන ලක්ෂණ කිහිපයක් ක්ෂුද්‍ර මූල්‍යන උපාය මාර්ගය තුල අන්තර්ගත වන බව පෙන්වා දී තිබේ (Murry.U. and Boros 2002: Mohammad and Mohammad 2007). එම විශේෂ ලක්ෂණ නම්,

- කුඩා ප්‍රමාණයේ මූල්‍යමය අගයකින් යුත් කෙටිකාලීන මුදල් ගණුදෙනු ඇතුළත්ව තිබීම.(ණය, ඉතුරුම්, රක්ෂණ, මුදල් ප්‍රේෂණ)
- ණය අයදුම් කිරීමේ ක්‍රියාවළිය පහසුවීම.
- ණය මුදාහැරීමේ ක්‍රියාවළිය සරල හා සුමට වීම.
- කෙටි කාලයකින් ණය ලබා ගැනීමට හැකිවීම.
- කණ්ඩායම් සාමුහික ඇපය හෝ අනිවාර්යය ඉතුරුම් ආදි ආදේශන ඇප ආවරණ මත ණය පහසුකම් ලබා දීම.
- ණය ගණුදෙනු කෙටිකාලීන වීම (සාමාන්‍යයෙන් එක් වසරක කාලසීමාවක් දක්වා)
- ව්‍යවසායකත්ව කටයුතු සඳහා යොමු වූ කාරක හා ස්ථාවර ප්‍රාග්ධන ණය පහසුකම් හා උපකාරක සේවා සැපයීම.
- සේවාලාභින් සඳහා නැවත නැවත ණය ලබා ගැනීමේ හා විශාල ණය ඉල්ලුම් කිරීමට ඇති හැකියාව.
- දිළිඳු ප්‍රජාව ඉලක්ක කර ගැනීම.
- කාන්තාවන් විශේෂයෙන් ඉලක්ක කර ගැනීම.
- වෙළඳපොළෙහි පවත්නා පොලි අනුපාත මත හෝ එයට අඩු පොලී අනුපාතිකයක් යටතේ ණය ලබාදීම.

ඉහත කරුණු අනුව දිළිඳුකම අවම කිරීම හා ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රධාන අංශ තුනක් යටතේ ක්ෂුද්‍ර මූල්‍යනය මගින් දායකත්වය සැපයෙන බව පැහැදිලි ය.

- අදායම් ඉපයීමේ ක්‍රම (ජීවනෝපාය) සංවර්ධනය තුළින් දිළිඳු හා අඩු ආදායම්ලාභි ප්‍රජාවගේ ජීවන තත්වය වර්ධනය කිරීම
- ඉතුරැම්, ණය, ක්ෂුද්‍ර රක්ෂණ හා මුදල් ප්‍රේෂණ සේවා පහසුකම් දුප්පතුන් හා අඩු ආදායම්ලාභීන් අතර ව්‍යාප්ත කිරීම මගින් ඔවුන් මුහුණ දෙන සමාජ ආර්ථිකමය අවදානම් හා අනාරක්ෂිතභාවයන් (Vulnerability) අවම කිරීම හා එහි බලපෑම් කළමණාකරණය කර ගැනීමේ හැකියාවන් වර්ධනය කිරීම
- ජීවනෝපාය වත්කම් වර්ධනය, රැකියා අවස්ථා නිර්මාණය, සාමූහික ක්‍රියාකාරකම් හා සමාජ සම්බන්ධතා ගොඩනැගීම (**සමාජ** ප්‍රාග්ධනය) තුළින් සමාජ, ආර්ථිකමය වශයෙන් දිළිඳු ප්‍රජාව සවිබල ගැන්වීම එම ප්‍රධාන අංශ වේ.

ආශ්‍රිත මූලාශ්‍ර

Armendariz Beatriz and Morduch jonathan, (2005), The Economics of Microfinance, Prentice - Hall of India Private Limited" New Delhi.

Buss T Microfinance in International Perspective: An Overview of the Issues" Journal of Economic Development (1999), http://www.spacf.com/sample.htm'

Indian Institute of Banking and Finance (2009) Microfinance perspectives and operations Macmilan, India'

Key Principles of Microfinance (2008), 21st century to estimate the impacts. Review of Financial Studies, 23(1) Economic and Social Council United Nations.

Robinson, & Marguerite S. (2001). The microfinance revolution. Washington DC: World Bank Publications'

Seibel 'H 'D (2005) The Old and the New World of Microfinance in Europe and Asia National University of Singapor'

Thilakaratna' G, Wickramasinghe' U and Kumara 'T (2006), Microfinance in Sri Lanka (A Household level Analysis of Outreach and Impact on Poverty, Institute of Policy Studies, Colombo.

**Internet**

http://www.globalenvision.org/library/4/1051 Global Envision, “The History of Microfinance,”

https://en.wikipedia.org/wiki/Microcredit_Summit_Campaign.

https://web.archive.org/web/20120517110711/http://www.microcreditsummit.org/pubs/reports/socr/2012/WEB_SOCR-2012_English.pdf '

http://www.kiva.org/about/microfinance'

http://www.microfinance.lk/publications/2010_11_GTZ_Impact%20Assessment%20Microfinance%20Sri%20Lanka.pdf'

http://www.microfinancegateway.org'/p/site/in/temlatc/19.380882

http://www.sida.se/Publications/Import/pdf/sv/The-Sustainable-Livelihood-Approach-to-Poverty-Reduction.pdf.

www.ecom.ac.uk/faculty/chang/pubs/micrifinance.pdf.

www.globalissues.org. Causes of Poverty – Global Issues'

https://www.microfinancegateway.org/site/files/publication files/intellecap thought note sl mfi.pdf.

https://en.wikipedia.org/wiki/Poverty reduction.

# සංවර්ධනයේදී නැතුවම බැරි ජල සම්පත

නිරෝෂා විජේවර්ධන

වසර 2,500 ක පෞඩ ඉතිහාසයකට උරුමකම් කියන ලක් දෙරණට සොබාදම් මාතාව තිළිණ කල මහඟු දායාදයකි ජල සම්පත. ජල සම්පත මිනිස් වර්ගයාගේ පැවැත්මට කෙතරම් අවශ්‍ය ද යත් ඈත අතීතයේ සිටම මිනිසුන් තම ශිෂ්ඨාචාර ගොඩනගා ගත්තේ ජල මාර්ග ආශ්‍රිතවය. ලොව පැරණිම ශිෂ්ඨාචාරයක් වන ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය, නයිල් ශිෂ්ඨාචාරය, හොවැංහෝ සහ යුප්‍රටීස් වැනි සුප්‍රපට ශිෂ්ඨාචාර බිහිවූයේ ද ජල මාර්ග ආශ්‍රිතවය. එමෙන්ම ශ්‍රී ලංකාවේ පැරණිම ආර්යයන් ද තමන්ගේ මුල් ජනාවාස ගොඩනඟා ගතතේ මල්වතු ඔය ඇතුලු ගංගා ආශ්‍රිතවය. මෙවන් වූ කරුණු විග්‍රහ කිරීමේදී අපට හැඟී යන ප්‍රධාන කරුණ නම් ජලය සියලුම ජන සමාජවල පැවැත්මට පමණක් නොව සියලු ජීවීන්ගේ පැවැත්මට ද අත්‍යාවශ්‍ය දෙයක් බවයි. එබැවින් මූලික අවශ්‍යතාවයන් වන ආහාර පාන, ඇඳුම්, වාසස්ථාන මෙන්ම ජලය ද මිනිස් මූලික අවශයතාවයක් බවට පත්වී ඇත.

පෘතුවි ජලයෙන් 97% ම ඇත්තේ සාගර ජලය වන අතර, ඉතිරි 3% මිරිදිය ජලයයි. එයින්ද ¾ට ආසන්න ප්‍රමාණයක් හිම හෝ ග්ලැසියර් වශයෙන් පවතී. ඒ අනුව පෘතුවිය මතුපිට භාවිතයට ගතහැකි ජල ප්‍රමාණය 0.4% තරමිය.

කිරිකැටි බිළිඳා තිඹිරිගෙයි නැවීමේ සිට මියගිය දින පැන් වඩන මොහොත දක්වා මානවයා හා බැඳී පවතින නැතුවම බැරි සම්පතකි ජලය. එය කෙතරම් උතුම් සම්පතක් ද යන්න සොභාදහම හා පරිසරය පිළිබඳ මිනිස් ඉතිහාසයේ අද්විතීය ලියවිල්ලක් සේ සැලකෙන රතු ඉන්දියානු නායක සියැටල් විසින් ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිතුමන් වෙත යොමුකල ලිපියේ මෙසේ සඳහන් වේ. “මේ බිම පුරා ගලන ගංඟාවකමත්, ඇල දොළෙත් හිරු රැසින් දිලිසෙමින් මනස්කාන්තව ගලා බසින දිය දහර සැබැවින්ම ජලය නොවේ එය මුතුන් මිත්තන්ගේ පරම පිවිතුරු රුධිර ධාරාවයි. මෙම පාඨයෙන්ද පැහැදිලි වන්නේ ජල සම්පතට ඇති අද්විතීය වටිනාකමය.

සංවර්ධිත රට වල මෙන්ම ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය කරා යොමු වෙමින් පවතින රට වල ආර්ථික, සාමාජීය සංවර්ධන ක්‍රියාදාමයන් දෙස බැලූවිට අදාල සංවර්ධන කාර්යයන් වඩාත් ඵලදායී ලෙසින් ක්‍රියාවට නැන්වීමේදී ජල සම්පත අත්‍යාවශ්‍ය අංගයක් වේ. කෘෂිකාර්මික, විදුලි බල උත්පාදනය ඇතුළු අනෙකුත් කවර හෝ සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාවට නැන්වුව ද ඒ තුල ජලයට සුවිශේෂී ස්ථානයක් ලැබේ. පරිසර විපර්යාසයන් මිනිස් ක්‍රියාකාරකම් හා භෞතික කරුණු හේතුවෙන් ජලය වර්තමානයේ මූලික අභියෝගයක් වේ. එවන් තත්වයක් මත ලොව පුරා ක්‍රියාත්මක කරන සීඝ්‍රවූ සංවර්ධන ක්‍රියාවලියේ සාර්ථකත්වය උදෙසා ජලය භාවිතා කිරීම නිසි කළමණාකාරීත්වයක් යටතේ සිදුවිය යුතු වේ. ශ්‍රී ලාංකිකයන් වන අප එය අත්දුටු සත්‍යයකි. අප අදිටන් කරගත යුත්තේ අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතු ආකාරයයි.

වර්තමානයේ ජනතාවගේ පටු පරමාර්ථයන් සාධනය කරගැනීම උදෙසා විනාශ කරනු ලබන වනාන්තර ප්‍රමාණය දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. ඒ නිසාම භූගත ජල මට්ටම පහළ බැසීමට ලක්වේ. පෘතුවියේ මතු භූමි ප්‍රමාණය වූ වර්ග කිලෝමීටර් මිලියන 50ක් හෝ 1/3 කොටසක් අතීතයේ දී ස්වභාවික වනාන්තර වලින් ව්‍යාප්තව

පැවතුනි. ශ්‍රී ලංකාවේ වන ආවරණය වර්ෂයකට හෙක්ටයාර 30,000ක් ඉක්මවනු ලැබේ. 1989 වර්ෂයේ දී වන ආවරණය 24% ක් වුවද මේ වන විට එය 20% දක්වා අඩු වී ඇත. සාමාන්‍යයෙන් වන වැස්ම තිබිය යුතු ප්‍රතිශතය නොමැතිවීම ඉහත අන්තරායකාරී ප්‍රශ්න උත්ගත වීමට බලපා ඇත.

මානව කටයුතු නිසා සිදුවන භූමි පරිහානිය අද වන විට කවර කාලයටත් වඩා උග්‍ර වී තිබේ. ලෝක ආහාර කෘෂිකර්ම සංවිධානයේ (FAO) ගණනය කිරීම් අනුව නිවර්තන වන හරනය වර්ෂයකට මිලියන 8.5 පමණ සිදු කරණු ලබන්නේ කෘෂිකර්මික කටයුතු සඳහාය. මුළුමහත් නිවර්තන ප්‍රදේශයම සළකා බැලුවහොත් කෘෂිකාර්මික කටයුතු සඳහා, ඉන්ධන සඳහා, කැලෑ හා ලඳු කැළෑද හෙයාර් මිලියන 17 ක් පමණ එළිකරණු ලබයි. මේ නිසා කෘෂිකාර්මික ගොඩබිම් සෝදා පාලුවට ලක්වීම නිසා නිසරු බිම් බවට පරිවර්තනය වෙමින් පවතී. වර්තමානයේ දී උද්ගත වී ඇති ජල අර්බුදය අනාගතයේදී තව දුරටත් උග්‍ර අතට පත්වීමට බොහෝ ඉඩ ඇත.

ලෝකයේ වැඩිවන ජන සංඛ්‍යාවට අනුව භූගත ජල පරිභෝජනය වැඩිවීමත්, මානව කටයුතු මගින් පිරිසිදු ජලය අපවිත්‍ර වීමත් නිසා මිනිසාට අවශ්‍ය පිරිසිදු ජල හිගතාවයකට මුහුනපා ඇති බව පරිසර විද්‍යාඥයෝ පෙන්වා දෙයි. කාර්මික හා කෘෂිකාර්මික අපද්‍රව්‍ය මගින් වාර්ෂිකව දූෂණය වන ජල ප්‍රමාණය මුළු මිරිදිය ප්‍රමාණයෙන් 18% ක් පමණ වේ. ජලයට කැලි කසල එක්රැස් කිරීම්, ගංගා, ඇළ දොළ වලට නැව් මගින් තෙල් එක් කිරීම, වැසිකිලි කැළිකසල ද්‍රව්‍ය වලවල් මාර්ග වලට හැරවීම, සේදීම මගින් අපද්‍රව්‍ය එක් කිරීම, කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය ජලයට එක් කිරීම, වැසිකිළි කැසිකිළි ද්‍රව්‍ය ජල මාර්ග වලට හැරවීම, කර්මාන්ත වලින් අපද්‍රව්‍ය එක් කිරීම වැනි ක්‍රියාමාර්ග හේතුවෙන් ජලය දූෂණය උග්‍ර වේ. පසුගිය දිනක මුහුදුබත් වූ එක්ස්ප්‍රස් පර්ල් නෞකාවෙන් මුහුදු ජලයට, මුහුදු ජීවීන්ට සිදු වූ බලපෑම තවමත් ගණනය කිරිමට නොහැකිය. කොරල්පර, මුහුදු ශාක, මුහුදු ජීවීන්, අසීමාන්තික ලෙස විනාශ වෙමින් පවතී. මේ හා බැදුණු ජන ජීවිත වලට සමාජ ආර්ථික හා පාරිසරික වශයෙන් සිදු වූ බලපෑම සුලුපටු නොවේ. මේ සියලූ සාධක යථා තත්වයට පත්වීමට තවත් අවුරුදු දශක කීයක් ගතවේදැයි කාටනම් කිව හැකිද.

1948 ශ්‍රී ලංකාවට නිදහස ලබා ගැනීමත් සමඟ කර්මාන්ත සංවර්ධනයට මඟ පෑදුනි. මේ නිසා විශාල කර්මාන්ත ප්‍රමාණයක් කොළඹ හා අවට ප්‍රදේශ වල බිහි විය. කර්මාන්ත ඒකරාශි වීමත් සමඟ වාණිජ කටයුතු පුළුල්වීමත්, නගර කරා ජනයා සංක්‍රමණය වීමත් නිසා ජන ඝණත්වය වැඩිවිය. 1978 න් පසු මේ තත්වය තව දුරටත් වර්ධනය විය. මේ අතර පැල්පත් වාසීන්ගේ සංඛ්‍යාව අධික වීමත්, ඔවුන් ගංගා, ඇළ මාර්ග හා මීටියාවත් වල පදිංචි වීමත් නිසා කැළි කසළ හා අපද්‍රව්‍ය බැහැර කිරීමෙන් පරිසරය දූෂණය වන්නට විය. මේ සියල්ලම තුළින් සිදුවන්නේ නාගරික ප්‍රදේශවල තිබෙන මතුපිට ජලය ද ඇළ දොළ ආදියේ ජලය දූෂිත වීමෙන් ඒ ආශ්‍රිත පාංශු ජලය දුර්වල ජල වහනයකින් යුක්ත වීමත් කැළි කසළ හා දූශිත ජලය නිසා ප්‍රදේශ වල දුර්ගන්ධයක් පැවතීමත් ය.

වර්තමානය වන විට ජල දූෂණය කොතරම් හානිකරද යත් ජලාශයන්හි වර්ණය පවා වෙනස් වී ඇත. ඒවායේ විවිධ රසායන ද්‍රව්‍ය හේතුකොට ගෙන මසුන් වර්ග මිය යාමට ලක් වූ අතර, චේන්ද්‍රිය වශයෙන් දූෂණය පෙණුනි.(උදා: කොළඹ බේරේ වැව ජීවීන්ට ජීවත්වීමට නොහැකි අන්දමට දූෂණය වී තිබේ)

මෙවන් විවිධ ආකාර වශයෙන් ජලය අපවිත්‍ර වීමෙන් සිදුවනුයේ ජීවීන්ගේ පරිහරණය සඳහා අවශ්‍ය ජල ප්‍රතිශතය තව දුරටත් අවම විමය. වර්තමානයේ ලෝකයේම ජන ගහණයෙන් 1/4 කට පිරිසිදු පානීය ජලය පිළිබඳ අර්බුදයකට මුහුණපෑමට සිදුවී තිබ්. ඊට හේතුව මිනිස් වර්ගයාගේම ක්‍රියාකාරකම් වන අතර පරිහරණයට අවශ්‍ය ජල ප්‍රමාණය දිනෙන් දින අඩුවනු ඇත. මේ නිසා ජල සංරක්ෂණ වැඩ පිළිවෙලක අවශ්‍යතාව දැඩිව දැනේ.

**ජල සංරක්ෂණය සඳහා ලෝක අවධානය යොමු වීම.**

මේ සම්බන්ධව ලෝක අවධානය යොමුව ඇත. 1993 වර්ෂයේදී ලෝක ජල දිනය නමින් වෙනම දිනයක් ජගත් සංවිධානය විසින් ප්‍රකාශයට පත් කිරීම මෙහි එක් පියවරකි. එසේම 1992 පැවති රියෝ සමුළුවේදී සැකසුණු ධරණිය සංවර්ධනය හෙවත් තිරසාර සංවර්ධනය සඳහා 21 වන සියවසේ න්‍යාය පත්‍රයේ 18 වන පරිච්ඡේදයේ වෙන් වී ඇත්තේ ස්වභාවික ජල සම්පත් සංරක්ෂණය කිරීමෙහිලා සංවර්ධනයේ හා නිර්මානකරණයේ දී අවධාරණය කළයුතු ක්‍රමෝපායන් පිළිබඳවය. මේ අතරින් ජල සම්පත් සංවර්ධනය හා පාලනයත්, ජලසම්පත් පිළිබඳ ඇගයිමත්, ජල සම්පත් හා ජලාශ්‍රිත පරිසර පද්ධතීන් සංරක්ෂණයත්, සනීපාරක්‍ෂණ කටයුතු හා පානීය ජල පහසුකම් සැපයීමත්, තිරසාර ආහාර නිෂ්පාදනයත් යන කරුණු වලදී නාගරික හා ග්‍රාමීය ජල සැපයුම කෙරෙහි වඩාත් අවධානය යොමු කළ යුතු බව යෝජනා කර තිබේ.

ලෝක මට්ටමෙන් මෙසේ අවධානය යොමු වීමේ දී අපගේ කාර්යය භාරය වන්නේ ඒ සඳහා වැඩ පිළිවලක් නිර්මාණය කිරීමේ සංවර්ධන ව්‍යායාම සඳහා අප අවතීරණ විය යුතුය. එසේ විය යුත්තේ දේශීය සම්පත නවීන තාක්ෂණය සමඟ සුසංයෝගය කිරීමෙනි. මෙම ප්රයත්නයේදී ජලය නිසිලෙස කළමනාකරණයට මඟ පෙන්වීම, ජල සංරක්ෂණයට දිරිදීම, ජල දූෂණය වළැක්වීමට කටයුතු කිරීම, පිරිසිදු පානීය ජලය සියළු දෙනාට සමව බෙදීයන ආකාරයේ පසුමක් හර්මාණය කිරීම ද අවශ්‍ය වේ. ඒ සඳහා වැඩපිළිවෙලක් නිර්මාණය කිරීම පාලක පන්තිය සතු කාර්යයක් වනවා සේම ඒ සඳහා උපරිම සහයෝගය ලබා දීම සෑම පුරවැසියෙකුගේම වගකීමක් වේ. එසේ නොවුනහොත් ඒ ආශ්‍රිත අර්බුධ හා පීඩාවන්ට පත්වීම වැළැක්විය නොහැකි වනු ඇත.

# ජීව ඉන්ධන භාවිතයේ නව පෙරමුණු

ආනන්ද ප්‍රේමසිරි

ජීව ඉන්ධන යනු කාබනික මූලාශ්‍රයන් වන අතර මේවා කිහිප ආකාරයකින්ම භාවිත කෙරෙයි. උදාහරණ ලෙස ස්වභාවික පරිසරයෙන් ලැබෙන දර, වියළි පොල් කොළ, හණසු, පොල්පිති ආදී කොටස් සහ කෘෂිකාර්මික අපද්‍රව්‍යයත් විවිධ කර්මාන්ත ආශ්‍රිතව බැහැර කරන ජීව ඉන්ධන භාවිතයට ගැනේ. ජීව ඉන්ධන භාවිතයෙන් තාප ශක්තිය ජනනය කර ගැනීම කාලෝචිත නොවන යල්පැන ගිය තාක්ෂණයක් බව ඇතැම් අයගේ අදහසයි. එහෙත් ජීව ඉන්ධන භාවිතය ආර්ථික, පාරිසරික සහ සමාජීය වශයෙන් වඩා වාසි සහගත වේ. ප්‍රධාන වශයෙන්ම ඇතැම් ග්‍රාමීය නිවෙස් වල පවා දර පහසුවෙන් සොයා ගැනීමට හැකියාව තිබියදීත් ගෑස් ලිප් භාවිත කෙරෙයි. මෙය පරිසර හිතකාමී බලශක්ති ප්‍රභවයක් වන ජීව ඉන්ධන අපතේ හැරීමකි. එබැවින් හැකි සෑම විටම නොමිලේ ලැබෙන ජීව ඉන්ධන වැනි මූලාශ්‍ර වෙත යොමු වීමෙන් බලශක්ති වියදම් යම්තාක් දුරකට අඩුකරගත හැකිවනු ඇත.

බොහෝ විට බේකරි, ගඩොල්, උළු, වළං සහ අළුහුණු වැනි නිෂ්පාදන කර්මාන්තශාලා ආශ්‍රිතව තවමත් ප්‍රධාන බලශක්ති ප්‍රභවය ලෙස ජීව ඉන්ධන භාවිත කෙරෙයි. එහෙත් වර්තමානයේ දී බේකරි කර්මාන්තයෙන් මෙය ක්‍රමයෙන් වියැකී යමින් පවතිනු දක්නට ලැබේ. බේකරි කර්මාන්තයේ දී දර භාවිතයෙන් විදුලිය ඉතිරි වීමට අමතරව එම නිෂ්පාදන වලට ආවේණික රසයක් ලැබේ.

දර පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් වේ. රබර්, කුරුඳු, දර සහ ග්ලිරිසීඩියා දර ප්‍රධාන වශයෙන්ම පුනර්ජනනීය බලශක්ති යටතට ගැනේ. දර දහනයෙන් ප්‍රධාන වශයෙන් වායුගෝලයට කාබන්ඩයොක්සයිඩ් නිකුත් වන බැවින් දර භාවිත කරන ලෙසම නැවත නැවත ශාක වගා කිරීමට යොමුවිය යුතුයි. මෙලෙස තිරසාර පදනම යටතේ ලබාගන්නා ජීව ඉන්ධන පමණක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ලෙස සැළකිය හැකි වේ.

වඩු කර්මාන්තය ආශ්‍රිතව බැහැර වන ලී කුඩු, යතු කුඩු, දැව, පිටපලු ආදී ද්‍රව්‍ය ජීව ඉන්ධන ලෙස මෙරට තුළ ද බහුලව භාවිත වන බව දක්නට ලැබේ. මේ අපද්‍රව්‍ය බලශක්ති නිපදවා ගැනීම සඳහා භාවිත කිරීමෙන් ඒවා ප්‍රතිචක්‍රීකරණය මඟින් පරිසර හානිය අඩුවන්නා සේම වියදම් ද අඩුකරගත හැකිය. ලී කුඩු, උළු කර්මාන්තශාලා සහ බොයිලේරු ආදිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්ධනයක් ලෙස භාවිත වේ. ඇඟලුම්, දිසිදි, පොල්, ආහාර සැකසුම් සහ රබර් නිෂ්පාදනයන් සකස් කරන ස්ථාන ආශ්‍රිතව මේ බොයිලේරු බහුලව දක්නට ලැබේ. මුල් කාලයේ දර භාවිතයට ගැනුණු උළු කර්මාන්තශාලා වලින් සමහරක් වර්තමානයේ දී ලී කුඩු දහනයේ දී ලැබෙන තාපය දර වලට සාපේක්ෂව දිගු කාලයක් රඳවා ගැනීමේ හැකියාව ලැබේ.

මෙරට හමුවන තවත් ජීව ඉන්ධනයක් ලෙස පොල්කටු වැදගත් වේ. මේවා බොයිලේරු සඳහා භාවිත වේ. එහෙත් ගෘහාශ්‍රිතව බොහෝ විට පොල්කටු භාවිතයට නොගෙන ඉවතලන අතර මෙමඟින් පාරිසරික ගැටලු ද පැන නඟී. එලෙසම වැසි කාල වලදී ඒවායේ ජලය එක්රැස් වීමෙන් මදුරුවන්ගෙන් බෝවන රෝග ව්‍යාප්තියට ද මඟ සලසයි. එබැවින් පොල්කටු විධිමත්ව එකතු කර නිවසේ විවිධ තාප අවශ්‍යතාවයන් සඳහා භාවිත කිරීම වැදගත්ය.

පොල්කටු දහනයෙන් ලැබෙන දැලි සහ දුම අවම වන බැවින් මුළුතැන්ගෙය අපවිත්‍ර වීමද මෙමඟින් අවම වශයෙන් සිදුවේ.

වීමෝල් ආශ්‍රිතව එකතු වන දහයියා ද අනගි ජීව ඉන්ධනයකි. ගඩොල් කර්මාන්තය වැනි සාම්ප්‍රදායික කර්මාන්ත තුළත්, විදුලිය නිෂ්පාදනය වැනි නවීන භාවිත සඳහාත් දහයියා එක්රැස් වීම අවම වේ. විදුලි බලාගාර වලින් වී මෝල් හිමියන්ගෙන් දහයියා මිල දී ගැනේ. මෙරට සීනි කර්මාන්තය ආශ්‍රිතව ඉවතලන උක් රොඩු ද ජීව ඉන්ධනයක් ලෙස භාවිතයට ගත හැකිය. මේවා පැලවත්ත, සෙවණගල සහ හිඟුරාන වැනි ප්‍රදේශ වල පවතින සීනි කම්හල් ආශ්‍රිතව භාවිතවනු දක්නට ලැබේ. එසේම තේ කර්මාන්තයේ දී ත් පාම් තෙල් නිෂ්පාදනයේ දී ත් එම කර්මාන්ත වලින් එකතු වන අපද්‍රව්‍ය තාප ශක්තිය නිපදවීමට යොදා ගැනේ. කුරුඳු කර්මාන්තයේ දී එක්රැස් වන කුරුඳු දර, සංචාරක හෝටල් වල තාප අවශ්‍යතා සඳහා විශේෂයෙන් භාවිතයට ගැනේ.

විශ්ලේෂණ දත්ත වලට අනුව 1990 වසරට සාපේක්ෂව 2014 වනවිට මෙරට ජීව ඉන්ධන භාවිතය විශාල ලෙස වැඩි වී තිබෙනු දක්නට ලැබේ. 1990 දී කර්මාන්ත ආශ්‍රිතව නිවෙස් වල සහ වාණිජව ජීව ඉන්ධන මෙට්‍රික් ටොන් 9 643 500 ක් භාවිත වී ඇති අතර 2014 වනවිට එම භාවිතය මෙට්‍රික්ටොන් 12 699 47 ක් දක්වා ඉහළ ගොස් ඇත. ජීව ඉන්ධන කාර්යක්ෂමව යොදාගත හැකි උපකරණ කිහිපයක් පිළිබඳව සළකා බලමු.

1. **කර්මාන්තමය දර ලිප**

ඉවතලන හිස්තෙල් බැරලයක් භාවිත කරමින් සාපේක්ෂව අවම පිරිවැයකින් නිෂ්පාදනය කිරීමේ හැකියාව ඇත. මෙහි ඇති චිමිනි බටය නිසා දහනය කාර්යක්ෂමව සිදුවීමෙන් දුම අවම වේ. ඉහළ කාර්යක්ෂමතාවයකින් යුත් මේ උඳුන භාවිතයේ දී එය ක්‍රියා කරවන්නා අධික තාපයට සහ දුමට නිරාවරණය වීම ද වළකී. ඉන්ධන සඳහා සාමාන්‍ය දර, පොල්පිති, පොල්කටු ආදිය භාවිත කිරීමේ හැකියාව ඇත. කිතුල් වර්ග නිෂ්පාදනයටත්, හෝටල් සහ ආපනශාලා සඳහාත් ඉතා සුදුසු උඳුනකි.

2. **බේකරි උඳුන (ලී කුඩු/දහයියා භාවිතයෙන්)**

පාරම්පාරිකව භාවිත කෙරෙන දර වලින් උෂ්ණත්වය නිපදවාගන්නා බේකරි වෙනුවට කුඩු ලිප භාවිතයෙන් ක්‍රියා කරන මේ උඳුන ලාභදායී මෙන්ම ක්‍රියා කිරීමේ පහසුව අතින් ද ඉතා සාර්ථකයි. මෙහි ඉන්ධන වශයෙන් දහයියා හෝ ලී කුඩු හෝ භාවිත කෙරෙයි. දහයියා හෝ ලී කුඩු හෝ යොදා සකස් කරගත් කුඩු ලිප දැල්වීමෙන් පසු එහි තාපය, පරිවරණය කරන ලද නළ මාර්ගයෙන් තාප කුටීර තුළට සැපයීම සිදුවේ. පෝරණුවේ ධාරිතාව මත භාවිත කළයුතු කුඩු ලිප් ප්‍රමාණය වෙනස් වේ. එක් වරකට අච්චු පාන් 64ක් පිළිස්සිය හැකි පෝරණු සඳහා සාමාන්‍ය ප්‍රමාණයේ කුඩු ලිප් 02ක් හෝ 04ක් හෝ පමණ අවශ්‍ය වේ. මෙලෙස සකස් කළ ලී කුඩු ලිපක් එක් වරකට පැය 3 ක් පමණ කාලයක් තාපය සැපයීම සිදු කරයි. සුදුසු උෂ්ණත්වය කරා එළඹීමට ගතවන කාලය පාරම්පරික පෝරණුවට වඩා බෙහෙවින් අඩුය. අඩු මූලික ආයෝජනයකින් ලබාගත හැකි මේ පෝරණුව සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණය ද අඩුය. ක්‍රමවේදය වඩා පහසු සහ ආරක්ෂාකාරී වීමත් පාන් පිරිසිදුව පුළුස්සා ගතහැකි වීමත් මෙහි විශේෂත්වයයි. මෙයින් පාන් පිළිස්සීමට අමතරව කේක් සහ විවිධ කෙටි කෑම වර්ග ද කාර්යක්ෂමව සකසාගත හැකි වේ.

3. **ඉන්ධන බත් පිසිනය.**

සහල් පිසීම සඳහා ඕනෑම නිවසක යම් බලශක්තියක් වැය කරයි. විදුලි ඒකක 15ක් පමණ පරිභෝජනය කරයි. ඇතැම් විට බත් පිසීම සඳහා ගෑස් උඳුන වැනි උපකරණ අකාර්යක්ෂම ලෙස භාවිත

කරන අවස්ථා ද පවතී. මේ සඳහා යෝග්‍ය විසඳුමක් ලෙස ජීව ඉන්ධන බත් පිසිනය හඳුන්වා දී තිබේ. මේ සඳහා ඉන්ධනය ලෙස ජීව ස්කන්ධයක් වන පොල්කටු කැබලි කර යොදා ගනී. නිවසේ බත් පිසීමට යන වියදම අවම කර ගැනීමට මේ බත් පිසිනය මහත් රුකුලක් වනු ඇත. කාලය සැළකීමේ දී විදුලි බත් පිසිනයට වඩා විනාඩි 20 ක් සහ ජීව ඉන්ධන බත් පිසිනයට විනාඩි 40 – 45 ක් වැයවේ. අමතරව ඉන්ධන පරිභෝජනයකින් තොරය. පැය 7ක් පමණ පිසින ලද බතෙහි උණුසුම් බව රඳවා ගැනීමට මෙයට හැකිය. මෙමඟින් නිවසක එදිනෙදා භාවිතකර ඉවතලන පොල්කටු වලට වටිනාමක් එක් කරයි.

**4. ජීව ඉන්ධන බත් පිසිනය.**

ඉහත විස්තර කෙරුණු ජීව ඉන්ධන කාර්යක්ෂමව යොදාගත හැකි උඳුන් මෙරට ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERD Center) විසින් නිර්මාණය කර වැඩි දියුණු කර ඇත. ඒවා භාවිතය පිළිබඳව උපදෙස් සහ උපකරණ පහසු මිලට මිල දී ගැනීමට අවශ්‍ය නම් එම ආයතනයෙන් විමසිය හැකිය. නිකරුණේ අපතේ හරින හණසු, පොල්කටු, පොල්ලෙලි, දර ආදිය හැකි අයුරින් තම නිවසේ තාප අවශ්‍යතා සපුරා ගැනීම සඳහා භාවිතයට යොමුවන්න. මෙමඟින් පරිසර දූෂණය සහ බලශක්ති වියදම් අවම වී ඔබේ ආර්ථිකයටත්, රටේ අනාගතයටත් මහත් පිටුබලයක් ලැබේ.